# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2013

# ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

# අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2013

## ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

Curriculum
Assessment & Evaluation
Teaching Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

**දේශපාලන විද්‍යාව**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2013

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB) මගිනි.

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගයයි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුසුසන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන්ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස.(උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන්ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2013 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 209906ක් පාසල් අයදුම්කරුවෝ ද 31723ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද ඇඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව, I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ.

අ.පො.ස.(උ.පෙළ) දේශපාලන විද්‍යාව විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද දේශපාලන විද්‍යාව විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබාගෙන ඇති ආකාරය සවිස්තරාත්මකව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස.(උ.පෙළ) 2013 විභාගයේ දේශපාලන විද්‍යාව විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදාගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබාගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කරගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස කාරුණික ව ඉල්ලමි.

මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත්, උනන්දුවෙන් හා සක්‍රියව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයින්ටත්, වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට හා මෙම කාර්ය සඳහා මූල්‍ය අනුග්‍රහය දැක්වූ අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල් පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP-WB)ටත් මාගේ හෘදයාංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2015 ජනවාරි 19
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | ජේ.ඒ.ජේ.ආර් ජයකොඩි<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | ධම්ම දිසානායක<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය<br>කොළඹ විශ්ව විද්‍යාලය |
| **සැකසුම් කමිටුව** | : | බී.එම්. සුනිල් විමලසිරි<br>ගුරු සේවය (විශ්‍රාමික)<br>මහ/ ශ්‍රී භාරතීය විද්‍යායතන පිරිවෙන<br>පේරාදෙණිය<br><br>එම්.ඒ.ඩී.ජේ. විජේරත්න<br>ගුරු සේවය<br>මප/ගා/ශාන්ත අන්තෝනි මහා විද්‍යාලය<br>වාසල කෝට්ටේ<br><br>ජී.ඩී. නිරූපා මානෙල්<br>ගුරු සේවය<br>ර/ජේසු බිලිදාගේ කන්‍යාරාම ජාතික පාසල<br>රත්නපුරය |
| **පරිගණක පිටපත සැකසුම** | : | කේ. ඒ. අයි. බණ්ඩාර<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු<br><br>ඕ.එම්. දර්ශනී සෙව්වන්දි<br>දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | වයි. එස් අනුරාධි<br>සංවර්ධන නිලධාරී |

# ඇතුළත පිටු

පිටු අංකය

**I කොටස**

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 4

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 5

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 6

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 6

1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 8

2.1.2 I ප්‍රශ්න පත්‍රය 9

2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 15

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (විෂය ක්ෂේත්‍රය අනුව) 16

2.1.5. I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 19

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 20

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 22

2.2.2 II ප්‍රශ්න පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 23

2.2.3 II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 65

**III කොටස**

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 66

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 68

## I කොටස

## 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අභිමතාර්ථ

මෙම පාඨමාලාව අවසානයේදී ශිෂ්‍යයා,

1. තාර්කික දේශපාලන පුරවැසියෙකු බවට පත්වීමට ප්‍රමාණවත් දැනුම හා අවබෝධය ලබා ගනියි.
2. තමා ජීවත් වන දේශපාලන පරිසරය පිළිබඳ අවබෝධ කර ගැනීමට හා හඳුනා ගැනීමට හැකි වේ.
3. වගකීම් හා යුතුකම් අවබෝධ කරගත් හොඳ පුරවැසියකු බවට පත්වීමට අදාළ හැකියා හා කුසලතා වර්ධනය කර ගනියි.
4. සමාජ දේශපාලන විචාරශීලීත්වය වර්ධනය කර ගැනීමට අවශ්‍ය දැනුම ලබා ගනියි.
5. දේශපාලන පද්ධතියේ විවිධ වෘත්තීන් සඳහා අවශ්‍ය කුසලතා වර්ධනය කර ගනියි.
6. අන්තර් ජාතික සමාජය පිළිබඳ අවබෝධ කර ගැනීම හා ඒ පිළිබඳ දක්වන උනන්දුව වැඩි කර ගනියි.
7. රාජ්‍ය තාන්ත්‍රිකයන් වීමට අවශ්‍ය මූලික දැනුම දියුණු කර ගනියි.
8. දේශපාලන සාක්ෂරතාව ප්‍රගුණ කර ගනියි.

⋆ **I වන ප්‍රශ්න පත්‍රය**

දේශපාලන විද්‍යාව විෂය තුළ අන්තර්ගත වන න්‍යායන් සහ ඒවායේ ප්‍රායෝගික භාවිතය පිළිබඳ ව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වේ. මේ අනුව සමහර ප්‍රශ්න මඟින් න්‍යායාත්මක සංකල්ප පිළිබඳව සෘජුවම අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂාවට භාජනය කෙරෙන අතර තවත් සමහර ප්‍රශ්න මඟින් තෝරාගත් රටවල් කිහිපයක් ආශ්‍රයෙන් න්‍යාය හා භාවිතය අතර පවතින සම්බන්ධතාව පිළිබඳව අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ.

⋆ **II වන ප්‍රශ්න පත්‍රය**

මෙම ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වන්නේ ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවති යුගයේ බ්‍රිතාන්‍ය පාලකයින් විසින් ක්‍රියාවට නැංවූ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිසංස්කරණවල බලපෑම හා එහි ප්‍රතිඵල පිළිබඳවත්, නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආණ්ඩුක්‍රම වර්ධනය පිළිබඳවත් අපේක්ෂකයින්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂාවට ලක් කිරීමය. මෙයට අමතරව ශ්‍රී ලංකාව සහ අන්තර්ජාතික සමාජය අතර පවත්නා සම්බන්ධතාවන්හි ස්වරූපය පිළිබඳව ද අපේක්ෂකයින්ගේ දැනුම පරීක්ෂා කෙරේ.

## 1.2. විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 37713 | 5916 | 43629 |
| දෙමළ | 10131 | 2442 | 12573 |
| ඉංග්‍රීසි | 71 | 11 | 82 |
| එකතුව | **47915** | **8369** | **56284** |

වගුව 1

### 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අයදුම්කරුවන් | | පෞද්ගලික අයදුම්කරුවන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 3191 | 6.66 | 420 | 5.02 | 3611 | 6.41 |
| B | 5317 | 11.10 | 727 | 8.69 | 6044 | 10.74 |
| C | 10134 | 21.15 | 1319 | 15.76 | 11453 | 20.35 |
| S | 16711 | 34.87 | 2644 | 31.59 | 19355 | 34.39 |
| F | 12562 | 26.22 | 3259 | 38.94 | 15821 | 28.11 |
| එකතුව | **47915** | **100.00** | **8369** | **100.00** | **56284** | **100.00** |

වගුව 2

1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 1954 | 132 | 6.76 | 181 | 9.26 | 305 | 15.61 | 715 | 36.59 | 1333 | 68.22 | 621 | 31.78 |
| 2. ගම්පහ | 2166 | 154 | 7.11 | 212 | 9.79 | 355 | 16.39 | 729 | 33.66 | 1450 | 66.94 | 716 | 33.06 |
| 3. කළුතර | 1650 | 156 | 9.45 | 170 | 10.30 | 252 | 15.27 | 507 | 30.73 | 1085 | 65.76 | 565 | 34.24 |
| 4. මහනුවර | 2497 | 95 | 3.80 | 164 | 6.57 | 446 | 17.86 | 987 | 39.53 | 1692 | 67.76 | 805 | 32.24 |
| 5. මාතලේ | 910 | 22 | 2.42 | 55 | 6.04 | 134 | 14.73 | 376 | 41.32 | 587 | 64.51 | 323 | 35.49 |
| 6. නුවරඑළිය | 1777 | 48 | 2.70 | 151 | 8.50 | 444 | 24.99 | 706 | 39.73 | 1349 | 75.91 | 428 | 24.09 |
| 7. ගාල්ල | 2660 | 225 | 8.46 | 306 | 11.50 | 438 | 16.47 | 900 | 33.83 | 1869 | 70.26 | 791 | 29.74 |
| 8. මාතර | 1579 | 96 | 6.08 | 131 | 8.30 | 260 | 16.47 | 521 | 33.00 | 1008 | 63.84 | 571 | 36.16 |
| 9. හම්බන්තොට | 1195 | 75 | 6.28 | 115 | 9.62 | 228 | 19.08 | 460 | 38.49 | 878 | 73.47 | 317 | 26.53 |
| 10. යාපනය | 925 | 22 | 2.38 | 69 | 7.46 | 217 | 23.46 | 390 | 42.16 | 698 | 75.46 | 227 | 24.54 |
| 11. කිලිනොච්චි | 22 | 1 | 4.55 | 2 | 9.09 | 6 | 27.27 | 11 | 50.00 | 20 | 90.91 | 2 | 9.09 |
| 12. මන්නාරම | 164 | 2 | 1.22 | 9 | 5.49 | 43 | 26.22 | 75 | 45.73 | 129 | 78.66 | 35 | 21.34 |
| 13. වව්නියාව | 219 | 5 | 2.28 | 13 | 5.94 | 46 | 21.00 | 95 | 43.38 | 159 | 72.60 | 60 | 27.40 |
| 14. මුලතිව් | 1 | 0 | 0.00 | 0 | 0.00 | 0 | 0.00 | 1 | 100.00 | 1 | 100.00 | 0 | 0.00 |
| 15. මඩකලපුව | 1258 | 49 | 3.90 | 101 | 8.03 | 241 | 19.16 | 508 | 40.38 | 899 | 71.46 | 359 | 28.54 |
| 16. අම්පාර | 1646 | 62 | 3.77 | 167 | 10.15 | 388 | 23.57 | 646 | 39.25 | 1263 | 76.73 | 383 | 23.27 |
| 17. ත්‍රිකුණාමලය | 557 | 36 | 6.46 | 83 | 14.90 | 128 | 22.98 | 197 | 35.37 | 444 | 79.71 | 113 | 20.29 |
| 18. කුරුණෑගල | 3249 | 156 | 4.80 | 255 | 7.85 | 543 | 16.71 | 1100 | 33.86 | 2054 | 63.22 | 1195 | 36.78 |
| 19. පුත්තලම | 1635 | 74 | 4.53 | 146 | 8.93 | 350 | 21.41 | 533 | 32.60 | 1103 | 67.46 | 532 | 32.54 |
| 20. අනුරාධපුරය | 2046 | 129 | 6.30 | 184 | 8.99 | 383 | 18.72 | 710 | 34.70 | 1406 | 68.72 | 640 | 31.28 |
| 21. පොළොන්නරුව | 712 | 22 | 3.09 | 50 | 7.02 | 106 | 14.89 | 232 | 32.58 | 410 | 57.58 | 302 | 42.42 |
| 22. බදුල්ල | 2092 | 89 | 4.25 | 165 | 7.89 | 450 | 21.51 | 799 | 38.19 | 1503 | 71.85 | 589 | 28.15 |
| 23. මොනරාගල | 896 | 36 | 4.02 | 76 | 8.48 | 160 | 17.86 | 327 | 36.50 | 599 | 66.85 | 297 | 33.15 |
| 24. රත්නපුරය | 2294 | 147 | 6.41 | 202 | 8.81 | 460 | 20.05 | 812 | 35.40 | 1621 | 70.66 | 673 | 29.34 |
| 25. කෑගල්ල | 1233 | 70 | 5.68 | 104 | 8.43 | 260 | 21.09 | 425 | 34.47 | 859 | 69.67 | 374 | 30.33 |
| **සමස්ත දිවයින** | **35337** | **1903** | **5.39** | **3111** | **8.80** | **6643** | **18.80** | **12762** | **36.12** | **24419** | **69.10** | **10918** | **30.90** |

වගුව 3

1.2.4 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91 - 100 | 3 | 0.01 | 56284 | 100 |
| 81 - 90 | 565 | 1.00 | 56281 | 99.99 |
| 71 - 80 | 3714 | 6.60 | 55716 | 98.99 |
| 61 - 70 | 6704 | 11.91 | 52002 | 92.39 |
| 51 - 60 | 8668 | 15.40 | 45298 | 80.48 |
| 41 - 50 | 10378 | 18.44 | 36630 | 65.08 |
| 31 - 40 | 11486 | 20.41 | 26252 | 46.64 |
| 21 - 30 | 10707 | 19.02 | 14766 | 26.23 |
| 11 - 20 | 3979 | 7.07 | 4059 | 7.21 |
| 01 - 10 | 77 | 0.14 | 80 | 0.14 |
| 00 - 00 | 3 | 0.01 | 3 | 0.01 |

වගුව 4

ඉහත වගුවෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- (31 - 40 පංති ප්‍රාන්තරය ගතහොත්)
මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 11486 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 20.41% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 26252 ක් වන අතර,එය ප්‍රතිශතයක් වශයෙන් 46.64% කි.

## 1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

### 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 19 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 89%කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ 14 වන ප්‍රශ්නයට ය. එහි ප්‍රතිශතය 16%කි.

### 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය




ප්‍රස්තාරය 2 (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි A කොටසේ ප්‍රශ්න 20ක් ඇති අතර සියල්ලටම කෙටි පිළිතුරු සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට එක් ලකුණ බැගින් ලකුණු 20ක් හිමි වේ. නමුත් මෙම කොටස සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ දරා ඇත්තේ 98% ක් පමණි.

### 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය




මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි B කොටසේ 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20 කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 8%කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 05 තෙක් ලබා ගත් ප්‍රතිශතය 32% කි.

ප්‍රස්තාරය **3** (RD/16/02/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

### 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 4.1 (RD/16/04/AL) පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)
ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා:- A කොටසේ 1 ප්‍රශ්නයෙහි පහසුතාව 79% වේ. B කොටසේ 4 ප්‍රශ්නයේ (ii) කොටසේ පහසුතාව 11% වේ.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

- ⋆ කාලය පැය 02කි.
- ⋆ වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 50කි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.
- ⋆ එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100කි.

## 2.1.2. I ප්‍රශ්න පත්‍රය

- අංක **1** සිට **15** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් ප්‍රශ්නයේ මාතෘකාවට අදළ නිවැරදි ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

1. දේශපාලන විද්‍යාව :
   A - රාජ්‍ය සහ ආණ්ඩුව පිළිබඳ විද්‍යාව ලෙස හැඳින්වේ.
   B - න්‍යායාත්මක දේශපාලනය හා ප්‍රායෝගික දේශපාලනය යන කොටස් දෙකෙන් සමන්විත වේ.
   C - සමාජීය විද්‍යා පවුලට අයත් විෂයයක් වේ.
   D - අතිශයින්ම පෞරාණික අධ්‍යයන විෂයයක් වන අතර ක්‍රමානුකූලව අධ්‍යයනය කිරීම ආරම්භ වූයේ ක්‍රි.පූ. 4 වන සියවසේ දී ය.
   E - විද්‍යාත්මක ක්‍රම මගින් පමණක් අධ්‍යයනය කළ හැකි විෂයයක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

2. දේශපාලනය:
   A - දේශපාලන විද්‍යාවේ ප්‍රයෝගික පැත්ත වේ.
   B - බල අරගලය ක්‍රියාවට නංවන මාර්ගය වේ.
   C - සමාජ ප්‍රභූන් විසින් කරනු ලබන ක්‍රීඩාවක් වේ.
   D - අගය කිරීම් අධිකාරී බලය යොදගෙන බෙදා හරින මාර්ගය වේ.
   E - කවුරුන් කුමක්, කෙලෙස, කුමන අවස්ථාවකදී ලබා ගන්නවාද යන්න තීරණය වීමේ ක්‍රියාදමය වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

3. චර්යාවාදය:
   A - දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම සම්බන්ධයෙන් 1940 ගණන්වලදී ඇමෙරිකාව තුළ ආරම්භ වූ අධ්‍යයන ව්‍යාපාරයක් වේ.
   B - දේශපාලන රඟුම්කරුවන්ගේ නිරීක්ෂණය කළ හැකි චර්යාව පමණක් අධ්‍යයනය කළ යුතු බව අවධාරණය කරනු ලැබී ය.
   C - මිනිසුන්ගේ සාර්ව දේශපාලන චර්යාව අධ්‍යයනය කිරීම වර්ධනය කරනු ලැබී ය.
   D - න්‍යාය ගොඩනැගීමට සහ අධ්‍යයන විධික්‍රම වර්ධනය කිරීමට බෙහෙවින් දයක විය.
   E - ශිල්පීය උපක්‍රමවලට වඩා ප්‍රතිඵල පිළිබඳව වඩාත් සැලකිලිමත් විය.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

4. රාජ්‍යය:
   A - නිශ්චිත දේශසීමාවන්ගෙන් වට වූ භූමියක් තුළ ජීවත් වන ජනතාව විසින් පිහිටුවා ගත් දේශපාලන සමාජය වේ.
   B - ග්‍රීක යුගයේ දී නාගරික රාජ්‍ය ලෙස ප්‍රථමයෙන් ආරම්භ විය.
   C - පොදු ආශාවන් වෙනුවෙන් ක්‍රියාත්මක වීම යන නාමය සහිත විශේෂිත දේශපාලන ආයතන පද්ධතියකින් සමන්විත වේ.
   D - නීති පැනවීමට සහ නීති කඩකරන අයට දඬුවම් කළ හැකි සුජාතභාවය සහිත අධිකාරී බලයෙන් යුක්ත වූවක් වේ.
   E - ලිබරල්වාදීන් විසින් පොදු සමාජ සංවිධානයක් ලෙස ද සමාජවාදීන් විසින් පංති ආයුධයක් ලෙස ද විග්‍රහ කර ඇත.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

5. ස්වාධිපතිත්වය:
   A - රාජ්‍යයන් පමණක් භුක්ති විඳින උසස්ම හා උත්තරීතර බලය වේ.
   B - අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වන බව විග්‍රහ කර ඇත.
   C - රාජ්‍යයේ වැදගත්ම සහ විශේෂිතම අංග ලක්ෂණය වේ.
   D - රාජ්‍යයේ ආත්මය වන අතර බලාධිකාරී බලය යෙදවීම සඳහා රාජ්‍යයට සුජාතභාවය සැපයෙන සාධකය වේ.
   E - ප්‍රබල රාජ්‍යයන් දුබල රාජ්‍යයන්ගෙන් වෙන් කර හඳුනා ගැනීම සඳහා යොද ගැනෙන නිර්ණායක අතුරින් එකක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

6. ආණ්ඩුව:
   A - දේශපාලන සමාජයේ පොදු කැමැත්ත නියෝජනය කරන රාජ්‍යයේ නියෝජිතයා වේ.
   B - තම කැමැත්ත ක්‍රියාවට නැංවීම සඳහා රාජ්‍යය විසින් භාවිතයට ගැනෙන උපකරණය වේ.
   C - ප්‍රජාතන්ත්‍රවාදී හෝ ප්‍රජාතන්ත්‍ර විරෝධී හෝ විය හැකි ය.
   D - එක් අයකුගෙන්, කිහිප දෙනකුගෙන් හෝ බොහෝ දෙනකුගෙන් සමන්විත විය හැකි ය.
   E - ප්‍රජාතන්ත්‍රවාදී හෝ ප්‍රජාතන්ත්‍රවාදී නොවන අයුරින් වෙනස් කිරීමට යටත් වූවක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

7. සන්ධීය ආණ්ඩුක්‍රමය:
   A - විවිධ මට්ටම් සහිත ආණ්ඩු අතර සිරස් ආකාරයට බලය හුවමාරු කර ගැනීමේ පදනම මත ගොඩනැගී ඇත.
   B - බලතල බෙදීමේ තවත් ක්‍රමයක් ලෙස සලකනු ලැබේ.
   C - විවිධ වාර්ගික ජන කොටස් එක් දේශපාලන ක්‍රමයකට අනුගත කරවීම සඳහා ප්‍රයෝජනවත් වේ.
   D - විවිධත්වය සමග ඒකීයත්වය බද්ධ කරන ක්‍රමයක් ලෙස විග්‍රහ කර ඇත.
   E - සජාතීය සමාජ ක්‍රම සහිත රටවල් සඳහා වඩාත් යෝග්‍ය වන බව පිළිගනු ලැබේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

8. ඒකීය ආණ්ඩුක්‍රමය:
   A - එක් බල මධ්‍යස්ථානයක් පදනම් කොට ගෙන ගොඩනැගී ඇත.
   B - ජාතික දේශපාලනය පදනම් කරගෙන ජාතික ඒකාග්‍රතාව වර්ධනය කිරීමට ඉවහල් වේ.
   C - ඒකීය අධිකරණ ක්‍රමයක් හා පරිපාලන ක්‍රමයක් පවත්වා ගෙන යාමට ප්‍රයෝජනවත් වේ.
   D - ප්‍රාදේශිය සම්පත් ජාතික ප්‍රතිපත්ති හරහා සමාන අයුරින් ප්‍රයෝජනයට ගැනීමට උපකාරී වේ.
   E - බහුවිධ සමාජ ක්‍රම සහිත විශාල රාජ්‍යයන්ට වඩාත් සුදුසු වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

9. කැබිනට් ආණ්ඩුක්‍රමය:
   A - නාමික හා සත්‍ය වශයෙන් හැඳින්වෙන ද්විත්ව විධායකයකින් යුක්ත වේ.
   B - වැඩි කාර්යක්ෂමතාවයකින් සහ අඩු ප්‍රජාතන්ත්‍රවාදී භාවයකින් යුක්ත වේ.
   C - නාමික විධායකය නායකත්වය දරන අතර එමගින් සත්‍ය විධායකය පත් කරනු ලැබේ.
   D - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට බැඳී සිටින නිසා වගකීම් සහිත ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.
   E - රාජ්‍යයේ නායකයා සහ ආණ්ඩුවේ නායකයා එකිනෙකින් වෙන් කරන ලද ආණ්ඩුක්‍රමයක් වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

10. ජනාධිපති ආණ්ඩුක්‍රමය:
   A - ජනාධිපති නමින් හඳුන්වන ඒකීය විධායකයක් විසින් නායකත්වය දරනු ලැබේ.
   B - සෘජුව තෝරාපත් කරන විධායකයකින් හා ව්‍යවස්ථාදායකයකින් සමන්විත වේ.
   C - විධායකය හා ව්‍යවස්ථාදායකය අතර පවතින දුරස්තර සම්බන්ධතාව විශේෂ ලක්ෂණය වේ.
   D - ප්‍රජාතන්ත්‍රවාදීභාවයෙන් අඩු සහ කාර්යක්ෂමතාවයෙන් වැඩි වේ.
   E - දේශපාලන හා ආර්ථික වශයෙන් පසුගාමී රටවල්වලට වඩාත් සුදුසු වේ.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

11. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ කිහිපයක් වන්නේ:
   A - රාජ්‍යය විසින් පාලනය කරන ආර්ථිකය
   B - අධිකරණයේ ස්වාධීනත්වය සහිත නීතියේ ආධිපත්‍යය පදනම් කරගත් ව්‍යවස්ථානුකූල ආණ්ඩුව
   C - සහතික කරන ලද සිවිල් නිදහස, පුද්ගල අයිතිවාසිකම් සහ ජනමාධ්‍ය නිදහස
   D - දේශපාලන බහුවිධතාව පිළිගත් සහ සර්වජන ඡන්ද බලය පදනම් කරගෙන කාලීනව පවත්වන මැතිවරණ
   E - සංවිධානය වූ කණ්ඩායම් ක්‍රියාකාරිත්වයට හා විවිධ ආශාවන්ට නිදහස සහිත ශක්තිමත් සිවිල් සමාජය
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

12. ඒකතන්ත්‍ර පාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
   A - තනි පුද්ගලයකු අත ඒකරාශි කරන ලද අසහාය බලය
   B - පාලකයා නීතියට ඉහළින්ම සිටීම හා ව්‍යවස්ථානුකූල සීමාවන්ගෙන් තොරවීම
   C - එක් පක්ෂයක අසහාය නායකත්වය සහිත තරහකාරී පක්ෂ ක්‍රමය
   D - හිතුවක්කාරී ලෙස සංවරණයකින් තොරව රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම
   E - සමාජීය හා පෞද්ගලික පැවැත්මේ සෑම පැතිකඩක්ම වසා පැතිරුණු දේශපාලන වශයෙන් කෙරෙන පාලනය කිරීම
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

13. ධනවාදය පදනම් කරගත් ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
   A - වෙළෙඳපොළ බලවේග අනුව භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම
   B - නිෂ්පාදන ප්‍රාග්ධනයේ පෞද්ගලික හිමිකම
   C - උපයෝගිතා වටිනාකම අනුව නොව වෙළෙඳපොළ වටිනාකම අනුව භාණ්ඩ හා සේවාවන්හි මිල නියම වීම
   D - වෙළෙඳපොළ බලවේග පාලනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍යය පූර්ණ ලෙස මැදිහත් නොවීම
   E - ද්‍රව්‍යාත්මක ආශාවන් හා ලාභය උපරිම කිරීම යන බලවේග මගින් මෙහෙයවන ක්‍රමයක් වීම
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

14. සමාජවාදී දේශපාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ වන්නේ:
   A - ධනයේ සාමූහික හිමිකම
   B - නිර්ධන පංතියේ ආඥාදායකත්වය
   C - පංති විරහිත සමාජක්‍රමය
   D - මානව තෘප්තිය සහ පරිභෝජනය සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම
   E - ඒකපක්ෂ නායකත්වය සහිත ආණ්ඩුව
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

15. නීතිය:
   A - අණදීම්, තහනම් කිරීම් සහ හිමිකම් දක්වෙන විධිවිධාන පද්ධතියක් වේ.
   B - ආණ්ඩුව විසින් සාදනු ලබන සමස්ත සමාජය පුරා ක්‍රියාත්මක වන්නක් වේ.
   C - රාජ්‍යයේ කැමැත්ත ප්‍රකාශ කරන මාධ්‍යය වේ.
   D - අවනතභාවය ලබා ගන්නේ පොලිස් පහරදීම්වලට මිනිසුන් තුළ ඇති බිය හරහා ය.
   E - පිළිපැදීම අනිවාර්ය වන අතර යටත්වීම තේරීමකට ලක්කිරීමට පුරවැසියන්ට හිමිකම නැත.
   (1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **16** සිට **25** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් මාතෘකාවට **අදාළ නොවන** ප්‍රකාශය තෝරන්න.

16. මානව අයිතිවාසිකම්:
   (1) මිනිසෙක් වීම නිසාම මිනිසාට හිමිවන්නාවූ අයිතිවාසිකම් වේ.
   (2) සෑම මිනිසකුටම හිමිවන බැවින් විශ්වීය ස්වරූපයක් ගනී.
   (3) අහිමි කිරීමට, පවරාදීමට හා ආපසු ගැනීමට නොහැකි බැවින් මූලික අයිතිවාසිකම් බවට පත් වේ.
   (4) මානවයන්ගේ ආත්ම ගරුත්වයට සහ පැවැත්මට අවශ්‍ය වේ.
   (5) නීතියෙන් හිමිකම් කිවහැකි අයිතිවාසිකම් පමණක් වේ.

17. දේපල:
(1) 'ස්වයං හිමිකම' පදනම් කර ගත් අයිතියක් වේ.
(2) ආර්ථික අභිවෘද්ධිය හා කාර්යක්ෂමතාව ඇති කිරීම පිණිස ශ්‍රමය දිරි ගන්වන උත්තේජකයක් ලෙස සැලකේ.
(3) පුද්ගල නිදහස, ස්වාධීනත්වය හා ස්වපැවැත්ම ශක්තිමත් කරන වැදගත් සාධකයක් ලෙස සැලකේ.
(4) සමාජ අගයකිරීම් වර්ධනය කිරීම සඳහා දායක වන්නා වූ වැදගත් මූලාශ්‍රයක් වේ.
(5) පුද්ගලයින්ගේ සමාජ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යම සාධකයක් ලෙස සමාජවාදීන් විසින් ද පිළිගෙන තිබේ.

18. දේශපාලන නියෝජනය:
(1) පුද්ගලයකු හෝ කණ්ඩායමක් විසින් පුළුල් ජන සමූහයක් වෙනුවෙන් පෙනී සිටින හෝ ක්‍රියා කරන ආකාරය පෙන්නුම් කරන සම්බන්ධතා විධික්‍රමය වේ.
(2) නියෝජන ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නංවන පදනම් මූලධර්මය වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය තුළ ආණ්ඩුව හා ජනතාව යා කරන මාධ්‍යය වේ.
(4) 'තනි ඡන්දය-අසමාන අගය කිරීම්' යන පදනම යටතේ ක්‍රියාත්මක වේ.
(5) නූතන තත්ත්වයන් යටතේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි එකම ක්‍රමය ලෙස සැලකේ.

19. පුරවැසියා:
(1) රාජ්‍යයේ පිළිගැනීම සහිත දේශපාලන සමාජයක සාමාජිකයකු ලෙස අර්ථකථනය කර ඇත.
(2) රාජ්‍යය මගින් ප්‍රදානය කරන විශේෂිත අයිතිවාසිකම් හා බැඳීම් සමූහයක් සහිත අයකු වේ.
(3) විදේශිකයින් යන යෙදුම සමග සමපාත වේ.
(4) උපතින් හෝ ලියාපදිංචි වීමෙන් හිමි වේ.
(5) ඡන්ද බලය දීමට සහ සමහර රාජ්‍ය තනතුරු පිරිනැමීමට යොදා ගැනෙන එකම නිර්ණායකය වේ.

20. සිවිල් සමාජය:
(1) රාජ්‍යයේ පාලනයෙන් මුළුමනින්ම වියුක්ත වූ සමාජය වේ.
(2) රාජ්‍යය සහ පවුල යන සංවිධානවලට පරිබාහිර වශයෙන් ගොඩනගා ඇති මධ්‍යස්ථ සංවිධානවලින් සමන්විත සමාජය වේ.
(3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය හොඳින් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍යම සාධකයක් ලෙස සැලකේ.
(4) ආණ්ඩුවේ බලය පාලනය කිරීම සඳහා යෙදවිය හැකි වැදගත් සංරෝධකයක් ලෙස සැලකේ.
(5) ජනතාව දේශපාලන හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම සඳහා යොදගත හැකි උපකරණයක් ලෙස සැලකේ.

21. ඇමෙරිකා එක්සත් ජනපදයේ දේශපාලන ක්‍රමය:
(1) 1789 දී ස්ථාපිත කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මත පදනම් වී ඇත.
(2) ප්‍රාන්ත රාජ්‍ය පනහකින් සමන්විත සන්ධීය රාජ්‍යයක් වේ.
(3) ජනතාව විසින් සෘජුව තෝරාපත් කරන ජනාධිපතිවරයකු නායකත්වය දරනු ලැබේ.
(4) සම්භාව්‍ය සන්ධීය මූලධර්ම මත ගොඩනැගුණු සන්ධීය ක්‍රමයක් වේ.
(5) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යයන් අතර බල හවුල්කාරිත්වය පදනම් කරගෙන ගොඩනැගුණු එකක් වේ.

22. මහා බ්‍රිතාන්‍යයේ පාර්ලිමේන්තුව:
(1) නීති සම්පාදනය සම්බන්ධයෙන් ස්වාධිපති බලය දරන අතර එම හේතුවෙන් ඕනෑම නීතියක් සෑදීමට හෝ අවලංගු කිරීමට බලය තිබේ.
(2) ද්වි මාණ්ඩලික වන අතර එයින් බලවත්ම ආයතනය මහජන මන්ත්‍රී මණ්ඩලය වේ.
(3) විශ්වාස භංග යෝජනාවක් මගින් දේශපාලන විධායකය ඉවත් කිරීමේ හැකියාව භුක්ති විඳිනු ලැබේ.
(4) දේශපාලන විධායකය තෝරාපත් කරන මූලාශ්‍රය වේ.
(5) නාමික විධායකය විසින් ස්වකීය අභිමතානුසාරී බලය යොදවා විසුරුවා හැරීමට යටත් වේ.

23. 1958 ඩිගෝල් ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව:
(1) ඩිගෝල් ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ඉතාමත්ම වැදගත් නවාංගය ලෙස සැලකේ.
(2) සමන්විත වන්නේ නිල බලයෙන් පවත්වන හා නාමකරණයෙන් පත් කරන යන සමාජික වර්ග දෙකෙනි.
(3) විධායක-ව්‍යවස්ථාදායක සම්බන්ධතා හා ආරක්ෂා කිරීමේ භාරකරුවා වේ.
(4) ජනාධිපතිවරණ හා ජනමතවිචාරණ අධීක්ෂණය කරන්නා වේ.
(5) ජනාධිපතිවරයාට එරෙහිව ගෙනෙන දෝෂාභියෝග විනිශ්චය කරන්නා වේ.

24. ඉන්දියාවේ ශ්‍රේෂ්ඨාධිකරණය:
(1) 1950 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇත.
(2) අග්‍ර විනිශ්චයකරු හා තවත් විනිශ්චයකරුවන් 25කින් සමන්විත වේ.
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ආරක්ෂකයා සහ මූලික අයිතිවාසිකම්වල භාරකරුවා ලෙස ක්‍රියා කිරීමේ බලය භුක්ති විඳී.
(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමේ බලයෙන් තොර වේ.
(5) සතුවන බලතල හා කාර්යයන් අනුව ඇමෙරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයට බෙහෙවින් සමාන වේ.

25. ස්විට්සර්ලන්තයේ ෆෙඩරල් ව්‍යවස්ථාදායකය:
(1) ඒක මණ්ඩල වේ.
(2) ජනතා බලයට යටත්ව රාජ්‍ය බලය ක්‍රියාවට නංවන උත්තරීතර උපකරණය වේ.
(3) සෑම ආකාරයකම ෆෙඩරල් නීති පැනවීමේ බලය භුක්ති විඳී.
(4) ෆෙඩරල් විධායකය, ෆෙඩරල් විනිශ්චයකරුවන්, වෙනත් උසස් රාජ්‍ය නිලධාරීන් සහ හමුදපති පත්කිරීමේ බලය භුක්ති විඳී.
(5) සෑම ෆෙඩරල් බලධාරී ආයතනයක්ම අධීක්ෂණය කිරීමේ බලය දරන්නා ද වේ.

● අංක **26** සිට **32** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහෙන් මාතෘකාවට අදළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

26. 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින්:
A - සීමිත ඡන්ද බලය ප්‍රදානය කිරීමට යෝජනා කරන ලදී.
B - ආණ්ඩුකාරයාගේ තනි මතය අනුව පාලනය කිරීමේ බලය දුර්වල කරන ලදී.
C - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණයේ ආරම්භක පදනම දමන ලදී.
D - ආණ්ඩුකාරයාට සහාය වීම පිණිස විධායක සහ ව්‍යවස්ථාදායක සභා පිහිටුවන ලදී.
E - ආණ්ඩුක්‍රමය එක්සේසත් කරන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

27. 1833 කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මගින්:
A - ධනවාදී ආර්ථිකයේ වර්ධනය සඳහා පදනම දමන ලදී.
B - එක්සත් රාජ්‍යයක් නිර්මාණය කිරීම සඳහා පදනම දමන ලදී.
C - ස්වාධීන අධිකරණ හා පරිපාලන ක්‍රමයන්හි වර්ධනය සඳහා පදනම දමන ලදී.
D - නිදහස් ශ්‍රම වෙළෙඳපොළක් වර්ධනය කිරීම සඳහා දයකත්වය සැපයුණි.
E - උඩරට ප්‍රදේශයේ මිෂනාරි වැඩකටයුතු තහනම් කරන ලදී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

28. බ්‍රිතාන්‍ය පාලනය යටතේ ලංකාව තුළ වාණිජ වතු වගාව වර්ධනය වීම කෙරෙහි දයකවූ සාධක වන්නේ:
A - යටත්විජිත ආණ්ඩුව විසින් ප්‍රචාරය කළ ලෞකිකවාදී අදහස්
B - විදේශ බැංකු විසින් සැපයූ ආයෝජන ප්‍රාග්ධනය
C - ඉන්දියානු ශ්‍රමිකයින්ගේ ලාභ ශ්‍රමය
D - උඩරට ජනතාවගෙන් අත්කර ගත් ඉඩම්
E - බ්‍රිතාන්‍ය වතු වගාකරුවන් සැපයූ ව්‍යවසාය නායකත්වය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

29. 1911 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගින්:
A - ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 21 දක්වා වැඩි කළේ ය.
B - ප්‍රථම වරට නියෝජන මූලධර්මය හඳුන්වා දුන්නේ ය.
C - ආණ්ඩුකරුගේ බලතල පුළුල් ලෙස කප්පාදු කළේ ය.
D - වාර්ගික නියෝජනය එසේම පවත්වා ගෙන ගියේ ය.
E - ඡන්දයෙන් එක් නියෝජිතයකු තෝරාපත් කිරීමට ස්වදේශිකයන්ට බලය දුන්නේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

30. 1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ මූලික ලක්ෂණ වන්නේ:
A - වාර්ගික නියෝජනය සීමා කිරීම
B - ව්‍යවස්ථාදායක සභාවේ සාමාජික සංඛ්‍යාව 49 දක්වා වැඩි කිරීම
C - ව්‍යවස්ථාදායක සභාව තුළ ප්‍රථම වරට ඡන්දයෙන් පත් වූ මන්ත්‍රීවරුන් බහුතරය බවට පත් කිරීම
D - මුදල් කාරක සභාවේ බලතල හා කාර්යයන් ශක්තිමත් කිරීම
E - බලය සහ වගකීම වෙන් කරන ලද ආණ්ඩුක්‍රමයක් ගොඩනැගීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

31. ලංකාවේ ජාතික ව්‍යාපාරය:
A - ආසියාව තුළ තිබූ වඩාත්ම සාමකාමී ජාතික විමුක්ති ව්‍යාපාරය විය.
B - බටහිරකරණය වූ සමාජ ප්‍රභූන් විසින් ආරම්භ කළ සහ මෙහෙය වූ ව්‍යාපාරයක් විය.
C - ප්‍රධාන වශයෙන් ඉල්ලා සිටියේ අභ්‍යන්තර ස්වයං පාලන ක්‍රමයක් ය.
D - ජනතාවාදී ව්‍යාපාරයක් නොවීය.
E - ඉන්දියානු ජාතික ව්‍යාපාරයට බෙහෙවින් සමාන විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

32. 1930 ගණන්වලදී ලංකාව තුළ වාමාංශික ව්‍යාපාරය ආරම්භවීම කෙරෙහි බලපෑ හේතු සාධක වන්නේ:
A - 1930 ගණන්වලදී ලංකාව මුහුණ දුන් ආර්ථික අර්බුදය
B - 1930 ගණන්වල ආරම්භ වූ ආගමික පුනරුද ව්‍යාපාරය හා අමද්‍යප ව්‍යාපාරය
C - 1930 ගණන්වලදී පැන නැගුණ සංවිධානාත්මක රැඩිකල් කම්කරු ව්‍යාපාරය
D - නිදහස දිනා ගැනීම සඳහා ලංකා ජාතික සංගමය අනුගමනය කළ දියාරු සහ පෞරාණිකවාදී ක්‍රියා පිළිවෙත
E - මාක්ස්වාදයට නැඹුරු වූ බටහිර අධ්‍යාපනය ලැබූ රැඩිකල් තරුණ කණ්ඩායමක් බිහිවීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

● අංක **33** සිට **36** දක්වා ඇති ප්‍රශ්න සඳහා සපයා ඇති ප්‍රකාශ පහ අතුරින් මාතෘකාවට **අදළ නොවන** ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

33. 1931 දී ක්‍රියාවට නැංවූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වන්නේ:
A - කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණය ලෙස ය.
B - මැනිං ප්‍රතිසංස්කරණය ලෙස ය.
C - මැනිං-ඩෙවන්ෂයර් ප්‍රතිසංස්කරණය ලෙස ය.
D - ඩොනමෝර් ප්‍රතිසංස්කරණය ලෙස ය.
E - සෝල්බරි ප්‍රතිසංස්කරණය ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

34. 1931 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායකය හඳුන්වන්නේ:
A - පාර්ලිමේන්තුව ලෙස ය.
B - කොන්ග්‍රසය ලෙස ය.
C - අධිරාජ්‍ය සභාව ලෙස ය.
D - ජාතික සභාව ලෙස ය.
E - රාජ්‍ය මන්ත්‍රණ සභාව ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

35. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හා සම්බන්ධව 'මුර බල්ලන්' යන පදය යෙදුවේ:
A - ආණ්ඩුකාරයා සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැඳින්වීම සඳහා ය.
B - රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැඳින්වීම සඳහා ය.
C - ආණ්ඩුකාරයා, යටත්විජිත ලේකම් සහ රාජ්‍ය නිලධාරීන් තිදෙනා හැඳින්වීම සඳහා ය.
D - අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයින් හැඳින්වීම සඳහා ය.
E - අමාත්‍ය මණ්ඩලයේ ස්වදේශික සාමාජිකයින් හැඳින්වීම සඳහා ය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

36. ඩොනමෝර් ව්‍යවස්ථාවට අනුව අමාත්‍ය මණ්ඩලය රාජ්‍ය මන්ත්‍රණ සභාවට සාමූහිකව වගකිව යුතු වූයේ:
A - යුද්ධ කටයුතු සඳහා කෙරෙන වියදම් වෙනුවෙන් පමණි.
B - වාර්ෂික අයවැය ලේඛනය වෙනුවෙන් පමණි.
C - අමාත්‍ය මණ්ඩලය ගන්නා සියලුම විධායක තීරණ වෙනුවෙනි.
D - ආණ්ඩුකාරයා හා රාජ්‍ය නිලධාරීන් තිදෙනා හා සම්බන්ධ වියදම් වෙනුවෙන් පමණි.
E - අමාත්‍ය මණ්ඩලය නඩත්තු කිරීම සඳහා වැය වන වියදම් වෙනුවෙන් පමණි.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

- අංක **37** සිට **50** දක්වා ඇති ප්‍රශ්න සඳහා දක්වා තිබෙන ප්‍රකාශ පහ අතුරින් ඒ ඒ මාතෘකාවට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

37. 1948 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය:
A - බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය තුළ ලංකාවට ඩොමීනියන් තත්ත්වය ප්‍රදානය කළේ ය.
B - බ්‍රිතාන්‍ය කිරීටය ලංකාවේ රාජ්‍ය නායකයා බවට පත් කළේ ය.
C - බ්‍රිතාන්‍ය ක්‍රමයට අනුරූපවූ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් පිහිටුවීය.
D - නීති නිර්මාණය කිරීම සඳහා සීමිත බලයක් සහිත ද්වි-මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කළේ ය.
E - අවසාන අභියාචනාධිකරණ බලය සහිත ශ්‍රේෂ්ඨාධිකරණයක නායකත්වය සහිත අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කළේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

38. 1948 ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යටතේ ස්ථාපිත කළ ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ:
A - නාමික හා සත්‍ය වශයෙන් හැඳින්වුණු ද්විත්ව විධායකය
B - ඉහළ හා පහළ යනුවෙන් හැඳින්වුණු මණ්ඩල දෙකකින් යුත් ව්‍යවස්ථාදායකය
C - එංගලන්තයේ රාජාධිකරණයට අවසාන අභියාචනාධිකරණ බලය පැවරුණු අධිකරණ පද්ධතිය
D - සුළු ජන කොටස්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විශේෂයෙන් දක්වන ලද ව්‍යවස්ථා ආවරණ පද්ධතිය
E - දේශපාලනය විධායකය මගින් පාලනය කළ ස්වාධීන නොවූ රාජ්‍ය සේවාව
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

39. 1948 ව්‍යවස්ථාව යටතේ සත්‍ය විධායකය:
A - කැබිනට් මණ්ඩලය යන නිල නාමයෙන් හැඳින්විණ.
B - ව්‍යවස්ථාදායකයේ සාමාජිකයින් අතුරින් නාමික විධායකය විසින් පත් කරනු ලැබී ය.
C - අගමැතිවරයා නායකත්වය දරණු ලැබී ය.
D - ව්‍යවස්ථාදායකයට සාමූහිකව වගකිව යුතු විය.
E - ව්‍යවස්ථාදායකය තුළ සම්මත කරන ලද ද්වේෂාභියෝග යෝජනාවකින් නිලයෙන් පහකළ හැකි විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

40. 1972 පළමුවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටවූ ආණ්ඩුක්‍රමයේ විශේෂිත ලක්ෂණ කිහිපයක් වන්නේ:
A - සත්‍ය විධායකයේ නායකයා විසින් නාමික විධායකය පත් කිරීම
B - නාමික විධායකය විසින් සත්‍ය විධායකය පත් කිරීම
C - පාර්ලිමේන්තු ස්වාධිපති න්‍යාය පදනම් කරගෙන පිහිට වූ ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකය
D - නීති විවරණය කිරීමේ බලය සහිත අභියාචනාධිකරණයක නායකත්වයෙන් යුත් අධිකරණ ක්‍රමය
E - දේශපාලන විධායකයේ සෘජු පාලනයට යටත් කරන ලද රාජ්‍ය සේවය
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

41. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ ව්‍යවස්ථාදායකය:
A - ජාතික රාජ්‍ය සභාව ලෙස හැඳින්විණ.
B - ඡන්දයෙන් තෝරන ලද හා නාමකරණයෙන් පත් කරන ලද වශයෙන් මන්ත්‍රීවරුන් දෙවර්ගයකින් සමන්විත විය.
C - 'රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර උපකරණය' ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හැඳින්විණ.
D - ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ යන ක්ෂේත්‍ර තුනේම බලතල ක්‍රියාවට නැංවීමේ බලය භුක්ති වින්දේ ය.
E - අවුම වශයෙන් වසරකට වරක්වත් රැස්විය යුතු විය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

42. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකා දේශපාලන ක්‍රමයට හඳුන්වා දුන් වෙනස්කම් කිහිපයක් වන්නේ:
A - ශ්‍රී ලංකාව නිදහස්, ස්වෛරී, ස්වාධීන ජනරජයක් බවට පත් කිරීම
B - ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස නම් කිරීම
C - ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපති බලය ජනතාව අතට පත්කිරීම හා එය අත් හැරිය නොහැකි බව දැක්වීම
D - පූර්ව අධිකරණ විනිශ්චය බලය සහිත ව්‍යවස්ථානුකූල අධිකරණයක් හඳුන්වා දීම
E - අධිකරණ විනිශ්චය බලය සහිත මූලික අයිතිවාසිකම් මාලාවක් පුරවැසියන්ට ප්‍රදානය කිරීම
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

43. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව:
A - නිදහස ලැබූ දිනයේ සිට ශ්‍රී ලංකාව තුළ පැවති මූලික ව්‍යවස්ථානුකූල රාමුව වෙනස් කළේ ය.
B - රාජ්‍ය-ධනවාදී සාම්ප්‍රදායික ආර්ථික සංවර්ධන මොඩියුලය අත්හැර දැමුවේ ය.
C - 1833 වර්ෂයේ සිට වර්ධනය වූ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන පද්ධතිය අවප්‍රමාණය කළේ ය.
D - රාජ්‍යයේ ඒකීයභාවය වෙනස් කළේ ය.
E - පුද්ගලවාදය පදනම් කරගත් දේශපාලනය බල ගැන්වී ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

44. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විධායක ජනාධිපති:
A - ඕනෑම වාර ගණනක් තනතුර දරිය හැකි ය.
B - සංවරණයකින් තොරව පුළුල් ප්‍රමාණයක විධායක, ව්‍යවස්ථාදායක හා අධිකරණ බලතල දරනු ලැබේ.
C - කරන කාර්යයන් විශේෂ යෝජනාවකින් තොරව පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කිරීමට යටත් වේ.
D - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්ම නීතියට ඉහළින් තබා ඇත.
E - සාමාන්‍යයෙන් හඳුන්වන්නේ ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක් ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

45. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථාදායකය:
A - පාර්ලිමේන්තුව ලෙස හැඳින්වේ.
B - තෝරා පත්කරන හා නාමකරණයෙන් පත්කරන වශයෙන් මන්ත්‍රීවරුන් දෙවර්ගයකින් සමන්විත වේ.
C - නීති පැනවීම පිළිබඳව සර්වාධිපති ආයතනයක් නොවේ.
D - සැසිවාර පැවැත්වීම සඳහා අඩුම වශයෙන් මන්ත්‍රීවරුන් 30ක් සභාගැබ තුළ සිටිය යුතු ය.
E - ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝග ගෙන ඒමේ බලය භුක්ති විඳී.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

46. පළාත් සභා:
A - 1964 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ පිහිටුවන ලදී.
B - මූලික නීතියේ කොටසක් බවට ව්‍යවස්ථාවට කරන ලද 13 වන සංශෝධනය යටතේ පත්විය.
C - පළාත් සභා ලැයිස්තුවේ අන්තර්ගත කරුණු සඳහා ප්‍රඥප්ති සෑදිය හැකි ය.
D - සමගාමී ලැයිස්තුවේ අන්තර්ගත කරුණු සඳහා තනිව ප්‍රඥප්ති සෑදිය නොහැකි ය.
E - ස්වාධිපති ආයතන නොවේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

47. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන:
A - මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා යනුවෙන් ප්‍රභේද තුනක් වේ.
B - ක්‍රියාත්මක විය යුත්තේ මධ්‍යම ආණ්ඩුවේ අධීක්ෂණයට යටත්වය.
C - තමන්ගේ බල ප්‍රදේශය තුළ සමාජ ප්‍රයෝජ්‍යතා සේවාවන් සැපයීමේ වගකීම පැවරී ඇත.
D - සමන්විත වන්නේ වසර තුනක නිල කාලයක් සඳහා ඡන්දයෙන් තෝරන ලද නියෝජිතයන්ගෙන් පමණි.
E - මධ්‍යම ආණ්ඩුවෙන් අවධාරිත කරන ලද බලය පදනම් කොට ගෙන ක්‍රියාත්මක විය යුතු බැවින් ස්වාධීන ආයතන නොවේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

48. එක්සත් ජාතීන්ගේ සංවිධානය:
A - වර්තමාන ලෝකය තුළ තිබෙන පුළුල් අරමුණු සහිත විශාලතම අන්තර් රාජ්‍ය සංවිධානය වේ.
B - 1945 සැන් ෆ්‍රැන්සිස්කෝ සම්මේලනයේදී ජාතීන් 50ක් විසින් අත්සන් කරන ලද ප්‍රඥප්තිය මත ගොඩනගා ඇත.
C - සාමාජික රාජ්‍යයන්ගේ සමාන ස්වෛරීභාවය පිළිගැනීමේ මූලධර්මය මත ක්‍රියාත්මක වේ.
D - සාමාජික රාජ්‍යයන්ගේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත්වීමට ප්‍රඥප්තියෙන් බලය පවරා ඇත.
E - වර්තමාන ලෝකය තුළ අන්තර්ජාතික සාමය හා සුරක්ෂිතභාවය පිළිබඳව ක්‍රියාකරන ප්‍රධානම අන්තර්ජාතික සංවිධානය වේ.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

49. කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංවිධානය:
A - පුළුල් අරමුණු සහිත කලාපීය සංවිධානයක් වේ.
B - සමන්විත වන්නේ දකුණු ආසියාතික රාජ්‍යයන් අටකිනි.
C - ක්‍රියාත්මක වන්නේ නූ-දේශපාලන ක්ෂේත්‍රයන්හි සාමාජිකයින් අතර සහයෝගය වර්ධනය කිරීම සඳහා ය.
D - 1985 දෙසැම්බර් 8 වෙනිදා ප්‍රකාශයට පත් කළ 'ඩකා ප්‍රකාශනය' පදනම් කරගෙන ගොඩනගා ඇත.
E - අන්තර්ජාතික සමාජයේ හඳුන්වන්නේ 'දුප්පතුන්ගේ සමාජය' ලෙස ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

50. පොදු රාජ්‍ය මණ්ඩලය:
A - සීමිත අරමුණු සහිත මධ්‍යම ප්‍රමාණයේ රාජ්‍ය නොවන සංවිධානයක් වේ.
B - සමන්විත වන්නේ ප්‍රධාන වශයෙන්ම කලින් බ්‍රිතාන්‍ය යටත් විජිත ලෙස පැවැති රටවල් වලිනි.
C - සැලකිලිමත් වන්නේ සාමාජික රාජ්‍යයන්හි ආර්ථික හා සමාජ සංවර්ධනය කෙරෙහි ය.
D - බ්‍රිතාන්‍ය රජිනගේ නායකත්වය යටතේ පවතී
E - සංවිධානය කර ඇත්තේ 1950 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාව යටතේ ය.
(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | ..1.... | 26 | ..2.... |
| 02 | ..3.... | 27 | ..1.... |
| 03 | ..1.... | 28 | ..2.... |
| 04 | ..4.... | 29 | ..3.... |
| 05 | ..1.... | 30 | ..2.... |
| 06 | ..2.... | 31 | ..1.... |
| 07 | ..1.... | 32 | ..4.... |
| 08 | ..1.... | 33 | ..5.... |
| 09 | ..4.... | 34 | ..1.... |
| 10 | ..1.... | 35 | ..4.... |
| 11 | ..2.... | 36 | ..4.... |
| 12 | ..3.... | 37 | ..1.... |
| 13 | ..5.... | 38 | ..1.... |
| 14 | ..3.... | 39 | ..1.... |
| 15 | ..5.... | 40 | ..5.... |
| 16 | ..5.... | 41 | ..4.... |
| 17 | ..5.... | 42 | ..1.... |
| 18 | ..4.... | 43 | ..5.... |
| 19 | ..3.... | 44 | ..3.... |
| 20 | ..1.... | 45 | ..5.... |
| 21 | ..3.... | 46 | ..2.... |
| 22 | ..5.... | 47 | ..All |
| 23 | ..5.... | 48 | ..5.... |
| 24 | ..4.... | 49 | ..2.... |
| 25 | ..1.... | 50 | ..All |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100**කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, විෂය ක්ෂේත්‍රය අනුව :



| විෂය ඒකකය | ප්‍රශ්න සංඛ්‍යාව (ප්‍රශ්න අංක) | පහසුතාව වැඩිම | | පහසුතාව අඩුම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රශ්නය | පහසුතාව | ප්‍රශ්නය | පහසුතාව |
| 1. දේශපාලන විද්‍යාවේ ස්වභාවය | 3 (1, 2, 3) | 1 | 83% | 3 | 18% |
| 3. රාජ්‍යයේ ස්වභාවය | 2 (4, 5) | 5 | 55% | 4 | 17% |
| 4. ආණ්ඩුවේ ස්වභාවය, ආණ්ඩුක්‍රම ආකෘති සහ කාර්යයන් | 9 (6 - 14) | 8 | 80% | 14 | 16% |
| 5. ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධි ක්‍රම | 3 (18, 19, 20) | 19 | 89% | 20 | 54% |
| 6. ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අතර පවත්නා සම්බන්ධතාව | 3 (15, 16, 17) | 16 | 71% | 17 | 34% |
| 7. ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය | 11 (26 - 36) | 33 | 78% | 30 | 30% |
| 8. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේ පසුබිම | 9 (37 - 45) | 37 | 57% | 40 | 30% |
| 12. තෝරා ගත් රටවල ආණ්ඩුක්‍රම ආකෘති | 5 (21 - 25) | 21 | 53% | 23 | 30% |
| 13. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත විධි විධාන සහ ආයතන | 2 (46, 47) (47 සියලුම වරණ නිවැරදිය) | | | | |
| 16. ගෝලීය හා කලාපීය දේශපාලනය තුළ ශ්‍රී ලංකාව | 3 (48 - 50) | 48 | 57% | 49 | 26% |




I ප්‍රශ්න පත්‍රයට ඇතුළත් ඒකක අතුරින් පහසුතාව සැලකූ විට වැඩිම පහසුතාව, 71% ලබාගෙන ඇත්තේ "ආණ්ඩුකරණයට ජනතාව සම්බන්ධ වන විධි ක්‍රම" යන ඒකකයටයි. මෙහි 18, 19, 20 යන ප්‍රශ්න තුන එම ඒකකයෙන් අසා ඇති අතර ඒවායින් 19වන ප්‍රශ්නයට 89%ක පහසුතාව ද, 18වන ප්‍රශ්නයට 71%ක පහසුතාව ද ලැබී ඇත. එම ප්‍රශ්න දෙකම ඉතා සරල ඒවා මෙන්ම සිසුන්ට ඉතා හුරු පුරුදු ප්‍රශ්න වීම පහසුතා ඉහළ අගයක් ගැනීමට හේතු වී ඇත.

"නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල විශේෂිත විධිවිධාන සහ ආයතන" යන ඒකකයෙන් ප්‍රශ්න දෙකක් අසා ඇති අතර එයින් 47වන ප්‍රශ්නයට සියලු වරණ සඳහා ලකුණු ප්‍රදානය කෙරිණි.

"ප්‍රජාතන්ත්‍රවාදය හා යහපාලනය අතර සම්බන්ධතාව", "ශ්‍රී ලංකාවේ පැවති යටත් විජිත පාලනයේ ස්වභාවය" සහ "ගෝලීය හා කලාපීය පාලනය තුළ ශ්‍රී ලංකාව" යන ඒකකවලින් ප්‍රශ්න හතක් ඇතුළත්ව ඇති අතර ඒවා 50%ට වඩා වැඩි පහසුතා ලබා ඇත.

ප්‍රශ්න 9ක් වූ වැඩිම ප්‍රමාණයක් අසා ඇති "ආණ්ඩුවේ ස්වභාවය හා ආණ්ඩුක්‍රම ආකෘති සහ කාර්යයන්" යන ඒකකය සඳහා 48%ක පහසුතාව ලබා ඇත. "දේශපාලන විද්‍යාවේ ස්වභාවය", "තෝරා ගත් රටවල ආණ්ඩුක්‍රම ආකෘති" සහ "නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම" යන ඒකක සඳහා දක්වා තිබෙන්නේ 42%- 46% අතර පහසුතා ය.

අවම පහසුතාව වන 36%ක් "රාජ්‍යයේ ස්වභාවය" පිළිබඳ ඒකකයට හිමි වී ඇති අතර එම ඒකකය යටතේ අසා ඇති ප්‍රශ්න සංඛ්‍යාව දෙකකි.

**2.1.5** I ප්‍රශ්න පත්‍රයේ එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 |
| 1 | 1 | 84% | 1% | 3% | 4% | 8% |
| 2 | 3 | 29% | 5% | 36% | 3% | 27% |
| 3 | 1 | 18% | 21% | 12% | 37% | 12% |
| 4 | 4 | 16% | 11% | 33% | 17% | 23% |
| 5 | 1 | 55% | 14% | 3% | 16% | 12% |
| 6 | 2 | 25% | 26% | 18% | 9% | 22% |
| 7 | 1 | 48% | 21% | 11% | 10% | 10% |
| 8 | 1 | 80% | 2% | 2% | 4% | 12% |
| 9 | 4 | 14% | 4% | 11% | 65% | 6% |
| 10 | 1 | 40% | 3% | 19% | 22% | 16% |
| 11 | 2 | 18% | 60% | 6% | 6% | 10% |
| 12 | 3 | 20% | 5% | 54% | 13% | 8% |
| 13 | 5 | 19% | 7% | 17% | 13% | 44% |
| 14 | 3 | 29% | 14% | 16% | 21% | 20% |
| 15 | 5 | 15% | 4% | 24% | 7% | 50% |
| 16 | 5 | 6% | 4% | 14% | 5% | 71% |
| 17 | 5 | 11% | 11% | 12% | 32% | 34% |
| 18 | 4 | 5% | 6% | 4% | 71% | 14% |
| 19 | 3 | 1% | 2% | 89% | 4% | 4% |
| 20 | 1 | 54% | 18% | 4% | 18% | 6% |
| 21 | 3 | 17% | 10% | 53% | 11% | 9% |
| 22 | 5 | 10% | 10% | 12% | 16% | 52% |
| 23 | 5 | 5% | 28% | 19% | 18% | 30% |
| 24 | 4 | 9% | 14% | 6% | 46% | 25% |
| 25 | 1 | 50% | 18% | 12% | 9% | 11% |
| 26 | 2 | 20% | 47% | 10% | 17% | 6% |
| 27 | 1 | 67% | 6% | 6% | 15% | 6% |
| 28 | 2 | 4% | 57% | 10% | 26% | 3% |
| 29 | 3 | 22% | 7% | 48% | 14% | 9% |
| 30 | 2 | 23% | 30% | 17% | 12% | 18% |
| 31 | 1 | 46% | 14% | 7% | 10% | 23% |
| 32 | 4 | 14% | 22% | 11% | 34% | 19% |
| 33 | 5 | 5% | 6% | 7% | 4% | 78% |
| 34 | 1 | 75% | 9% | 5% | 5% | 6% |
| 35 | 4 | 6% | 8% | 7% | 74% | 5% |
| 36 | 4 | 5% | 5% | 33% | 51% | 6% |
| 37 | 1 | 57% | 8% | 7% | 19% | 9% |
| 38 | 1 | 52% | 5% | 18% | 17% | 8% |
| 39 | 1 | 47% | 14% | 9% | 19% | 11% |
| 40 | 5 | 11% | 27% | 8% | 24% | 30% |
| 41 | 4 | 23% | 7% | 8% | 49% | 13% |
| 42 | 1 | 34% | 7% | 25% | 11% | 23% |
| 43 | 5 | 15% | 5% | 22% | 21% | 37% |
| 44 | 3 | 8% | 31% | 33% | 10% | 18% |
| 45 | 5 | 6% | 3% | 34% | 14% | 43% |
| 46 | 2 | 27% | 35% | 14% | 7% | 17% |
| 47 | සියල්ලම | 16% | 4% | 5% | 9% | 66% |
| 48 | 5 | 3% | 6% | 17% | 17% | 57% |
| 49 | 2 | 22% | 26% | 28% | 10% | 14% |
| 50 | සියල්ලම | 24% | 48% | 6% | 6% | 16% |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

I ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු සැපයීමේදී ප්‍රශ්න අංක 3, 4, 6, 14, 23, 30, 40 සහ 49 යන ප්‍රශ්න සඳහා අඩු සාධන මට්ටමක් දක්වා ඇත. ඒවායෙහි පහසුතා 30% හෝ ඊට අඩු අගයක් ලබා ඇත. ප්‍රශ්න අංක 2, 10, 17, 32, 42, 43, 44 හා 46 යන ප්‍රශ්න සඳහා සපයා ඇති පිළිතුරුවලින් 30%ත් 40%ත් අතර පහසුතා නිරූපණය කර ඇත. ප්‍රශ්න අංක 1, 8, 16, 18, 19, 33, 34 සහ 35යන ප්‍රශ්න සඳහා ඉහළ පහසුතා ප්‍රදර්ශනය කර ඇත. මෙහිදී අපේක්ෂකයන්ගෙන් 70%කට වඩා නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

චර්යාවාදය හා සම්බන්ධ වූ 3වන ප්‍රශ්නයේ නිවැරදි 1වන වරණය 18%ක් පමණක් තෝරා ගෙන ඇත. සිසුන්ගෙන් 37%ක්ම 4වන වරණය තෝරා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් ය. පාරිභාෂිත වචන භාවිතය හා තේරුම් ගැනීම සම්බන්ධයෙන් සිසුන් තුළ සඵලතාව පහළ මට්ටමක පැවතීම, ඒ කෙරෙහි බලපා ඇත. වචනාර්ථ මැනවින් තේරුම් ගැනීමටත් පාඨ ග්‍රන්ථ පරිශීලනය කිරීමටත් සිසුන් පෙළඹවීම තුළින්, සිසු ප්‍රබලතා වර්ධනය කරවීම කළ හැකිය.

දේශපාලන විද්‍යාවේ කේන්ද්‍රීය මාතෘකාව වන "රාජ්‍යය" ඇසුරින් 4 වන ප්‍රශ්නය ගොඩ නගා තිබුණි. එහි නිවැරදි 4 වන වරණය, 17%ක් තෝරා ගෙන ඇතත්, 33%ක්ම 3 වන වරණය තෝරා තිබුණි. රාජ්‍යයේ ආරම්භය හා රාජ්‍ය පිළිබඳ හැදෑරීමේ ආරම්භය පිළිබඳව සැලකිලිමත් නොවීම, සිසුන් වැරදි වරණයක් තේරීමට හේතු වී ඇත. විශේෂයෙන්ම මූලික සංකල්ප හා ඒවා අතර පවතින සියුම් වෙනස්කම් මැනවින් විග්‍රහ කර ගැනීමට සිසුන් පෙළඹවීම තුළින් මෙම අපහසුතාව මග හරවා ගත හැකිය.

ආණ්ඩුව පිළිබඳව අසා ඇති 6 වන ප්‍රශ්නයේ නිවැරදි 2 වන වරණය 26%ක් තෝරා ගෙන ඇති අතර 25%ක් 1 වන වරණය ද, 22%ක් 5 වන වරණය ද තෝරා ගෙන තිබුණි. මෙහිදී ප්‍රශ්නය නිරවුල්ව තේරුම් නොගැනීම නිසා අයදුම්කරුවන් වැඩි පිරිසක් වැරදි වරණ තෝරා ඇත. එබැවින් ආණ්ඩුවේ ස්වභාවය පිළිබඳ කරුණු නිවැරදිව හා නිශ්චිතව අවබෝධ කරවීම වඩාත් සුදුසු වේ.

ප්‍රශ්න අංක 14 සමාජවාදී දේශපාලන ක්‍රමයක ප්‍රධාන ලක්ෂණ හා සම්බන්ධ වේ. එහි නිවැරදි වරණය වූයේ 3 වන වරණය යි. සිසුන්ගෙන් 16%ක් පමණක් නිවැරදි වරණය තෝරා ගෙන තිබුණි. සිසුන්ගෙන් 29%ක් 1 වන වරණය ද 21%ක් 4 වන වරණය ද 20%ක් 5 වන වරණය ද තෝරා තිබුණි. ඉන් පෙනී යන්නේ අදාළ මාතෘකාව පිළිබඳ සිසුන්ගේ දැනුම තව දුරටත් නිරවුල් කළ යුතුව ඇති බවයි. විශේෂයෙන්ම සමාජවාදී පාලන ක්‍රමයක ස්වරූපය සහ කොමියුනිස්ට් සමාජ ක්‍රමයක ස්වරූපය පිළිබඳ සැලකිලිමත් වී නැති බව පෙනේ. පන්ති කාමරයේදී මෙවැනි ඉතා සමීපව පිහිටන සංකල්ප පිළිබඳ බුද්ධි කලම්බන සාකච්ඡාවලට සිසුන් යොමු කිරීම මගින් විෂය කරුණු තහවුරු කිරීමට හැකි වේ.

ප්‍රංශ ආණ්ඩුක්‍රමය ඇසුරෙන් අසා ඇති 23 වන ප්‍රශ්නයේ නිවැරදි 5 වන වරණය 30%ක් තෝරා තිබුණි. වැඩි පිරිසක් වැරදි වරණ තෝරා තිබීමෙන් පෙනී යන්නේ ප්‍රංශ ආණ්ඩුක්‍රමය පිළිබඳ මනා අවබෝධයක් නොමැති බවයි. තෝරාගත් ආණ්ඩුක්‍රම පිළිබඳව ප්‍රධාන කොටස් සහ අනු කොටස් පන්ති කාමරයේදී සාකච්ඡා කිරීම තුළින් ඉහළ සාධන මට්ටමකට ළඟා විය හැකිය.

1924 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව 30 වන ප්‍රශ්නයේ නිවැරදි 2 වන වරණය තෝරා ඇත්තේ 30%ක් පමණි. 1 වන වරණය 23%ක් ද, 3 වන වරණය 17%ක් ද, 4 වන වරණය 12%ක් ද, 5 වන වරණය 18%ක් ද, තෝරා තිබුණි. එම ප්‍රතිසංස්කරණවල මූලික ලක්ෂණ පිළිබඳව තහවුරු කිරීමට අවශ්‍ය වේ.

1972 පළමු ජනරජ ව්‍යවස්ථාව ඇසුරෙන් අසා ඇති 40වන ප්‍රශ්නයේ නිවැරදි 2වන වරණය තෝරා ඇත්තේ 30%ක් පමණි. මෙහි අයදුම්කරුවන් 70%ක්ම වැරදි වරණ තෝරා තිබීම මගින් ආණ්ඩුක්‍රමයේ විශේෂ ලක්ෂණ පැහැදිලිව හඳුනා ගෙන නොමැති බව ප්‍රදර්ශනය වේ. ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණ වඩාත් තහවුරු වන ආකාරයෙන් සිසුන්ට විෂය කරුණු අවබෝධ කරවීම යෝග්‍ය වේ.

කලාපීය සංවිධාන පිළිබඳව අසා ඇති 49වන ප්‍රශ්නයේ නිවැරදි වරණය තෝරා ඇත්තේ 26%කි. මින් පැහැදිලි වන්නේ කලාපීය සංවිධාන පිළිබඳ ඇති දැනුම ප්‍රමාණවත් නොවන බවයි. අන්තර්ජාතික සංවිධාන පිළිබඳ නිර්මාණ සංග්‍රහයක් සිසුන් ලවා පිළියෙල කර ඒ පිළිබඳ ඔවුන්ගේ දැනුම ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකිය.

ප්‍රශ්න අංක 2, "දේශපාලනය" හා සම්බන්ධ වේ. එහි නිවැරදි 3 වරණය තෝරාගෙන ඇති ප්‍රතිශතය 36% වේ. මෙහි 29%ක් 1 වන වරණය ද 27%ක් 5 වන වරණය ද තෝරා තිබීමෙන් වරණවල ඇතුළත් වචනාර්ථ පිළිබඳ සැලකිලිමත් වී නොමැති බව පැහැදිලි වේ. එබැවින් න්‍යාය සහ ප්‍රායෝගික තත්ත්ව අතර වෙනස පිළිබඳව මනා වැටහීමක් ලබා දීමටත් නිර්දේශිත ග්‍රන්ථ පරිහරණය කිරීමටත් සිසුන් යොමු කරවීම තුළින් සාධන මට්ටම ඉහළ නැංවීමට හැකි වේ.

10වන ප්‍රශ්නය ගොඩ නගා තිබුණේ ජනාධිපති ආණ්ඩුක්‍රමයක ලක්ෂණ අන්තර්ගත කරුණු පදනම් කර ගනිමිනි. මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි වරණය වූයේ 1 වන වරණය යි. සිසුන්ගෙන් 40%ක් මෙම වරණය තෝරාගෙන තිබුණි. 60%ක්ම සාවද්‍ය වරණ තෝරාගෙන තිබුණි. මෙයින් කැපී පෙනෙන ලක්ෂණය වනුයේ ආණ්ඩුක්‍රම පිළිබඳ මනා වැටහීමක් නොපවතින බවයි. ඒ ඒ ආණුඩුක්‍රමවල මූලික ලක්ෂණ තුලනාත්මකව අධ්‍යයනය කිරීමට සිසුන් පෙළඹවීමෙන් මෙම තත්ත්වය මඟ හරවා ගත හැකිය.

දේපල පිළිබඳ දක්වා ඇති 17වන ප්‍රශ්නය සඳහා සිසුන් 34%ක් නිවැරදි 5 වන වරණ තෝරා තිබුණි. 4 වන වරණය 32%ක් තේරීමෙන් පැහැදිලි වන්නේ මෙම සංකල්පය පිළිබඳ ප්‍රායෝගික අවස්ථාවන්ට අදාළව සිසුන්ට මඟ පෙන්වීම අවශ්‍ය වන බවය.

ප්‍රශ්න අංක 29, 31, 32, 42, 43, 44, 45 හා 46 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන තත්ත්වය හා සම්බන්ධව සැකසී ඇත. ඒවායේ පහසුතා පිළිවෙළින් 48%, 46%, 35%, 34%, 37%, 33%, 44% හා 35% වේ. 1948, 1972 හා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ සිසුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ. එක් එක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පරිශීලනය කරමින් කරුණු සෙවීමට යොමු කිරීම තුළින් සිසුන්ගේ සාධන මට්ටම් ඉහළ නැංවීමට හැකි වේ.

ඉහළ පහසුතා ප්‍රදර්ශනය කර ඇති 1, 8, 16, 18 හා 19 ප්‍රශ්න දේශපාලන විද්‍යාවේ සිද්ධාන්ත පදනම් කරගෙන සැකසී තිබුණි. ඒවායේ පහසුතා පිළිවෙළින් 83%, 80%, 71%, 71% සහ 89% වේ.

මානව අයිතිවාසිකම් සහ නියෝජනය ඇසුරෙන් පිළියෙල කරන ලද 16 හා 18 ප්‍රශ්නවලට 71% ක බැගින් වූ ඉහළ පහසුතා ලබා තිබේ. මෙම සිද්ධාන්තමය කරුණු අපේක්ෂකයන්ට ප්‍රායෝගිකව දේශපාලන ක්‍රමය තුළ අසන්නට, දකින්නට ලැබීම වැඩි සාධන මට්ටමක් ලැබීමට හේතු වී ඇත.

33, 34 සහ 35 යන ප්‍රශ්න ලංකාවේ යටත් විජිත අවධිය හා සම්බන්ධ වී තිබුණි. සිසුන්ට හුරු පුරුදු සහ සෑම වසරකම ප්‍රශ්න පත්‍රයට ඇතුළත්වන මාතෘකාවක් වන ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇසුරෙන් මෙම ප්‍රශ්න අසා තිබීම නිසා 73% කට වඩා වැඩි පහසුතා ලබා ගැනීමට සමත් වී ඇත.

I ප්‍රශ්න පත්‍රයේ සියලුම ප්‍රශ්න ඉතාමත් අවධානයෙන් යුතුව සම්පූර්ණයෙන් කියවා තේරුම් ගැනීමටත්, අතපසු වූ කරුණු පහසුවෙන් හඳුනාගත හැකි පරිදි සලකුණු කර ගැනීමටත් සිසුන් පෙළඹවීම සඳහා ගුරුවරුන්ගේ මග පෙන්වීම අවශ්‍ය වේ.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.
මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

A කොටස - කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20 කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 1 බැගින් ලකුණු 20 කි.

B කොටස - අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි. ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

C කොටස - අර්ධ ව්‍යුහගත හා රචනා වර්ගයේ ප්‍රශ්න 4 කි. ප්‍රශ්න **දෙකකට** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ලකුණු 40 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු 20 + 40 + 40 = 100

**2.2.2. II ප්‍රශ්න පත්‍රය, අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා**

| |
|---|
| **II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2 හා 3 ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර කොටස ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.** |

## A කොටස

**1 සිට 20 දක්වා ප්‍රශ්න**

1. (i) 'දේශපාලන විද්‍යාවේ පියා' ලෙස සැලකෙන දේශපාලන දාර්ශනිකයා නම් කරන්න.
   ඇරිස්ටෝටල්

   (ii) 'නූතන දේශපාලනයේ පියා' ලෙස සැලකෙන දේශපාලන චින්තකයා නම් කරන්න.
   නිකලෝ මැකියාවෙල්ලි

2. (i) "දාර්ශනිකයින් පාලකයින් වනතුරු හෝ මේ ලෝකයේ රජවරුන්ට හා කුමාරවරුන්ට දර්ශනයේ ජීව ගුණය හා බලය උකහා ගැනීමට හැකි වන තුරු රාජ්‍යයන් මුහුණ දී ඇති නරකයන්ගෙන් ඒවා නොමිදෙනු ඇත."

   (ii) "දේශපාලනය වූ කලී සටනක් වේ. දේශපාලනය වූ කලී නොනවතින බල අරගලය වේ. සෑම දේශපාලනයක්ම බල දේශපාලනය වේ."

   මෙම පාඨ **දෙක** උපුටා ගත් ග්‍රන්ථ **දෙක** හා ඒවායේ **කතුවරුන්** නම් කරන්න.
   1. ප්ලේටෝ - සමූහාණ්ඩුව - (Republic)
   2. නිකලෝ මැකියාවෙල්ලි - කුමාරයා - (The Prince)

3. "වර්තමාන ලෝකය තුළ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවීම සඳහා භාවිතයට ගැනෙන ආණ්ඩුක්‍රම වර්ග තුනක් තිබේ." එයින් **දෙකක්** නම් කරන්න.
   1. කැබිනට් ආණ්ඩුක්‍රමය
   2. ජනාධිපති ආණ්ඩුක්‍රමය
   3. අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය

4. "ගුණාත්මක සාධක පදනම් කොට ගෙන දේශපාලන පක්ෂ කොටස් දෙකකට බෙදනු ලැබේ." එම කොටස් **දෙක** නම් කරන්න.
   1. ජනතාවාදී පක්ෂ
   2. කේඩර පක්ෂ

5. "සමානුපාතික නියෝජන ක්‍රමය ක්‍රියාවට නංවන ප්‍රධාන ක්‍රම දෙකක් තිබේ." එම ක්‍රම **දෙක** නම් කරන්න.
   1. ලැයිස්තු ක්‍රමය
   2. මාරු කළ හැකි තනි ඡන්ද ක්‍රමය (හෙයාර් ක්‍රමය)

6. "ජනතාව සහභාගි වන ආකාරය අනුව ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවෙන ක්‍රම දෙකක් තිබේ." එම ක්‍රම **දෙක** නම් කරන්න.

1. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමය (මැතිවරණ)

2. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම (මින් එකක් නම් කිරීම ප්‍රමාණවත් නොවේ)

7. "ස්වාධිපති න්‍යායේ සහ බලතල බෙදීමේ න්‍යායේ නිර්මාතෘවරුන් **දෙදෙනා** නම් කරන්න.

1. ජීන් බොඩෑන්

2. චාල්ස් මොන්ටෙස්ක්‍යු

8. ජනාධිපති ආණ්ඩුක්‍රමයක ජනාධිපතිවරයා සහ කැබිනට් ආණ්ඩුක්‍රමයක අගමැති සහ කැබිනට් මණ්ඩලය තනතුරුවලින් ඉවත් කිරීම සඳහා ව්‍යවස්ථාදායක සභා විසින් භාවිතයට ගන්නා විධි ක්‍රම **දෙක** නම් කරන්න.

1. දෝෂාභියෝගය

2. විශ්වාස භංග යෝජනාව

9. "ආණ්ඩුව විසින් ආණ්ඩුවේ බලය ජනතාව මත ක්‍රියාවට නංවන්නේ ප්‍රධාන උපකරණ දෙකක් භාවිත කරමිනි" එම උපකරණ **දෙක** නම් කරන්න.

1. සිවිල් සේවය

2. පොලිසිය

10. "අන්තර්ජාතික සංවිධාන සමන්විත වන්නේ සංවිධාන වර්ග දෙකකින්ය" එම සංවිධාන වර්ග **දෙක** නම් කරන්න.

1. අන්තර් ජාතික රාජ්‍ය සංවිධාන

2. අන්තර් ජාතික රාජ්‍ය නොවන සංවිධාන

11. "කෝල්බෲක් කොමිසමේ නිර්දේශ පරිදි 1833 දී ස්ථාපිත කළ ව්‍යවස්ථාදායක සභාව සමන්විත වූයේ දෙවර්ගයක නිෙයා්ජිතයන්ගෙනි." එම **දෙවර්ගය** නම් කොට ඒ ඒ වර්ගයට අයත් වූ නියෝජිත සංඛ්‍යාව දක්වන්න.

1. නිල ලත් මන්ත්‍රීවරු - 09

2. නිල නොලත් මන්ත්‍රීවරු - 06

12. "ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ අමාත්‍ය මණ්ඩලය සමන්විත වූයේ දෙවර්ගයක අමාත්‍යවරුන්ගෙනි." එම **දෙවර්ගය** නම් කොට ඒ ඒ වර්ගයට අයත් වූ අමාත්‍යවරුන්ගේ සංඛ්‍යාව දක්වන්න.

1. රාජ්‍ය නිලධාරීන් - 03

2. ලාංකික ඇමතිවරු - 07

13. "සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ සෙනෙට් සභාවට නියෝජිතයින් පත් කළේ ක්‍රම දෙකක් අනුවය." එම ක්‍රම **දෙක** නම් කොට එක් එක් ක්‍රමය යටතේ පත් කළ නියෝජිත සංඛ්‍යාව

දක්වන්න.

1. පාර්ලිමේන්තුව නියෝජනය කරන දේශපාලන පක්ෂවලින් - මාරු කළ හැකි තනි ඡන්දය දීමේ ක්‍රමයට - 15

2. අගමැතිවරයාගේ උපදෙස් අනුව අග්‍රාණ්ඩුකාරවරයා විසින් - 15

14. සුළුතර කණ්ඩයම්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සැපයූ ආවරණ **දෙකක්** නම් කරන්න.

පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක්

1. 29 - II වගන්තිය

2. නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට අග්‍රාණ්ඩුකරු විසින් 06 දෙනෙකු නාමකරණයෙන් පත් කිරීම.

3. සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයට අග්‍රාණ්ඩුකරු විසින් 15 දෙනෙකු නම් කිරීම.

4. බහු මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමය

5. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

6. අධිකරණ සේවා කොමිෂන් සභාව

15. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ඉදිරියට ගෙන ආ හැකි පනත් කෙටුම්පත් වර්ග දෙකක් වූ අතර ඒ ඒ පනත් කෙටුම්පත් වර්ගය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය ක්‍රියාත්මක විය යුතු කාල වකවානු දෙකක්ද විය. එම පාර්ලිමේන්තු පනත් කෙටුම්පත් වර්ග **දෙක** සහ ඒ ඒ වර්ගයට වෙන් කරන ලද කාල වකවානු දක්වන්න.

1. සාමාන්‍ය පනත් - දින 14

2. හදිසි පනත් - පැය 24

16. අධිකරණ කටයුතු පිළිබඳව ක්‍රියා කිරීම සඳහා 1972 ව්‍යවස්ථාව යටතේ පිහිට වූ ව්‍යවස්ථා මණ්ඩල **දෙක** නම් කොට එක් එක් කණ්ඩායමේ සංයුතිය දක්වන්න.

1. අධිකරණ සේවා උපදේශක මණ්ඩලය - 05

2. අධිකරණ සේවා විනය මණ්ඩලය - 03

17. "1987 වර්ෂයේදී පළාත් සභා ස්ථාපිත කරනු ලැබුවේ නීතිමය ප්‍රතිපාදන දෙකක් පදනම් කොට ගෙනය" එම නීතිමය ප්‍රතිපාදන **දෙක** නම් කරන්න.

1. 1987- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 13 සංශෝධනය

2. 1987 - අංක 42 දරණ පළාත් සභා පනත

18. "1978 ව්‍යවස්ථාව මගින් කරුණු දෙකක් පිළිබඳ ව තනි හා අනන්‍ය විනිශ්චය බලය ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා ඇත." එම කරුණු **දෙක** නම් කරන්න.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථකථනය කිරීම

2. මූලික අයිතිවාසිකම් පෙත්සම් විභාග කිරීම.

19. "1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නැංවිය යුත්තේ දෙයාකාර ක්‍රමයකට මට්ටම් දෙකකදී ය." එම ක්‍රම **දෙක** සහ මට්ටම් **දෙක** නම් කරන්න.

1. ජනතා ඡන්දයෙන් තෝරා පත්කළ නියෝජිතයන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව මගින්

2. ජනමත විචාරණයකදී සෘජුවම ජනතාව විසින්

20. "එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවිධාන ව්‍යුහය ගොඩනගා තිබෙන්නේ ප්‍රධාන ආයතන හයක් මතය." එම ආයතන හයෙන් **දෙකක්** නම් කරන්න.

පහත දැක්වෙන ඒවායින් ඕනෑම දෙකක්

1. මහා මණ්ඩලය
2. ආරක්ෂක මණ්ඩලය
3. ආර්ථික හා සාමාජීය මණ්ඩලය
4. භාරකාර මණ්ඩලය
5. අන්තර්ජාතික අධිකරණය
6. මහ ලේකම් කාර්යාලය

(එක් ප්‍රශ්නයක සම්පූර්ණ පිළිතුරකට ලකුණු එක බැගින් ද
අර්ධ පිළිතුරකට ලකුණු 1/2 බැගින් ද හිමි වේ.)
(20 × 1= ලකුණු 20)

**A කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




A කොටස අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 98%ක් පමණි. මෙම කොටසට ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 20ක් ඇති අතර ඒ සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 5 ප්‍රාන්තරයේ 40%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 35%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 20%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 5%ක් ද
ලබාගෙන ඇත. මෙම ප්‍රශ්න සඳහා ලකුණු 11 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 25%ක් වන අතර ලකුණු 10ක් හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 75%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 40%ක්ම ලබා ගෙන ඇත්තේ ලකුණු 5 හෝ ඊට අඩුවෙනි.




A කොටසට ප්‍රශ්න 20ක් ඇති අතර ඉන් ප්‍රශ්න 9ක පහසුතාව 40% හෝ ඊට වඩා වැඩිය. 1 ප්‍රශ්නය පහසුතාව වැඩිම ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 79%කි. එසේම පහසුතාව අඩුම ප්‍රශ්නය 17 වේ. එහි පහසුතාව 10%කි.

A කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා

II පත්‍රයේ A කොටසේ 1 සිට 20 දක්වා වූ ප්‍රශ්නවල 2, 4, 5, 6, 12, 13, 15, 16, 17, 18 හා 19 ප්‍රශ්නවලට සපයා ඇති පිළිතුරුවලට අනුව සිසුන් වැඩි පිරිසක් 35%ට අඩු ලකුණු ලබා තිබුණි. ප්‍රශ්න අංක 2 සඳහා සම්පූර්ණ ලකුණු ලබා තිබුණේ 22% කි. දාර්ශනිකයින්, ඔවුන් රචනා කරන ලද ග්‍රන්ථ හා එම දාර්ශනිකයින්ගේ ප්‍රකාශ පිළිබඳ පැහැදිළි සහ නිරවුල් අවබෝධයක් ලබා ගෙන නැත. දේශපාලන විද්‍යාව හා සම්බන්ධ විවිධ දාර්ශනිකයින් සහ බුද්ධිමතුන් රචනා කරන ලද ග්‍රන්ථ සහ ඔවුන්ගේ ප්‍රකාශ අඩංගු පත්‍රිකා පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීමට සිසුන් පෙළඹවීම සුදුසු ය. මෙය පැවරුමක් ලෙස ද පන්ති කාමරයේදී සිසුන්ට ලබා දීම කළ හැකිය.

දේශපාලන ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රශ්න අංක 4 ට සිසුන් සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ 25%කි. දේශපාලන පක්ෂ වර්ගීකරණය පිළිබඳ සිසුන්ට නිවැරදි අවබෝධයක් නොපවතින බව පැහැදිලි ය. දේශපාලන පක්ෂ පිළිබඳ සාකච්ඡා කිරීමේදී පක්ෂ වර්ගීකරණය පිළිබඳ සිසුන්ට හොඳින් අවධාරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම අවශ්‍ය වේ.

නියෝජනය හා සම්බන්ධ ප්‍රශ්න අංක 5 ට සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ 34%ක් පමණි. නියෝජන ක්‍රම පිළිබඳ සිසුන් සතු දැනුම ඉහළ මට්ටමක නොපවතී. නියෝජන ක්‍රම පිළිබඳ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රධාන නියෝජන ක්‍රම දෙක හා සම්බන්ධ වර්ග කිරීම් පිළිබඳ ප්‍රදර්ශන පත්‍රිකා මගින් පැහැදිළි කළ හැකිය.

දේශපාලන ක්‍රියාදාමය හා සම්බන්ධ ප්‍රශ්න අංක 6 සඳහා නිවැරදි පිළිතුර ලබා ඇත්තේ 30% ක සිසුන් ප්‍රමාණයකි. ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාවට නැංවෙන ක්‍රම පිළිබඳ නිවැරදි අවබෝධයක් පවතින බවක් නොපෙනේ. ඒ සඳහා ග්‍රීක යුගයේ ජනතාව පාලන ක්‍රමයට සහභාගි කරවාගත් ක්‍රමය පිළිබඳවත් වර්තමානයේ භාවිතයට ගන්නා ක්‍රම පිළිබඳවත් ප්‍රායෝගික නිදසුන් ඇසුරෙන් සිසුන්ට පැහැදිළි කළ හැකිය.

නිදහසට පෙර ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය හා සම්බන්ධ 12 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ සිසුන් 34%ක් පමණි. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ක්‍රියාත්මක වූ දේශපාලන ආයතන සහ එම ආයතනවලට ඇතුළත් සාමාජිකයින් හා එම සංඛ්‍යාවන් පිළිබඳ පැහැදිළි අවබෝධයක්, සිසුන් තුළ නොපැවතුණි. නිදහසට පෙර ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ එක් එක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සහ ඒවා යටතේ ක්‍රියාත්මක වූ දේශපාලන ආයතන හා ඒවායේ සංයුතිය පිළිබඳ පත්‍රිකා සකස් කිරීමට, සිසුන් යොමු කළ හැකිය.

සෝල්බරි ව්‍යවස්ථාව හා සම්බන්ධ 13 වන ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ සිසුන් 28%ක් පමණි. පැවති ආණ්ඩුක්‍රම, ඒවායේ මූලික දේශපාලන ආයතනවල සංයුතිය පිළිබඳ අවබෝධයක් නොමැති වීම ඊට හේතුවයි. එම නිසා එම ආයතනවල නිවැරදි තත්ත්වය පිළිබඳව සිසුන්ට අවබෝධයක් ලබා දිය යුතුය. පන්තියේ සිසුන් කණ්ඩායම් කර එක් එක් ආණ්ඩුක්‍රමවල ඒ ඒ ආයතන පිළිබඳ තොරතුරු පත්‍රිකා පිළියෙල කිරීමට සිසුන් යොමු කළ හැකිය.

1972 ව්‍යවස්ථාව හා සම්බන්ධ 15 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ 21%ක ප්‍රමාණයකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ඇති කරන ලද ප්‍රධාන ආයතන හැරුණු කොට ඊට අයත් අනෙක් වැදගත් ආයතන පිළිබඳ සිසුන්ගේ දැනුම අඩු මට්ටමක පැවතීම මීට හේතුවයි. එක් එක් ආණ්ඩුක්‍රම යටතේ පිහිටුවනු ලබන විශේෂ ආයතන පිළිබඳව සිසුන් ලවා කාර්ය පත්‍රිකා සකස් කර, පන්ති කමරය තුළ එය ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දිය හැකිය.

1972 ව්‍යවස්ථාවේ අධිකරණය හා සම්බන්ධ 16 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ සිසුන් 24%ක් පමණි. ඒ ඒ ව්‍යවස්ථාවට සුවිශේෂී වූ ඒ ඒ ආයතන පිළිබඳ නිවැරදි සහ නිශ්චිත අවබෝධයක් නොපැවතීම ඊට හේතුවයි. මේ සඳහා එක් එක් ආණුඩුක්‍රමයන් හා අදාළ සියලුම ආයතන පිළිබඳ හොඳන් අවධාරණය වන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීම සුදුසු ය.

පළාත් සභා හා සම්බන්ධ 17 වන ප්‍රශ්නය අඩුම සිසුන් සංඛ්‍යාවක් එනම්, 10%ක් පමණක් සම්පූර්ණ ලකුණු ලබා ඇත. විෂය නිර්දේශයේ මෙම අනුඒකකය පිළිබඳ සිසුන්ගේ දැනුම අල්ප වීම ඊට හේතුවයි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් පිළියෙල කිරීමට සිසුන් යොමු කරවා එක් එක් සිසුවාගේ තොරතුරු පත්‍රිකා පිළිබඳ පන්ති කාමරයේ සාකච්ඡා කළ හැකිය.

1978 ව්‍යවස්ථාවේ අධිකරණය හා සම්බන්ධ ප්‍රශ්නයේදී සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ 15%ක් පමණි. අධිකරණයේ කාර්යයන් පිළිබඳ පැහැදිළි හා නිරවුල් අවබෝධයක් නොමැති වීම ඊට හේතුවයි. එම කාර්යයන් පිළිබඳව හා ඒ ඒ කාර්යයන්වල සුවිශේෂී ලක්ෂණ පිළිබඳව ද අවබෝධයක් සිසුන්ට ලබා දීම අවශ්‍ය වේ.

1978 ව්‍යවස්ථාවේ ව්‍යවස්ථාදායක බලය හා සම්බන්ධ 19 වන ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු ලබා ඇත්තේ සිසුන් 15%ක් පමණි. ව්‍යවස්ථාදායක බලය ක්‍රියාවට නැංවීම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා නැත. ව්‍යවස්ථාදායකය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී ව්‍යවස්ථාදායක බලය, එහි කාර්යයන් මෙන්ම එම බලය ක්‍රියාවට නංවන ආකාරය පිළිබඳව, නිවැරදි අවබෝධයක් ලබා දීම අවශ්‍ය වේ.

## B කොටස

1 ප්‍රශ්නය

**1. (i) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කෙටියෙන් දක්වන්න.**

දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳව ඒකීය මතයක් ඉදිරිපත් කළ නොහැකිය. හේතුව විෂයයේ ශතවර්ෂ විසිපහක ඉතිහාසය තුළ කාලයත් සමග දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය ද විවිධ වෙනස්කම්වලට ලක්වී නවාංග රාශියක් එකතු වීමෙන් ප්‍රසාරණය වීම ය. කෙසේ නමුත් රාජ්‍යය පිළිබඳ හැදෑරීම, විෂය ක්ෂේත්‍රයේ කේන්ද්‍රීය තේමාව ලෙස තවමත් පිළිගැනෙයි. රාජ්‍යය කේන්ද්‍රීකොට ගෙන ඒ හා සම්බන්ධ නවාංගයන් දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට අයත් වන බව පොදුවේ පිළිගැනෙනු ලැබේ.

විෂය ක්ෂේත්‍රයේ අන්තර්ගතය

1. රාජ්‍යය හා ආණ්ඩුව පිළිබඳ හැදෑරීම
2. දේශපාලන න්‍යාය හා සමාජ චින්තනය
3. දේශපාලන ආයතන පිළිබඳ හැදෑරීම
4. දේශපාලන ගතිකතාව පිළිබඳ හැදෑරීම
5. නීතිය-ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, පරිපාලන නීතිය සහ පොදු නීතිය
6. රාජ්‍ය පරිපාලනය, තුලනතාත්මක පරිපාලනය සහ සංවර්ධන පරිපාලනය
7. පළාත් පාලන ක්‍රම
8. අන්තර්ජාතික දේශපාලනය, ජාත්‍යන්තර ආයතන සහ ජාත්‍යන්තර නීතිය
9. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ ඒවා ක්‍රියාවට නැංවීම
10. දේශපාලන සමාජ විද්‍යාව
11. ගැටුම් කළමණාකරණය සහ නිරාකරණය

දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුව ව්‍යාප්ත වූ චර්යාවාදී අධ්‍යයන ක්‍රමය සමඟ දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රයට නවාංග රාශියක් එකතු වී ඇත. ඒවා නම්,

1. දේශපාලන බලය
2. දේශපාලන චර්යාව
3. දේශපාලන ප්‍රභූන්
4. දේශපාලන සමාජානුයෝජනය සහ දේශපාලන සංස්කෘතිය
5. පද්ධති විශ්ලේෂණ ක්‍රමය
6. දේශපාලන නවීකරණය හා දේශපාලන සංවර්ධනය

(ලකුණු 10)

**(ii)** **දේශපාලන විද්‍යාව විද්‍යාවක් නොවන බවට ඉදිරිපත් වී ඇති මතය ගැන අදහස් දක්වන්න.**

දේශපාලන විද්‍යාව විෂය අයත් වන්නේ සමාජීය විද්‍යා විෂය පවුලට ය. සෑම සමාජ විද්‍යාවක්ම ගොඩනැගී තිබෙන්නේ මිනිසාගේ භෞතික සමාජ පැවැත්මේ විවිධ පැතිකඩ අධ්‍යයන කිරීම පදනම් කොට ගෙන ය. මේ හේතුවෙන් මිනිසා පිළිබඳව කරනු ලබන අධ්‍යයනයන් විද්‍යාත්මක ශිල්පි ක්‍රම යොදා ගනිමින් අධ්‍යයනය කිරීමට නොහැකි බව පිළිගත් පොදු මතය වේ. දේශපාලන විද්‍යාව මඟින් කරනුයේ දේශපාලන ජීවියෙකු ලෙස මිනිසාගේ දේශපාලන චර්යාව, දේශපාලන ක්‍රියාකාරකම්, දේශපාලන අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම සඳහා ගොඩනගා ඇති දේශපාලන ආයතන පද්ධතිය යනාදිය පිළිබඳව අධ්‍යයනය කිරීම ය. මේ අනුව දේශපාලන විද්‍යාව නියම විද්‍යාවක් ලෙස සැළකිය නොහැකි බවට සමහර විචාරකයන් මතවාදයක් ඉදිරිපත් කර තිබෙන අතර, තම මතය සනාථ කිරීම සඳහා ඔවුන් පහත දැක්වෙන තර්ක ඉදිරිපත් කර ඇත.

1. විෂය අධ්‍යයනය කිරීම සඳහා භාවිතයට ගැනෙන මූලධර්මවල ඒකීයභාවයක් නොමැති වීම
2. හේතු සාධක මත පිහිටා නිශ්චිත අනාවැකි පල කිරීමට නොහැකි වීම
3. පර්යේෂණාගාර විධික්‍රම යොදා ගැනීමට නොහැකි වීම
4. නිශ්චිත නියතිවාදි ගොඩ නැගීමට නොහැකි වීම

දේශපාලන විද්‍යාව නියම විද්‍යාවක් නොවනවාය යන අදහස පිළිගත් පොදු මතයක් නොවේ. සමහරු ප්‍රකාශ කරන ආකාරයට දේශපාලන විද්‍යාව නියම විද්‍යාවක් ලෙස සැළකිය හැකිය. විද්‍යාවක් යනුවෙන් අදහස් කරන්නේ යම් විෂයයක් පිළිබඳව අදාළ තත්ත්ව එකට ගළපමින්, වර්ග කරමින්, නිරීක්ෂණය කරමින්, විශ්ලේෂණය කරමින් අවසාන වශයෙන් ලබා ගන්නා දැනුම් සම්භාරය මත නියතිවාද ගොඩනැගීම නම් එම මූලධර්මය දේශපාලන විද්‍යාවට ද අදාළ වන බව පෙන්වා දෙන විචාරකයින් ඒ අනුව දේශපාලන විද්‍යාව නියම විද්‍යාවක් ලෙස සැළකිය හැකි බව පෙන්වා දේ. නමුත් සාමාජීය විද්‍යාවන් සම්බන්ධයෙන් ගොඩනගන නියතිවාද සියයට සියයක්ම නිවැරදි විය නොහැකිය. නමුත් අධ්‍යයනය කිරීම සඳහා යොදා ගන්නා විධික්‍රම විද්‍යාත්මක වේ නම් එවැනි විෂයයක් නියම විද්‍යාවක් ලෙස සැළකිය හැකි බව මෙම මතයට පක්ෂව අදහස් දක්වන අයගේ මතය වේ.

ඉහතින් දැක්වූයේ දේශපාලන විද්‍යාව නියම විද්‍යාවක් ලෙස සැළකිය හැකිද යන ප්‍රශ්නයට පක්ෂව මෙන්ම විපක්ෂවද ඉදිරිපත් වී ඇති තර්කයන්න ය. සමස්තයක් ලෙස ගත් විට පෙනී යන්නේ සමාජ විද්‍යාවක් නියම විද්‍යාවක් ලෙස සැළකීම අපහසු දෙයක් වන බව ය.

(ලකුණු 10)

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




B කොටසේ ප්‍රශ්න 4 අතුරින් වැඩිම අයදුම්කරුවන් පිරිසක් තෝරාගෙන ඇති ප්‍රශ්නය 1 ප්‍රශ්නය වන අතර, එය 85%ක් තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 32%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 08%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 08%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 32%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 60%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 2ක් ඇති අතර ඉන් කොටස් 2හිම පහසුතාව 41%ක බැගින් වේ.

II වන පත්‍රයේ B කොටසින් වැඩිම සිසුන් පිරිසක් තෝරා ගෙන ඇත්තේ මෙම ප්‍රශ්නය යි. එය 85% කි. මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත වන අතර එක් කොටසකට ලකුණු 10ක් බැගින් ලකුණු 20ක් හිමි වේ. ඉහළම ශිෂ්‍ය ප්‍රතිශතයක් මෙයට පිළිතුරු සපයනු ලැබුව ද සුළු පිරිසක් පමණක් ඉහළ ලකුණු ලබා ගෙන ඇත. එමෙන්ම වැඩි පිරිසක් ලබාගෙන ඇත්තේ 5ට වඩා අඩු ලකුණකි.

(i) කොටස සඳහා පහසුතාව 41% කි. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය පිළිබඳ සිසුන් තුළ දැනුමක් පැවතිය ද විෂය ක්ෂේත්‍රයට අදාළ කොටස් පිළිබඳව, ඒ යටතේ හැදෑරීමට ලක් කරන අනුකරුණු පිළිබඳව මෙන්ම, එහි ගතිකතාව පිළිබඳව පැහැදිළිව දක්වා නොතිබීම නිසා ඉහළ ලකුණු ලබා ගැනීම අපහසු වී ඇත. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය කාලයත් සමඟ වෙනස් වූ ආකාරයත්, එයට අයත් ක්ෂේත්‍ර යටතේ හදාරන කොටස් පිළිබඳවත් වැඩි අවධානයක් දැක්වීම අවශ්‍ය වේ. මේ සඳහා විෂය ක්ෂේත්‍රය වර්ධනය වූ ආකාරය හා ඒ ඒ ක්ෂේත්‍රවලට අයත් අනුකරුණු පිළිබඳ පැවරුම් මගින් පන්ති කාමරය තුළ වැඩි අවධානයක් යොමු කළ හැකිය.

(ii) කොටස සඳහා පහසුතාව ද 41% කි. සිසුන් විශාල සංඛ්‍යාවක් ප්‍රශ්නය තෝරා ගනු ලැබුව ද මෙම ප්‍රශ්නය පිළිබඳව නිවැරදිව තේරුම් ගෙන නොතිබිණි. මෙම ප්‍රශ්නයෙන් දේශපාලන විද්‍යාව, විද්‍යාත්මකව හැදෑරිය හැකිද යන්න අපේක්ෂා කෙරේ. මෙහිදි දේශපාලන විද්‍යාව ස්වභාවික විද්‍යාවක් හදාරන ආකාරයට හැදෑරිය නොහැකි බව පැහැදිලි කිරීමත්. සමාජ විද්‍යාවන් හදාරන ආකාරයෙන් හැදෑරිය යුතු බව පැහැදිලි කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මත කිහිපයක් පවතින බව සිසුන්ට අවබෝධ කිරීම සුදුසු ය.

## 2 ප්‍රශ්නය

2. (i) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ පුද්ගලයාගේ තත්ත්වය විමසන්න.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ලෙස සළකනුයේ දේශපාලන වශයෙන් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම මත සහ ආර්ථික වශයෙන් ධනවාදී ආර්ථික මූලධර්ම මත ක්‍රියාත්මක වන රාජ්‍ය ක්‍රමයන්ය. ලිබරල්වාදයේ හරය වන්නේ නිදහස් කැමැත්තය. මේ අනුව ලිබරල් දේශපාලන දර්ශනයේ මූලික අරමුණ වන්නේ පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂා කරමින්, ඒවා වර්ධනය කරමින් පුද්ගලයාට වරණයන් අනුව සමාජ ජීවිතය පවත්වා ගෙන යාමට උපරිම ඉඩ ප්‍රස්තා සළසා දීමය. මේ සම්බන්ධයෙන් පුද්ගලයාගේ බුද්ධිය වර්ධනය කිරීම, සුභසාධනය වර්ධනය කිරීම සහ සදාචාරය වර්ධනය කිරීම අත්‍යවශ්‍ය වන බව ලිබරල්වාදීන් පිළිගනු ලැබේ. එමෙන්ම අයිතිවාසිකම් සමානව හිමිවීම හා සමානව භුක්ති විඳීමට ඉඩ ප්‍රස්තා සැලසිය යුතු බව ලිබරල්වාදීන් පිළිගන්නා අතර ඒ මගින් පුද්ගලයින් තම පෞද්ගලික අභිවෘද්ධිය මෙන්ම පොදු සමාජ අභිවෘද්ධිය අයත් කර ගැනිම සඳහාද ක්‍රියා කළ යුතු බව ලිබරල්වාදීන් පිළිගනු ලැබේ.

ඉහත දැක්වූ පරිසරය ගොඩ නැගිය හැක්කේ රාජ්‍ය බලය හිතුවක්කාරි හා අත්තනෝමතික අයුරින් භාවිතයට ගැනිම වැළැක්වීමෙන් පමණක් බව විශ්වාස කරන ලිබරල්වාදීන් ඒ අනුව රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීම සංවරණය කිරීම අත්‍යවශ්‍යම දෙයක් බව අවධාරණය කර සිටිති. රාජ්‍ය බලය සංවරණය කිරීම සඳහා ඇති අනෙක් මාර්ගය ලෙස ලිබරල්වාදීන් දකින්නේ ආර්ථික ස්වාධීනත්වය සහතික කිරීමය. එනම් පෞද්ගලික දේපළ හිමිකම සහතික කිරීමය. මේ හා බැඳුනු අනෙක් මූලිකාංග වන්නේ නිදහස් ව්‍යවසාය හා විවෘත වෙළඳපොල ක්‍රමයයි.

අනෙක් අතට ලිබරල්වාදීන් රාජ්‍යය දකින්නේ මිනිසුන් විසින් තම පෞද්ගලික යහපත සඳහා මෙන් ම පොදු සමාජ යහපත ඇති කර ගැනීම සඳහා ගොඩනගා ගෙන ඇති පොදු සමාජ සංවිධානයක් ලෙසටය. ඇරිස්ටෝටල් ප්‍රකාශ කළ පරිදි; "මිනිසුන් රාජ්‍යය පිහිටුවා ගනු ලැබූයේ ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහාය. රාජ්‍යයේ වගකීම වන්නේ මිනිසුන්ට ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ළඟාකර දීමය."

ඉහත දැක්වූයේ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ගොඩනැගී ඇති දේශපාලන හා ආර්ථික මූලධර්මයන්ය. ඒ අනුව එවැනි රාජ්‍යයක ජීවත් වන මිනිසකුගේ තත්ත්වය පහත සඳහන් පරිදි වේ.

1. පරිපූර්ණ ලෙස මානව අයිතිවාසිකම් හා නිදහස් හිමිකම් භුක්ති විඳින්නෙකු වීම
   මෙයට දේශපාලන, ආර්ථික, සිවිල් හා සංස්කෘතික අයිතිවාසිකම් අන්තර්ගත වේ.
2. පෞද්ගලිකත්වය පදනම් කරගෙන ස්වකීය අභිවෘද්ධිය ළඟාකර ගැනීමට කටයුතු කරන්නෙකු වීම
3. පොදු සමාජ යහපත වෙනුවෙන් තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටු කරන්නෙකු වීම
4. රාජ්‍යයේ දෘඪ පලානයෙන් මිදුන නිදහස් හා ස්වාධීන පුද්ගලයෙකු වීම
   ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පුද්ගලයා යටත් වන්නේ පොදු සමාජ යහපත වෙනුවෙන් රාජ්‍ය විසින් පනවා ඇති පොදු නීතිරීතිවලට පමණි.

(ලකුණු 10)

(ii) පැසිස්ට් රාජ්‍යයක් තුළ පුද්ගලයාගේ තත්ත්වය විමසන්න.

පැසිස්ට් රාජ්‍ය ක්‍රමය ගොඩනැගී ඇත්තේ අන්ත දක්ෂිණාංගික ජාතිකවාදය හා ඒ සමඟ එකට බැඳුනු තනි පුද්ගල ආඥාදායකත්වය සහිත ඉතාම දැඩි නිලබල පද්ධතියකින් යුත් තනි දේශපාලන පක්ෂ ක්‍රමය පදනම් කරගෙනය. මෙම පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදයට මෙන්ම ලිබරල්වාදයට මුළුමණින්ම පටහැනි වන බව අමුවෙන් කිවයුතු නොවේ. මේ අනුව පැසිස්ට් රාජ්‍යයක ප්‍රධාන අංග ලක්ෂණ පහත සඳහන් ආකාරයට හඳුනා ගත හැකිය.

1. ඒක පක්ෂ නායකත්වය පදනම් කරගත් ඉතාම දැඩි අධිපතිවාදී රාජ්‍ය ක්‍රමය
2. ජනතාවගේ දේශපාලන ජීවිතය, දේශපාලන අදහස් ප්‍රකාශ කිරීම
   දේශපාලන තොරතුරු සන්නිවේදනය සහ දේශපාලන සමාජානුයෝජනය යනාදි සෑම දෙයක්ම රාජ්‍යයේ ඉතාම දැඩි පාලනයට හා මෙහෙයවීමට යටත් වීම

3. ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගීම ඉලක්ක කර ගනිමින් නිෂ්පාදන ක්‍රමය, පරිභෝජනය හා ශ්‍රමය භාවිතය යනාදිය රාජ්‍ය මඟින් මෙහෙයවීම හා පාලනය කිරීම

4. පුද්ගලයාට වඩා ජාතිය උසස් කොට සැළකීම සහ ජාතියේ පැවැත්ම රාජ්‍යයේ පැවැත්ම මත රඳා පවතිනවාය යන මතවාදය මත පුද්ගලයා රාජ්‍ය වෙනුවෙන් කැප කරවීම

5. ජාතියේ ආශාවන් පිළිබිඹු කරනවාය යන අදහස නිරූපණය කරමින් ගොඩනගා ඇති තනි පුද්ගල නායකත්වය සහිත අඥාදායකත්ව පාලන ක්‍රමය

මෙවැනි ගුණාංග සහිත පාලන ක්‍රමයක් තුළ වැදගත් වන්නේ පුද්ගලයා නොව ජාතිය හා රාජ්‍යයයි. එබැවින් ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් තුළ දැකිය හැකි පුද්ගලයා හා පෞද්ගලිකත්වය මූලිකත්වයට පත්වීම පැසිස්ට් රාජ්‍යයක් තුළ මුළුමණින්ම නැතිව යන අතර එම හේතුවෙන් මානව අයිතිවාසිකම් හා නිදහස් හිමිකම් අර්ථ විරහිත දේවල් බවට පත්වේ. ඉතාම කෙටියෙන් කියනවා නම් රාජ්‍ය පුද්ගලයා සඳහා නොව පුද්ගලයා රාජ්‍ය සඳහාය යන අදහස පදනම් කරගෙන ක්‍රියාත්මක වන පැසිස්ට් රාජ්‍ය ක්‍රමය තුළ පුද්ගලයා රාජ්‍යයේ වහලෙකු බවට පත් වේ.

(ලකුණු 10)

**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




2 ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අයදුම්කරුවන් 44%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 34%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 9%ක් ද,
ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 09%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 28%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 63%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 2 ක් ඇති අතර ඉන් පහසුතාව වැඩිම කොටස (ii) වේ. එහි පහසුතාව 42%කි. (i) කොටසේ පහසුතාව 38%කි.

II පත්‍රය B කොටසට අයත් දෙවන ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත වන අතර එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20ක් හිමි වේ.

(i) කොටස සඳහා පහසුතාව 38% කි. ලිබරල් ප්‍රජාතාන්ත්‍රවාදී රාජ්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය ඉහළ මට්ටමක පැවතිය ද එබඳු රාජ්‍යයක පුද්ගලයාගේ තත්ත්වය පිළිබඳ සාධන මට්ටම පහළ මට්ටමක පැවතුණි. එක් එක් රාජ්‍යයක් තුළ පුද්ගලයාට හිමිවන තත්ත්වය කෙරෙහි ඒ ඒ රාජ්‍යය තුළ ක්‍රියාත්මක වන දේශපාලන හා ආර්ථික මූලධර්මයන්ගේ ස්වරූපය බලපෑම් කරන බව තේරුම් ගෙන නොතිබුණි. රාජ්‍ය පිළිබඳ විවිධ න්‍යායයන් පැහැදිළි කිරීමේදී එක් එක් රාජ්‍ය ක්‍රමයක ප්‍රායෝගික ක්‍රියාකාරීත්වය සහ ප්‍රායෝගික තත්ත්වය පිළිබඳ නිවැරදි අවබෝධයක් සිසුන්ට ලබා දීම අවශ්‍ය වේ.

(ii) කොටස සඳහා පහසුතාව 42% කි. පැසිස්ට්වාදි රාජ්‍යය පිළිබඳ සිසුන්ගේ අවබෝධය ඉහළ මට්ටමක පැවතිය ද "පුද්ගලයා, රාජ්‍ය සඳහා ය" යන අදහස පදනම් කරගෙන ගොඩ නගා තිබූ පිළිතුරු පහළ මට්ටමක පැවතුණි. එක් එක් රාජ්‍ය ක්‍රමයේ ඇති මූලික ලක්ෂණ මෙන්ම ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව ද සිසුන්ට අවධාරණය කිරීම අවශ්‍ය වේ.

## 3 ප්‍රශ්නය

3. පහත දැක්වෙන ඒවායින් ඕනෑම **දෙකක්** ගැන අදහස් දක්වන්න.

(i) පෙඩරල්වාදයේ යහපත් හා අයහපත් ලක්ෂණ

1. පෙඩරල් ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ

ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය

- සන්ධීය ආණ්ඩු ක්‍රමයක් යනු අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට වෙනස් රාජ්‍ය කිහිපයක එකතුවකින් ගොඩනැගුන සුවිශේෂි රාජ්‍ය සංවිධානයක් වේ.
- මෙසේ එකතු වන්නේ එකඟතාවයකට පැමිණි පොදු කරුණු වෙනුවෙන් එක්සත්ව කටයුතු කිරීමටත් අනෙක් කරුණු වෙනුවෙන් වෙන්ව ක්‍රියා කිරීමටත් ය.
- මෙයාකාරයට ගොඩනැගෙන පොදු එක්සත් භාවය ආරක්ෂා කොට පවත්වගෙන යාම සඳහා ශක්තිමත් හා ස්ථාවර බන්ධනයක් අවශ්‍ය වන අතර ඒ සඳහා ඇති හොඳම ක්‍රමය ලිඛිත ව්‍යවස්ථාවක් වේ.
- එක්සත් වීම කෙරෙහි බලපෑ හේතු සහ ඉටුකර ගැනීමට අපේක්ෂා කරන ඉලක්ක මොනවාද හා ඒවා ඉටුකර ගන්නේ කෙසේද යන්න පිළිබඳව ලිඛිත ව්‍යවස්ථාවක් මගින් පැහැදිලිව දැක්වීමට පුළුවන් වේ.
- අනෙක් අතට සන්ධීය ක්‍රමයට එළඹෙන කොටස් ඒකක අතර අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩනගා පවත්වා ගෙනයාම සම්බන්ධයෙන් ද ව්‍යවස්ථාව උපකාරී වේ.
- මීළඟට වැදගත් වන්නේ ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය යි. එනම් ව්‍යවස්ථාව මූලික නීතිය ලෙස සැලකීම, රාජ්‍ය පාලන කටයුතු ව්‍යවස්ථාවට අනුව කරගෙන යාම, මධ්‍යම ආණ්ඩුව මෙන්ම කොටස් රාජ්‍යයන් ද ව්‍යවස්ථාවට ගරු කිරීම, පටු අවශ්‍යතා සඳහා ව්‍යවස්ථාව වෙනස් නොකිරීම, ව්‍යවස්ථාව වෙනස් කිරීම පාර්ශවයන්ගේ පොදු අභිමතය හා අනුමැතිය අනුව කිරීම මේ සම්බන්ධයෙන් වැදගත් වේ.
- ව්‍යවස්ථාවේ උත්තරීතර භාවය කරුණු දෙකක් මත රඳා පවතී.

  (අ) අනම්‍යභාවය

  (ආ) අධිකරණ විවරණ බලය
  මෙයින් පළමු කරුණෙන් අදහස් කරන්නේ ව්‍යවස්ථාව සංශෝධනය කිරීමේ පිළිවෙත දැඩි එකක් විය යුතුය යන්නය. දෙවෙනි කරුණෙන් අදහස් කරන්නේ ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමට අධිකරණයට බලය තිබිය යුතු බවය.

නිශ්චිත ලෙස බලතල බෙදා දැක්වීම

- සන්ධීය ආණ්ඩුක්‍රමයට එළඹීමේ පදනම වන්නේ ජාතික වශයෙන් වැදගත් කරුණු සම්බන්ධයෙන් එක්ව ක්‍රියා කිරීමටත්, ප්‍රාදේශීය වශයෙන් වැදගත් කරුණු සම්බන්ධයෙන් වෙන්ව ක්‍රියා කිරීමටත් ඇති කර ගන්නා එකඟතාවය යි.
- මේ අනුව ජාතික වශයෙන් වැදගත් වන කරුණු මධ්‍යම ආණ්ඩුවට හිමිවන ආකාරයටත්, ප්‍රාදේශීය වශයෙන් වැදගත් වන කරුණු සන්ධීය කොටස් ඒකකවලටත් හිමි වන අයුරින්, පැහැදිලි හා නිශ්චිත ලෙස බලතල බෙදා වෙන් කළ යුතු අතර එසේ බලතල බෙදා වෙන් කිරීමක් කළහොත් පමණක් සන්ධීය ආණ්ඩුක්‍රමයක් ගැටුම්වලින් තොරව පවත්වාගෙන යා හැකි වේ.
- සන්ධීය ක්‍රමයක බලතල බෙදන ක්‍රම තුනක් තිබේ.
  (අ) මධ්‍යම ආණ්ඩුවේ බලතල දක්වා ඉතිරි බලතල කොටස් රාජ්‍යයන්ට අත් හැරීම

  (ආ) කොටස් රාජ්‍යයන්ගේ බලතල දක්වා ඉතිරි බලතල මධ්‍යම ආණ්ඩුවට අත්හැරීම

  (ඇ) මධ්‍යම, කොටස් ඒකක හා සමගාමී වශයෙන් ලැයිස්තු තුනක් යටතේ බලතල බෙදීම

- මේ කුමණ ආකාරයකට බලතල බෙදුවද ජාතික වශයෙන් වැදගත් වන ජාතික ආරක්ෂාව, යුද්ධය හා සාමය, ත්‍රිවිධ හමුදා පාලනය, මුදල් අච්චු ගැසීම හා නිකුත් කිරීම, අවි නිෂ්පාදනය, විදේශ සම්බන්ධතා, කිරුම්-මිනුම්, තීරු බදු යනාදි විෂයන් මධ්‍යම ආණ්ඩුවට පැවරිය යුතුය.

නිදහස් හා ස්වාධීන අධිකරණයක පැවැත්ම

- සන්ධීය ආණ්ඩු ක්‍රමයක් ස්වභාවයෙන්ම ගැටුම් සහිත ආණ්ඩුක්‍රමයක් වේ. මෙම ගැටුම් එක්කෝ මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාන්ත රාජ්‍යයන් අතර ඇති විය හැකිය. නැතිනම් ප්‍රාන්ත රාජ්‍යයන් අතර ඇති විය හැකිය.
- මෙම ගැටුම් ව්‍යවස්ථාවට අනුව විසඳීමේ බලය සහිත අධිකරණයක් සන්ධීය ආණ්ඩුක්‍රමයක් සඳහා අවශ්‍යම දෙයක් වන්නේය.

කොටස් රාජ්‍යයන්ට සමානව සැලකීම

- සන්ධීය ආණ්ඩුක්‍රමයක් වූ කලි විවිධත්වය මෙන්ම ඒකීයත්වයද නිරූපණය කරන සංකීර්ණ ආණ්ඩු ක්‍රමයක් වේ.
- විවධත්වය නිරූපණය වන්නේ කොටස් රාජ්‍යයන් තුළිනි. මේවා සම්පත් අතින්, ජනගහනය අතින්, සංවර්ධනය අතින් මෙන්ම වාර්ගික, භාෂා, ආගමික යනාදි වශයෙන් විවිධ විය හැකිය.
- මේ කුමන වෙනස්කමක් තිබුණද කොටස් රාජ්‍යයන්ට සමානව සැළකිය යුතු අතර අසමාන ලෙස සැලකුවහොත් සන්ධීය ක්‍රමය බිඳ වැටිය හැකිය.

2. සන්ධීය ක්‍රමයේ යහපත් ලක්‍ෂණ
   (අ) විවිධත්වය තුළින් ඒකීයත්වය අයත් කර ගැනිමට හැකිවීම
   මෙයින් අදහස් කරන්නේ වාර්ගික පදනම මත ඇතිවන භේද යටපත් කරමින් එක් රටක්, එක් ජාතියක් යන සිද්ධාන්තය පදනම් කරගෙන ජාතිකත්වය ගොඩ නැගීමය.
   (ආ) විශාල රටක් සංවර්ධනය කරා ගෙනයාමට උපකාරීවීම
   (ඇ) මධ්‍යම ආණ්ඩුව හිතුවක්කාරි ලෙස හැසිරීම වළක්වා ගැනිමට හැකිවීම
   (ඈ) විවිධත්වයක් සහිත ස්වකීයම වූ පැවැත්ම සහතික කර ගැනීමට අපහසු කුඩා සහ දුබල රාජ්‍යයන්ගේ පැවැත්ම සහතික කර ගැනිමට හැකිවීම
   (ඉ) ස්වයං පාලනය, පෞද්ගලික නිදහස සහ සාමුහික සෞභාග්‍ය ඇතිකර ගැනීමට හැකිවීම
3. සන්ධීය ආණ්ඩු ක්‍රමයේ අයහපත් ලක්ෂණ
   (අ) ද්විත්ව පාලන ක්‍රමය හේතුකොට ගෙන ගැටුම් ඇතිවීම, කාර්යක්‍ෂමතාව දුබල වීම සහ අනවශ්‍ය කාල පමාව ඇතිවීම
   (ආ) සාර්ථක විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාවට නැංවිය නොහැකිවීම
   (ඇ) විවිධත්වය එසේම පවත්වා ගෙනයාමට ලැබෙන ඉඩකඩ හේතුකොට ගෙන වාර්ගික ප්‍රශ්න ඇතිවීමට ඇති ඉඩකඩ ඉහළ මට්ටමක තිබීම
   (ඈ) පරිපාලන ඒකීයත්වය ගොඩනගා ගැනීමට බැරිවීම
   (ඉ) වියදම් අධික ක්‍රමයක් වීම

(ලකුණු 10)

(ii) සමානුපාතික නියෝජන ක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ

1. සමානුපාතික නියෝජන ක්‍රමය - යහපත් ලක්ෂණ

(අ) සෑම ප්‍රබල මතයකටම නියෝජනය හිමිවීම

(ආ) අප්‍රධාන ජන කොටස්වලට වුවද නියෝජනය ලබාගත හැකිවීම

(ඇ) ඡන්ද අපතේ යාම අවම වීම

(ඈ) ඡන්දයක් ඉදිරියේ ඇති වරණය පුළුල් වීම

(ඉ) ප්‍රධාන දේශපාලන පක්ෂවල නායකත්ව ආධිපතිත්වය සීමාවීම

(ඊ) අසමානුපාතික නියෝජනය අවම වීම

(උ) ඡන්දදායකයින්ගේ බලපෑමෙන් යම් ප්‍රමාණයකට නිදහස් වීමට නියෝජිතයන්ට හැකිවීම

2. අයහපත් ලක්ෂණ

(අ) බහු පක්ෂ ක්‍රමයක් ඇතිවීමට හේතු කාරක වීම

(ආ) සභාග ආණ්ඩු බිහිවීම සහ ඒවා දුර්වල ආණ්ඩු වීම

(ඇ) දේශපාලන පක්ෂ නායකත්වයේ බලය වර්ධනය වීම

(ඈ) ඡන්දදායකයා සහ මන්ත්‍රීවරයා අතර පවතින සම්බන්ධතාව දුරස්ථ වීම නිසා ඡන්දදායකයාට ඇති වගකීමෙන් පිටපැන යාමට මන්ත්‍රීවරයාට හැකිවීම

(ඉ) අතුරු මැතිවරණ නොපැවැත්වීම හේතුවෙන් ජනතාවගේ දේශපාලන සහභාගීත්වය අඩුවීම් සහ කාලීන මහජන මතය විධිමත් ලෙස ආණ්ඩුව කරා නොයාම

මෙම නියෝජන ක්‍රම දෙක අතුරින් ප්‍රජාතන්ත්‍රවාදයට වඩාත් හිතකර ක්‍රමය ලෙස සළකන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය යි.

(ලකුණු 10)

(iii) ජනාධිපති ආණ්ඩුක්‍රමයේ යහපත් හා අයහපත් ලක්ෂණ

1. යහපත් ලක්ෂණ

(අ) ආණ්ඩුවේ ස්ථාවරභාවය හේතුව ශක්තිමත්, ප්‍රබල සහ ස්ථාවර විධායකයක් සහිත ආණ්ඩුක්‍රමයක් වීම ය. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විධායකය ව්‍යවස්ථාදායකයේ ඍජු පාලනයට හසු නොවන අතර, ධූරයට පත්වූ පසු ධූරයෙන් ඉවත් කළ හැක්කේ දෝෂාභියෝගයකින් පමණි. නමුත් එය පහසු කාර්යයක් නොවේ.

(ආ) විධායක කාර්යක්ෂමතාවය මේ කෙරෙහි බලපාන හේතු දෙකක් තිබේ. ප්‍රථම හේතුව වන්නේ විධායකය තනි පුද්ගලයෙකුගෙන් සමන්විත වීම ය. දෙවැන්න වන්නේ ව්‍යවස්ථාදායකයේ ඍජු පාලනයෙන් මිදී විධායක බලතල ක්‍රියාවට නැංවීමට හැකි වීම ය.

(ඇ) බහුවිධ සමාජ ක්‍රමයක් සහ ඒ ආශ්‍රිතව පැන නගින බහුපක්ෂ ක්‍රමයක් සහිත රටවල් සඳහා වඩාත්ම යෝග්‍ය ආණ්ඩුක්‍රමය වීම හේතුව බහුපක්ෂ ක්‍රමය යටතේ ඇතිවිය හැකි ආණ්ඩු අස්ථාවර භාවය එමඟින් වළක්වා ගැනීමට හැකි වීම ය.

(ඈ) හදිසි අවස්ථා සහ දේශපාලන අර්බුදවලට වඩාත් ශක්තිමත් ලෙස මුහුණ දීමට හැකි වීම හේතුව ශක්තිමත් තනි පුද්ගල විධායකයක් තිබීම ය.

(ඉ) දේශපාලන පක්ෂ ක්‍රමයේ ක්‍රියාකාරීත්වයට වැදගත් තැනක් නොලැබීම හේතුව දේශපාලන පක්ෂවලින් තොරව වුවද එම ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවිය හැකි වීම ය.

2. අයහපත් ලක්ෂණ

(අ) ප්‍රජාතන්ත්‍රිකභාවයෙන් අඩුවීම මේ කෙරෙහි බලපා තිබෙන්නේ නිලයේ ස්ථාවරභාවය, වගකීමෙන් පිටපැන යාමට හැකි වීම, ව්‍යවස්ථාදායකයේ ඍජු පාලනයට හසු නොවීම, නිලයට හිමිවන අධි බලතල ප්‍රමාණය යනාදි කරුණු ය.

(ආ) විධායකය හා ව්‍යවස්ථාදායකයා අතර ගැටුම් ඇතිවීමේ ඉඩකඩ ඉහළ මට්ටමක පැවතීම මේ කෙරෙහි එක් අතකින් බලපාන්නේ විධායකය හා ව්‍යවස්ථාදායකය යා කරන්නා වූ ඍජු සම්බන්ධීකාරකයෙකු නොමැති වීම ය. අනෙක් අතින් බලපාන්නේ පක්ෂ පදනම මත විධායකය එක් පක්ෂයකිනුත්, ව්‍යවස්ථාදායකය වෙනත් පක්ෂයකිනුත් නියෝජනය වන විට ඇතිවන නොගැළපීමය.

(ඇ) දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය අඩපන වීම එක් අතකින් බලන විට මෙය යහපත් දෙයක් ලෙස පෙනී ගියද අනෙක් අතින් බලනවිට අයහපත් දෙයක් ද වේ. හේතුව දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය අඩපන වනවිට බහුවිධ සමාජ ආශාවන් නියෝජනය වීම යටපත් වීම ය.

(ඈ) ව්‍යවස්ථාදායකයේ තත්ත්වය දුර්වල වීම මෙයට හේතුව ව්‍යවස්ථාදායකය නොසළකා හරිමින් ක්‍රියා කිරීමට ජනාධිපති ආණ්ඩුක්‍රමය යටතේ විධායකයට හැකි වීම ය.

(ඉ) විරුද්ධ පක්ෂයේ තත්ත්වය හිනවීම ඉහත දැක්වූ (ඈ) කරුණේ තවත් ප්‍රතිඵලයක් ලෙස මෙය පෙන්වාදිය හැකිය.

(ලකුණු 10)

(iv) මානව අයිතිවාසිකම් හා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධික්‍රම

1. මානව අයිතිවාසිකම්

පිරිපුන් සමාජ ජීවිතයක් ගත කිරීම සඳහා මිනිසුන්ට අවශ්‍යයෙන්ම තිබිය යුතුයැයි පිළිගැනෙන සමාජ හිමිකම් අයිතිවාසිකම් ලෙස හඳුන්වා දිය හැකිය. විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනයේ දැක්වෙන ආකාරයට, “සියලුම මිනිසුන් නිදහස්ව උපත ලබා ඇත. ඔවුන් ගරුත්වයෙන් හා අයිතිවාසිකම් අතින් එක හා සමාන වන්නේ ය. යුක්තිය හා හෘද සාක්ෂිය ඔවුන් සියලු දෙනාට උරුම වී ඇත. මිනිසුන් එකිනෙකා සමඟ ක්‍රියා කළ යුත්තේ සහෝදරත්වය පදනම් කොටගෙන ය.” මොරිස් ක්‍රැන්ස්ටන් දක්වා තිබෙන ආකාරයට “මානව අයිතිවාසිකම් යනු විශ්වීය සදාචාරාත්මක අයිතියකි. එය සෑම ස්ත්‍රියකටම හා පුරුෂයෙකුටම සියලු කල්හි සෑම ස්ථානයකදීම හිමිවිය යුතු, සාධාරණත්වය බරපතල ලෙස කඩ කිරීමකින් මිස කිසිවෙකුට අහිමි කළ නොහැකි, සෑම මනුෂ්‍යයෙකුටම මනුෂ්‍යයෙකුවීම නිසාම අදාළ වන දෙයකි.” මෙම අර්ථකථන මගින් ප්‍රකාශ වන ආකාරයට අයිතිවාසිකම් වූ කලී ගෞරවණීය සමාජ ජීවිතයක් පවත්වා ගෙන යාමට, පෞද්ගලිකත්වය පරිපූර්ණ ලෙස වර්ධනය කර ගැනීමට සහ සමාජ සාධාරණත්වය එක සේ අයත් කර ගැනීමට සෑම මිනිසෙකුටම එක හා සමාන ලෙස හිමිවිය යුතු සමාජ හිමිකම් ලෙස හඳුන්වා දිය හැකිය. වෙනත් ආකාරයකට පවසන්නේ නම් ජීවිතය පවත්වා ගෙන යාමට, මනා කායික හා මානසික ශක්තියක් ගොඩනගා ගැනීමට, නිදහස භුක්ති විඳීමට සහ අනන්‍යතාව පවත්වා ගෙන යාමට අවශ්‍ය සමාජ හිමිකම් මානව අයිතිවාසිකම් ලෙස හඳුන්වා දිය හැකිය.

මෙම සමාජීය හිමිකම් හෙවත් අයිතිවාසිකම් පුළුල් පදනමක් මත සිවිල් සහ දේශපාලන වශයෙන් කොටස් දෙකකට බෙදා ඇත. සිවිල් අයිතිවාසිකම් ගනයට ආර්ථික, සංස්කෘතික, සමාජීය, ආගමික යනාදි අයිතිවාසිකම් අයත් වන අතර සිවිල් ජීවිතය පරිපූර්ණ කර ගැනීම උදෙසා මිනිසාට මෙම අයිතිවාසිකම් අවශ්‍ය වේ. තමා ජීවත් වන දේශපාලන ක්‍රමය තුළ දේශපාලන භූමිකා සක්‍රිය ලෙස රඟ දැක්වීම සඳහා මිනිසුන්ට දේශපාලන අයිතිවාසිකම් අවශ්‍ය වන අතර, දේශපාලන පක්ෂ පිහිටුවා ගැනීම ඒවාට සම්බන්ධවීම, මැතිවරණවලට ඉදිරිපත් වීම,

ඡන්දය ප්‍රකාශ කිරීම, ආණ්ඩුව විවේචනය කිරීම, රාජ්‍ය සේවයට පත්වීම යනාදි අයිතිවාසිකම් දේශපාලන අයිතිවාසිකම් ගනයට අයත් වේ.

අයිතිවාසිකම් පිළිබඳව සාකච්ඡා කිරීමේදී සදාචාරාත්මක අයිතිවාසිකම් සහ නීතිමය අයිතිවාසිකම් අතර පවතින වෙනස කෙරෙහි ද අවධානය යොමු කළ යුතු ය. සදාචාරාත්මක අයිතිවාසිකම් වූ කලි මිනිසුන් විසින් හිමිකම් කියනු ලබන අයිතිවාසිකම් වන අතර නිතිමය අයිතිවාසිකම් වූ කලී රාජ්‍යයේ නිති මඟින් පිළිගත් අයිතිවාසිකම් වේ. සදාචාරත්මක අයිතිවාසිකම් ස්වභාවික අයිතිවාසිකම් හා මිනිස් අයිතිවාසිකම් ලෙස ද හඳුන්වන අතර ජෝන් ලොක්ගේ සිට විශ්ව මානව අයිතිවාසිකම් ප්‍රකාශනය ප්‍රකාශයට පත් කරන තුරු අයිතිවාසිකම් පිළිබඳව කථා කිරීමේදී පදනම ලෙස යොදා ගත්තේ මෙම සංකල්පය යි. මෙම සංකල්පයෙන් අවධාරණය කරන්නේ මිනිසුන්ට උපතින්ම අයිතිවාසිකම් හිමිවෙන බව සහ රාජ්‍ය විසින් පනවන නිති මඟින් එම අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා රාජ්‍ය ක්‍රියා කළ යුතු බව ය. අයිතිවාසිකම් පිළිබඳ නීතිමය ගුරුකුලය විසින් සදාචාරත්මක අයිතිවාසිකම් මතවාදය ප්‍රතික්ෂේප කරන අතර ඔවුන් එය හඳුන්වන්නේ උටෝපීය සංකල්පයක් ලෙස ය. ඔවුන්ගේ අදහස වන්නේ අයිතිවාසිනම් ලෙස පිළිගත හැක්කේ රාජ්‍ය නීතිය මඟින් පිළිගන්නා අයිතිවාසිකම් පමණක් බවය. අයිතිවාසිකම් පිළිබඳව මෙම මතවාද දෙක අතර පවතින වෙනස තාමත් නොවිසඳී පවතී.

2. මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ විධික්‍රම

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අයිතිවාසිකම් සහතික කිරීම

අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නූතන රාජ්‍යයන් විසින් යොදා ගැනෙන ප්‍රධානම ක්‍රමය ලෙස මෙය හඳුන්වා දිය හැකිය. මෙමඟින් කරණුයේ රාජ්‍ය පිළිගන්නා අයිතිවාසිකම් අන්තර්ගත ප්‍රකාශනයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුල් කිරීම ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රටේ මූලික නිතිය ලෙස පිළිගැනෙන බැවින් එමඟින් අයිතිවාසිකම් ආරක්ෂා කරන විට අයිතිවාසිකම්වලට නීතිමය ආවරණයක් සැපයේ. එමෙන්ම අයිතිවාසිකම්වලට ගරු කිරීමට ඉතා දැඩි මානසික පෙළඹුමක් එමඟින් සැපයේ.

(ආ) අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම අධිකරණයට පැවරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ අයිතිවාසිකම් අන්තර්ගත කිරීම පමණක් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. අයිතිවාසිකම් භුක්ති විඳීම ප්‍රායෝගික යථාර්ථයක් වීමට නම් ඒවා නෛතිකව බලාත්මක කිරීමට ද හැකිවිය යුතුය. එවිට අයිතිවාසිකම් කඩ වූ විටක අගතියට පත් පාර්ශවයට, සහනයක් ලබා ගත හැකි වේ. මේ සඳහා ඇති එකම ක්‍රමය වන්නේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීම අධිකරණයට පැවරීම ය. එසේ වූ විට යම් අයිතිවාසිකමක් කඩ වු විටක අධිකරණය හරහා සහන ලබා ගැනීමට පුරවැසියන්ට හැකි වේ.

(ඇ) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම

අයිතිවාසිකම් කඩ වූ විට පුරවැසියන්ට නඩු කීමට සිදුවන්නේ රාජ්‍ය සමඟ ය. එවැනි තත්වයක් තුළ යුක්තිය සාධාරණ හා අපක්ෂපාති ලෙස විනිශ්චය කිරීමට නම් අධිකරණයට බියෙන් හා සැකයෙන් තොරව නිදහසේ ක්‍රියාත්මක වීමේ හැකියාව තිබිය යුතු ය. එබැවින් අධිකරණයේ ස්වාධීනත්වය අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අත්‍යවශ්‍යම කොන්දේසියක් වන්නේ ය.

(ඈ) නීතියේ ආධිපත්‍යය පිළිගැනීම

නිතිය ඉදිරියේ සමානාත්මතාව මෙයින් අදහස් වේ. ජාතිය වර්ගය කුලය භාෂාව ආගම හා ස්ත්‍රී - පුරුෂ යනාදි වෙනස්කම් පදනම් කොට ගෙන පුද්ගලයින් විශේෂිකරණය නොකිරීම ය. එමෙන්ම එක් සමාජ පංතියකට හෝ පුද්ගල කණ්ඩායමකට හෝ විශේෂ වරප්‍රසාද ලබා නොදීම ය. වඩාත් විශේෂ කොට කියනවා නම් පාලිතයා මෙන්ම පාලකයා ද නීතිය ඉදිරියේ එක හා සමාන තත්ත්වයකින් සැලකීම ය.

(ඉ) රාජ්‍ය සේවය සහ පොලීසිය ස්වාධීනව පවත්වා ගෙන යාම

රාජ්‍ය විධායක බලය ක්‍රියාවට නංවන්නේ සිවිල් සේවය සහ පොලීසිය හරහා ය. රාජ්‍ය වෙනුවෙන් මහජනතාව සමඟ සෘජුවම කටයුතු කරන්නේ මෙම ආයතන දෙක ය. මානව හිමිකම් කඩ වීම සම්බන්ධයෙන් වැඩියෙන්ම චෝදනා එල්ල වන්නේ මෙම ආයතන දෙකට ය. එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම ආයතන දෙක දේශපාලනිකරණය වීම ය. එබැවින් එම ආයතන දෙක දේශපාලන මැදිහත්වීම්වලින් තොර අපක්ෂපාතී සහ ස්වාධීන ආයතන ලෙස පවත්වා ගෙන යාම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍යම දෙයක් වේ.

(ඊ) ආර්ථික සාධාරණත්වය

ආත්ම ගරුත්වය ආරක්ෂා කරගනිමින් තෘප්තිමත් කායික හා සමාජීය ජීවිතයක් ගත කිරීමට ප්‍රමාණවත් වන අයුරින් ආර්ථික අවශ්‍යතා සහතික කිරීම මෙයින් අදහස් වේ. ආර්ථික වශයෙන් දැඩි අසමානතාවක් පවතින විට පීඩිත කොටස්වලට අයිතිවාසිකම් නිසි ලෙස භුක්ති විඳිය නොහැකි ය. එබැවින් සෑම පුරවැසියෙකුටම තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය ආර්ථික කොන්දේසි සහතික කිරීම රජයේ වගකීම වේ.

(උ) අයිතිවාසිකම් පිළිබඳව දැනුවත් කිරීම

අයිතිවාසිකම් පිළිබඳ ව දැනුවත් නොවීම අයිතිවාසිකම් නිසි ලෙස භුක්ති විඳීම සම්බන්ධයෙන් පවතින ප්‍රධානම බාධකයක් වන අතර අයිතිවාසිකම් කඩ කිරීම කෙරෙහි ද එය එයාකාරයෙන් බලපානු ලැබේ. එබැවින් අයිතිවාසිකම් පිළිබඳව පුරවැසියන් දැනුවත් කිරීම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍යයෙන්ම කළයුතු දෙයක් වේ.

(ඌ) නිදහස් හා ස්වාධීන ජන මාධ්‍යයක් තිබීම

අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනමාධ්‍යයන්ට අතිශය පුළුල් වගකීමක් හිමි වේ. එක් අතකින් අයිතිවාසිකම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සම්බන්ධයෙන් මෙන්ම අනික් අතින් අයිතිවාසිකම් කඩ වූ විට ඒ සම්බන්ධයෙන් හඬ නැගීම යන ද්විත්ව කාර්යයන් ඉටු කිරීම පිළිබඳව ජනමාධ්‍යයන්ට පුළුල් කාර්ය භාරයක් ඉටු කළ හැකිය. මේ සඳහා නිදහස් ස්වාධීන සහ අපක්ෂපාතී ජනමාධ්‍යයක් තිබිය යුතු අතර එවැනි ජනමාධ්‍යයක පැවැත්ම තහවුරු කිරීම රජයේ වගකීමක් වේ.

මේවාට අමතරව ඔම්බුඩ්ස්මන් තනතුර හා මානව හිමිකම් කොමිසම වැනි ආයතන පිහිටුවීම යනාදිය හරහා ද මානව හිමිකම් ආරක්ෂා කිරීමට නූතන රාජ්‍යයන් පියවර ගෙන ඇත.

(ලකුණු 10)

(v) යහපාලනය

ආර්ථික සම්පත් හා මානව සම්පත්වලින් හිඟයක් නොමැති වුවද තුන්වන ලෝකයේ රටවල්වල ආර්ථික සංවර්ධනය මන්දගාමී වීම සහ සමාජ සාධාරණත්වය බිඳ වැටීම යන ප්‍රශ්නවලට බලපා ඇති හේතු සාධක මොනවාද යන්න පිළිබඳව 1980 දශකයෙන් පසු කාලය තුළ ඇතිවන කථිකාවකින් ඉස්මතු වූ දෙයක් ලෙස යහපාලනය පිළිබඳ සංකල්පය හඳුන්වා දිය හැකිය. මෙම රටවල් සතු ආර්ථික හා මානව සම්පත් නිසියාකාරව කළමණාකරණය නොකිරීම හේතු කොට ගෙන ආර්ථික සංවර්ධනය මන්දගාමී වී ඇති බවත් එහි ප්‍රතිඵලයක් ලෙස සමාජ සාධාරණත්වය ගොඩ නැගීම ද බිඳ වැටී ඇති බවත් එම කතිකාවතේ දි හෙළි විය. මෙයට බලපා ඇති හේතු කාරක ලෙස අනවශ්‍ය ආකාරයෙන් බලය මධ්‍යගත වීම, රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂම භාවය, රාජ්‍ය සේවය දේශපාලනීකරණය වීම, රාජ්‍ය ප්‍රතිපත්ති තීරණය කිරීම හා ක්‍රියාවට නැංවීම කෙරෙහි ජනතා සහභාගීත්වය නොමැතිවීම, අල්ලස් හා දූෂණය ඉහළ යාම, රාජ්‍ය පාලකයින් වගකීමෙන්

තොරවීම යනාදිය වේ. තුන්වන ලෝකයේ රටවල් මුහුණ දී ඇති මෙම අර්බුදයෙන් ගොඩ ඒමට නම් ඉහත දක්වන ලද දුර්වලතාවලින් මිදීමේ අවශ්‍යතාව අවධාරණය කෙරෙන අතර යහපාලනය පිළිබඳ සංකල්පය ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වූ එක් විසඳුමක් විය. එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩ සටහන (UNDP) මගින් එළිදක්වන ලද යහපාලනය පිළිබඳ සංකල්පය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහශ්‍රක අරමුණ මගින් ද යළිත් වරක් අවධාරණය කෙරිණි. ඉන් අනතුරුව ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, ට්‍රාන්ස්පේරන්ස් ඉන්ටර්නැෂනල් ආයතනය හා සංවර්ධනය සඳහා දායක වන වෙනත් ආයතන විසින් ද යහපාලනය පිළිබඳ සංකල්පය ඉදිරියට ගෙන ඒමට කටයුතු කළේ ය. මේ සෑම ආයතනයක් විසින්ම යහපාලනය සංකල්පය පිළිබඳව අර්ථකතන සපයා ඇත. ඒවා අතර යම් යම් වෙනස්කම් දැකිය හැකි වුවද පොදුවේ ගෙන බලන විට එම අර්ථකතන මඟින් අවධාරණය කරන මූලික කරුණු එක හා සමාන වේ. ඒවා පහත සඳහන් පරිදි ය.

(අ) සහභාගීත්වය

මෙයින් අදහස් කරන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ ක්‍රියාවට නැංවීමේ දී ජනතා සහභාගීත්වය වර්ධනය කළ යුතු බව ය. වෙනත් ආකාරයට කියනවා නම් සහභාගිත්ව සංවර්ධන ක්‍රියාදාමය වඩාත් ශක්තිමත් කළයුතු බව ය. මෙහිදී ජනතාව පමණක් නොව සිවිල් සංවිධානවලට විශේෂයෙන්ම රාජ්‍ය නොවන සංවිධානවලට සක්‍රිය ක්‍රියාකලාපයක් ඉටු කිරීමට අවස්ථා ව දිය යුතු ය. මෙය කළ හැක්කේ මධ්‍යම ආණ්ඩුවේ බලය විමධ්‍යගත කිරීමෙනි. එමගින් පළාත් පාලන ආයතන ශක්තිමත් කොට ඒවායේ ජනතා සහභාගිත්වය පුළුල් කළ යුතුය.

(ආ) නීතියේ ආධිපතිත්වය

යහපාලනයේ අත්‍යවශ්‍ය කොන්දේසියක් ලෙස නිතියේ ආධිපතිත්වය දක්වා ඇත. නීතියට මිනිසුන් ගරු කිරීමට හා අවනත වීමට පෙළඹෙන්නේ රටේ සියලු දෙනාම විසින් නීතියේ උත්තරීතරභාවය පිළිගන්නේ නම් පමණි. එමෙන්ම නීතිය ඉදිරියේ සියලු දෙනාම සමාන වනවාය සහ නීතියේ සමාන ආරක්ෂාව සමාන අයුරින් සියලු දෙනාටම හිමිවනවාය යන විශ්වාසය මිනිසුන් තුළ ඇති වන්නේ නීතියේ ආධිපතිත්වය ක්‍රියාත්මක වන්නේ නම් පමණි. මේ හා බැඳී පවතින අනෙක් කොන්දේසිය වන්නේ අධිකරණයේ ස්වධීනත්වයයි.

(ඇ) වගකීම

මෙයින් අදහස් වන්නේ රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නංවන අය ජනතාවට වගකිව යුතු බවය.

(ඈ) විනිවිදභාවය

රාජ්‍ය මුදල් විය පැහැදම් කරන ආකාරය විවෘත භාවයකින් කළ යුතුය යන්න මෙයින් අදහස් වේ. සමාජ විගණනය මේ සම්බන්ධයෙන් වැදගත් වේ. එනම් රාජ්‍ය විය පැහැදම් පිළිබඳව ජනතාවට දැන ගැනිමට ඇති අයිතිය හා ඒ පිළිබඳව ප්‍රශ්න කිරීමට ජනතාවට ඇති අයිතිය මෙමගින් අවධාරණය කෙරේ.

(ඉ) ප්‍රතිචාරාත්මක බව

මෙයින් අදහස් කරන්නේ ජනතා අවශ්‍යතාවන්ට පාලකයින් ඇහුම්කන් දීම, සැලකිල්ලට ගැනීම සහ හැකිතාක් දුරට සෑම අදහසක්ම නියෝජනය වන පරිදි අවසාන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාවට නැංවීමය.

(ඊ) සහමිතිකභාවය

සියලු දෙනාගේ ම අදහස්වලට ඇහුම්කන් දීම, සැළකිල්ලට ගැනීම සහ හැකිතාක් දුරට සෑම අදහසක්ම නියෝජනය වන පරිදි අවසාන ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාවට නැංවීම මෙයින් අදහස් වේ.

(උ) කාර්යක්ෂමතාව සහ ප්‍රතිඵලදායිභාවය

සම්පත් කාර්යක්ෂම හා ප්‍රතිඵලදායි අයුරින් භාවිතයට ගැනීම මෙයින් අදහස් වේ. වෙනත් අයුරකින් ප්‍රකාශ කෙරේ නම් සම්පත් අපතේ යාම වළක්වා ගැනීමය.

(ඌ) සාධාරණත්වය

සමාජ ධනය සාධාරණ අයුරින් සියලු දෙනා අතර බෙදා හැරීමට කටයුතු කිරීම මෙයින් අදහස් වේ. සමස්තයක් ලෙස ගත් විට යහපාලනයෙන් අදහස් කරන්නේ වංචා සහ දූෂණය නැති කිරීමය. සුළු ජන කොටස්වලට ඇහුම්කන් දී සාධාරණය ඉටු කිරීමය. වඩාත් පුළුල් ජනතා සහභාගිත්වයක් සහිතව ආර්ථික සංවර්ධනය වේගවත් කරමින් ජනතා සුභ සාධනය ඉහළ නැංවීමයි.

(ලකුණු 10)

**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




B කොටසින් දෙවන වැඩිම තෝරා ගැනීමක් ඇති ප්‍රශ්නය 3 වන අතර එම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 58%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 09%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 09%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 37%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 54%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 5ක් ඇති අතර ඉන් (i) කොටසේ පමණක් පහසුතාව 42%ක් වේ. එය වැඩිම පහසුතාව වේ. ඉතිරි කොටස්වල පහසුතා 40%ට අඩුය. පහසුතාව අඩුම කොටස (v) වේ. එහි පහසුතාව 25%කි.

B කොටසේ තුන්වන ප්‍රශ්නය සඳහා කොටස් පහකි. එයින් ඕනෑම දෙකකට පිළිතුරු සැපයිය යුතු අතර එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20ක් හිමි වේ.

(i) කොටසේ පහසුතාව 42% කි. ප්‍රශ්නයෙන් අපේක්‍ෂා කරන මූලික පිළිතුර වන්නේ පෙඩරල් වාදයේ යහපත් හා අයහපත් ලක්‍ෂණ වේ. සිසුන් බොහෝමයක් පෙඩරල්වාදයේ මූලික ලක්‍ෂණ කෙරෙහි වැඩි අවධානය යොමු කර තිබූ අතර ප්‍රශ්නය තේරුම් නොගැනීම නිසා අපේක්ෂා කරන පිළිතුරු ලියා නොතිබුණි. විභාගයට පිළිතුරු ලිවීමේදී අසා ඇති ප්‍රශ්න සම්පූර්ණයෙන් කියවා තේරුම් ගෙන පිළිතුරු ලිවීමට සිසුන් හුරු කිරීම අවශ්‍ය වේ. එක් එක් මාතෘකාවකින් ඇසිය හැකි විවිධ ප්‍රශ්න සිසුන්ට ලබා දී ඒවාට ලිවිය යුතු මූලික කරුණු සම්බන්ධයෙන් පන්ති කාමරය තුළදී සිසුන්ට අවබෝධය ලබා දීම අවශ්‍ය වේ.

(ii) කොටසේ පහසුතාව 38% කි. සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳව දීර්ඝ වශයෙන් පිළිතුරු ලියා තිබුණ අතර එහි යහපත් අයහපත් ලක්‍ෂණ පිළිබඳව ලිවීමට අඩු අවධානයක් යොමු කර තිබුණි. සම්පූර්ණ ප්‍රශ්නය කියවා තේරුම් ගෙන තිබුණු බව දක්නට නැත. ප්‍රශ්නය සම්පූර්ණයෙන් කියවා තේරුම් ගෙන එයින් අපේක්‍ෂා කරන පිළිතුර ලිවීමට සිසුන් දිරිමත් කළ හැකි ය.

(iii) කොටසේ පහසුතාව 37% කි. ජනාධිපති ආණ්ඩුක්‍රමයේ මූලික ලක්‍ෂණ පිළිබඳව ඉහළ මට්ටමේ අවබෝධයක් සිසුන් තුළ තිබුණ ද, ජනාධිපති ක්‍රමයේ යහපත් අයහපත් ලක්‍ෂණ පිළිබඳව අඩු සාධන මට්ටමක් ඇති බව පෙනුණි. ආණ්ඩුක්‍රම වර්ගීකරණය පිළිබඳ පැහැදිළි කිරීමේදි ඒ එක් එක් ආණ්ඩු ක්‍රමයක මූලික ලක්‍ෂණ මෙන්ම, ඒවායේ වෙනස්කම්, වාසි, අවාසි, යහපත් හා අයහපත් ලක්‍ෂණ පිළිබඳ සිසුන්ට අවබෝධය ලබා දිය හැකි ය.

(iv) කොටසේ පහසුතාව 35% කි. මානව අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීමේ විධි ක්‍රම පිළිබඳ සිසුන්ගේ සාධන මට්ටම ඉහළ තලයක පැවතුණි. මානව අයිතිවාසිකම් පිළිබඳ හැඳින්වීමේදී බෝහෝ සිසුන් අයිතිවාසිකම් වර්ග කිරීමට පමණක් සීමා වීම, අඩු ලකුණු ලැබීමට හේතු වී ඇත. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් පරිදි අයිතිවාසිකම් නිර්වචනය කිරීම, වර්ග කිරීම, අයිතිවාසිකම්වල ප්‍රභවය, අයිතිවාසිකම් භුක්ති විඳීම පිළිබඳ සීමාවන් සහ අයිතිවාසිකම්වල ප්‍රායෝගික වැදගත්කම් පිළිබඳව අවධාරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කිරීම සුදුසු ය.

(v) කොටසේ 3වන ප්‍රශ්නයේ අඩුම පහසුතාව ලබා ඇති කොටස වන අතර එය 25%කි. දේශපාලන විද්‍යාව, විෂය නිර්දේශයට අලුතින් එකතු කරන ලද මාතෘකාවක් වන යහපාලනය පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් සිසුන්ගේ අවබෝධය අඩු මට්ටමක පැවතීමත් නිවැරදි දැනුමත් නොපැවතීමත් ඉහළ ලකුණු නොලැබී යාමට හේතු වී තිබුණි. එම නිසා විෂය නිර්දේශයට එකතුවන නවතම කරුණු පිළිබඳ සිසුන්ගේ දැනුම යාවත්කාලීන කිරීමට පන්ති කාමරය තුළ සැලසුම් කිරීම අවශ්‍ය වේ.

## 4 ප්‍රශ්නය

4. පහත දැක්වෙන ඒවායින් **දෙකක්** සාකච්ඡා කරන්න.

(i) ජාතික දේශපාලනය හා අන්තර්ජාතික දේශපාලනය අතර වෙනස්කම්

- ජාතික දේශපාලනය ලෙස සළකන්නේ රාජ්‍ය අභ්‍යන්තරයේ කෙරෙන දේශපාලනය යි. අන්තර්ජාතික දේශපාලන ලෙස සළකන්නේ, රාජ්‍යයන් අතර කෙරෙන්නාවූ දේශපාලනය යි. වෙනත් ආකාරයකට කියනවා නම් නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනය යි.
- පිළිගත් පොදු මතය වන්නේ දේශීය දේශපාලනය තුළ මතුවන ප්‍රශ්න, ගැටලු හා ගැටුම් නිරාකරණය කර ගැනීම ඡන්දය මඟින් සිදුවන බවත් සහ අන්තර්ජාතික දේශපාලනය තුළ හටගැනෙන ප්‍රශ්න හා ගැටුම් විසඳ ගැනීම සිදු වන්නේ උණ්ඩයෙන් බවත් ය. (Ballot Vs Bullet)
- මෙයට හේතුව අන්තර්ජාතික සමාජය ආණ්ඩුවක පාලනය කිරීමකට යටත් නොවූ අනධිකාරී සමාජයක් වීම ය. අන්තජාතික සමාජය තුළ පූර්ණ ව්‍යාකූලභාවයක් හෝ පූර්ණ ගැටුම්කාරී තත්ත්වයක් පවතින් බව මෙයින් අදහස් නොවේ.
- එයින් අදහස් වන්නේ අන්තර්ජාතික සමාජය, තුළ නිදහස් ස්වාධිපති ජාතික රාජ්‍යයන්ගේ එනම් අන්තර්ජාතික දේශපාලනයේ ප්‍රධාන රඟුම්කරුවන්ගේ නිදහස් හැසිරීම හා ක්‍රියාකාරීත්වය පාලනය කිරීම සඳහා විධිමත්ව ගොඩ නගන ලද පාලන ආයතන පද්ධතියක් නොමැති බව ය.
- වෙනත් ආකාරයකට කියනවා නම් අන්තර්ජාතික සමාජය තුළ දැකිය හැක්කේ ආණ්ඩුවක පාලනයට යටත් නොවූ දේශපාලනයක් ය. (Politics without government)
- අන්තර් ජාතික සමාජය තුළ දැකිය හැකි මූලිකම ලක්‍ෂණ වන්නේ රාජ්‍යයන්ගේ ස්වකීය පැවැත්ම එනම් ආරක්‍ෂාව, නම්බුව, ගෞරවය, ජාතික ආර්ථිකය ගොඩනගා ගැනීම, ජාතික මතවාදය ආරක්‍ෂා කර ගැනීම, ජාතික සුභසාධනය ඉහළ නැංවීම යනාදි සෑම දෙයක්ම ඒ ඒ රාජ්‍යයන්ගේ පෞද්ගලික තනි වගකීමක් වන බවත්, එම අවශ්‍යතාවන් සැපයීමට හෝ සපයා ගත හැකි ආකාරය පාලනය කිරීමට අන්තර්ජාතික ආණ්ඩුවක් නොමැති බවත් ය.
- එය වෙනත් ආකාරයකට ප්‍රකාශ කරන්නේ නම් තම අවශ්‍යතා, ආශාවන් හා අරමුණු තමන් විසින්ම සපුරා ගත යුතුය යන කොන්දේසිය මත ක්‍රියාත්මක වන රාජ්‍ය පද්ධතියකින් අන්තර්ජාතික සමාජය ගොඩනැගී තිබෙන බවත්ය.
- මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ රාජ්‍යයන් ඉතාම දැඩි තරඟකාරී තත්ත්වයකට පත්වීමත් තමන්ගේ අරමුණු ඉටුකරගැනීම සඳහා නොනවතින බල අරගලයකට රාජ්‍යයන් අවතීර්ණ වී සිටීමත් ය.
- පාලනයකට යටත් නොවූ අනධිකාරී තත්ත්වයක් තුළ ස්ව පැවැත්ම තමන්ගේ පෞද්ගලික වගකීමක් වූ විට ඒ සඳහා වැදගත් වන තීරණාත්මක සාධකය වන්නේ බලය යි. වෙනත් ආකාරයකට කියනවා නම් බලයේ ප්‍රමාණය මත පැවැත්ම තීරණය වන බව ය. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ රාජ්‍යයන් නොකඩවාම බලය පසුපස හඹා යාමය. එහි ප්‍රතිඵලය වී ඇත්තේ රාජයයන් අතර සැකය, අවිශ්වාසය, බිය යනාදිය නිරන්තරයෙන් ම පැවතීමත් එකිනෙකා සතුරන් ලෙස සැළකීමට පුරුදු වීමත් ය. අන්තර්ජාතික දේශපාලනයේ පදනම වන්නේ මෙය යි. මෙම හේතුව නිසා අන්තර්ජාතික සමාජය තුළ සාමයට වඩා යුද්ධය නිරන්තරයෙන්ම දැකිය හැකි වන්නේ ය.
- එංගලන්ත ජාතික දේශපාලන චින්තකයෙකු වූ තෝමස් හොබ්ස් (**17** වන සියවස) ඉහත දැක්වූ තත්ත්වය විස්තර කළේ පහත සඳහන් ආකාරයටය "ඉතිහාසයේ කිසිදු දිනක එකිනෙකා යුද්ධ වැදීමට ඇති ආශාවෙන් මිදීගිය පාලකයින් සහිත රාජ්‍ය පද්ධතියක පැවැත්ම දැකිය හැකි නොවේ. එක් අතකින් පාලකයින් සතු ස්වාධිපති බලය සහ ස්වාධීනත්වය නිසාත් අනෙක් අතට එකිනෙකා අතර ස්වභාවයෙන්ම පවතින ඊර්ෂ්‍යාව සහ එකිනෙකා පරයා යාමට ඇති ආශාව නිසාත් අන්තර්ජාතික සමාජය තුළින් නිරන්තරයෙන් දැකිය හැකි වන්නේ එකිනෙකා ඔවුනොවුන්ට තුවක්කු මානා ගෙන සිටින තත්ත්වයක් ය".නමුත් දේශීය දේශපාලනය මෙයට බොහෝ සෙයින් වෙනස් වූවක් වේ. දේශිය දේශපාලනය වුවද බල තරඟය පදනම් කරගෙන ක්‍රියාත්මක වන්නක් වුවද බල තරඟයේ නියුක්ත රඟුම්කරුවන් පාලනය වන බලවේග දෙකක් දැකිය හැකි ය.
  1. ආණ්ඩුව
  2. සදාචාරය

- දේශීය සමාජය තුළ දේශපාලනය කෙරෙන්නේ එක් අතකින් රටේ මූලික නීතිය ලෙස සැලකෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත විධිවිධාන පදනම් කොට ගෙන ය. අනෙක් අතින් ස්වාධිපති බලය පදනම් කරගෙන ආණ්ඩුව විසින් පනවන නීති පදනම් කර ගෙන ය.
- දේශීය සමාජයක් තුළ දේශපාලනය කළ යුත්තේ මෙම නීතිරීති වලට යටත්ව ය. මෙම නීතිරීති කඩ කරන විට දඬුවම්වලට යටත් වීමට සිදු වේ. දඬුවමට ඇති බිය නිසා දේශපාලන ක්‍රීඩාවේ නියුක්ත අය එම නීතිරීතිවලට අනුව දේශපාලනය කිරීමට පෙළඹේ.
- අනෙක් අතට දේශීය දේශාපලනය කෙරෙන්නේ සමාජය පිළිගත් සඳාචාර මූලධර්මයන්ට ද යටත්ව ය. මේවා නීති තරම් බලධාරී නොවුවද ශීලාචාරභාවය තීරණය වීම සම්බන්ධයෙන් ඒවා පිළිපැදීම හෝ නොපිළිපැදීම බලපානු ලැබේ.
- ඉහත කී සාධක දෙකේ බලපෑමෙන් දේශීය දේශපාලනය තුළ සාපේක්ෂ වශයෙන් දැකිය හැක්කේ සාමකාමී තත්ත්වයක් ය. වෙනත් ආකාරයකට කියනවා නම් ගැටුම් විසඳ ගැනීම උණ්ඩයෙන් නොව ඡන්දයෙන් කිරීමට වැඩි ප්‍රමුඛතාවක් හිමි වීම ය.
- නමුත් අන්තර්ජාතික දේශපාලනය ආණ්ඩුවක පාලනයට හෝ අන්තර්ජාතික වශයෙන් පිළිගත් සදාචාරයකට යටත් වුවක් නොවේ. එමනිසයි ගැටුම් විසඳ ගැනීමේ ප්‍රධානම මාර්ගය බවට යුද්ධය පත්ව තිබේ.

(ලකුණු 10)

(ii) රාජ්‍ය ප්‍රතිපත්තිවල ස්වභාවය හා වැදගත්කම

- ආණ්ඩුවක ප්‍රධානම කාර්යය වන්නේ ප්‍රශ්න විසඳීම ය. ප්‍රශ්න විසඳීම සඳහා තීරණ ගත යුතු ය. ආණ්ඩුවක තිරණ ගැනිමේ ක්‍රියාදාමයට කෙළවරක් නොමැති ය. එය අඛණ්ඩවම සිදුවන ක්‍රියාදාමයක් වේ. මෙයට හේතුව ආණ්ඩුව මුහුණ දෙන ප්‍රශ්නවල කෙළවරක් දැකිය නොහැකි වීම ය. සිදුවීම්වල අවසානයක් දැකිය නොහැකි වීම ය.
- එබැවින් ආණ්ඩුව තීරණ ගත යුතු ය. තීරණ ගැනීමේදී විකල්ප හඳුනා ගත යුතු ය. වඩාත් උචිත සහ සුදුසු විකල්පය තෝරා ගත යුතු ය. එය පදනම් කොටගෙන ප්‍රතිපත්ති තීරණය කළ යුතු ය. ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා උචිත යාන්ත්‍රණය තීරණය කොට ක්‍රියාවේ යෙදවිය යුතු ය.
- මෙයාකාරයට ජනතාවගේ ප්‍රශ්න හා ගැටලු විසඳීම සඳහා ආණ්ඩුව විසින් තීරණය කොට ක්‍රියාවට නංවන ප්‍රතිපත්ති රාජ්‍ය ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ. රාජ්‍ය ප්‍රතිපත්ති සංඛ්‍යාත්මක වශයෙන් මෙපමණ යැයි කිව නොහැකි ය. එමෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිවල අනෙක් ලක්ෂණය වන්නේ ඒවා එකිනෙකින් වෙනස් වීම ය.
- ආණ්ඩුව මෙම ප්‍රතිපත්ති සම්පාදනය කරන්නේ කෙසේ ද? ඒ සඳහා සහභාගී වන පුද්ගලයින් සහ ආයතන මොනවා ද? ජනතා ඉල්ලීම්වලට ආණ්ඩුව ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? මෙම ප්‍රශ්නවලට පිළිතුරු ලබාගත හැක්කේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා කළමණාකරණය කිරීම අධ්‍යනය කළහොත් පමණි.
- ඕනෑම රාජ්‍ය ප්‍රතිපත්තියක් සැළසුම් කරන්නේ විශේෂිත අරමුණු (Specific goals) ඉටුකර ගැනීම සඳහා සහ විශේෂිත ප්‍රතිඵල (Specific results) ලබා ගැනීම සඳහා ය.
- රාජ්‍ය ප්‍රතිපත්තිවල අවසාන අරමුණ වන්නේ ජනතා ප්‍රශ්න නිරාකරණය කිරීම ය. නැතිනම් පවතින තත්ත්වයක් තවත් ඉහළ මට්ටමකට ගෙන ඒම ය.
- මෙම අර්ථයෙන් සළකා බලන විට රාජ්‍ය ප්‍රතිපත්ති දේශපාලන ක්‍රමයක අවසාන නිමැවුම් වේ. (Main Outputs). එමගින් පෙන්නුම් කරන්නේ ජනතාව තුළින් පැන නගින ඉල්ලීම් සඳහා ආණ්ඩුව ප්‍රතිචාර දක්වන්නේ කුමණ ආකාරයකට ද ඒ සඳහා ආණ්ඩුව ක්‍රියා කරන්නේ කුමණ ආකාරයකට ද යන්න ය.
- වෙනත් ආකාරයකට කියනවා නම් රාජ්‍ය ප්‍රතිපත්ති මගින් පෙන්නුම් කරන්නේ දෛනික ක්‍රියාකාරීත්වයේදී ආණ්ඩුව මුහුණ දෙන ප්‍රශ්න මොනවාද සහ එම ප්‍රශ්න විසඳීම සඳහා ආණ්ඩුව ක්‍රියා කරන්නේ කෙසේද යන්න ය.
- මේ අනුව රාජ්‍ය ප්‍රතිපත්ති ආශ්‍රිතව මූලික ලක්ෂණ දෙකක් හඳුනා ගතහැකි ය.

1. පුද්ගල සමාජ පැවැත්ම සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්තිවල ඇති වැදගත්කම

   • පුද්ගලයාගේ සමාජ පැවැත්මේ සෑම අංශයක්ම කෙරෙහිම රාජ්‍ය ප්‍රතිපත්ති ඉතාම දැඩි බලපෑමක් කරනු ලැබේ. නිදසුන් ලෙස මහා මාර්ගයක ගමන් කරන අයෙකු මාර්ග යේ කුමණ පැත්තෙන් ගමන් කළ යුතුද යන්න තීරණය කරන්නේ රාජ්‍ය ප්‍රතිපත්තිය මඟිනි. එමෙන්ම අධ්‍යාපනය නිදහසේ ලබා දෙනවා ද?, සෞඛ්‍ය පහසුකම් නොමිලයේ සපයනවා ද?, නැතිනම් ගාස්තු අයකරනවා ද?, බදු වශයෙන් කොපමණ මුදලක් ගෙවිය යුතු ද?, මනුෂ්‍ය ඝාතනයකට වරදකරුවෙකු වුවෙකු එල්ලුම් ගහට යවනවා ද?, නැද්ද? යනාදි ජීවිතය හා සම්බන්ධ සෑම භෞතික කරුණක්ම තීරණය වන්නේ ආණ්ඩුව ක්‍රියාවට නංවන රාජ්‍ය ප්‍රතිපත්තිය මතය.

2. රාජ්‍ය ප්‍රතිපත්ති ගැටුම්කාරි ස්වභාවයක් ගැනීම

   • රාජ්‍ය ප්‍රතිපත්තිවල ඇති ඉහත දැක්වූ අතිශය වැදගත්කම නිසාම ඒවා දේශපාලන බල අරගලයේ අවධානය යොමුවන ප්‍රධානම ක්ෂේත්‍රය බවට පත්ව තිබේ.
   • ආණ්ඩුවක් විසින් කුමණ රාජ්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා ද යන්න තීරණය කිරීම පහසු දෙයක් නොවේ. අවසාන ප්‍රතිපත්තිය තීරණය වන්නේ දේශීය හා අන්තර්ජාතික වශයෙන් ක්‍රියාත්මක වන තරඟකාරී සහ ගැටුම්කාරී බලවේගවල ස්වභාවය අනුව ය.
   • විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය, නිලබල ක්‍රමය, අනෙක් රාජ්‍යයන් අන්තර් ජාතික සංවිධාන, උප-මධ්‍යම ආණ්ඩු, දේශපාලන පක්ෂ, බලපෑම් කණ්ඩායම්, මහජන මතය සහ ජනමාධ්‍ය එම දේශපාලන බලවේග වේ.

රාජ්‍ය ප්‍රතිපත්ති වූ කලි මෙම තරඟකාරී දේශපාලන බලවේගවල අවසාන නිමැවුම වේ. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සහ දේශපාලන තීරණ ගැනීම මගින් දේශපාලන ක්‍රමයේ සැබෑ ක්‍රියාකාරීත්වය සහ දේශපාලන ක්‍රමය තුළ බලවත් කවුරුන් ද යන්න පැහැදිලිවම පෙන්වා දේ.

දේශපාලනය යනු යමෙකු දෙයක් ලබා ගන්නේ කෙසේ ද? කවදා ද? සහ කුමණ ආකාරයකින් ද? යන්න නම් රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනය කිරීම මගින් එයාකාරයටම කවුරුන්, කුමක්, කවදා, ලබා ගනීද යන්න පිළිබඳ ව දැනගත හැකි ය.

(ලකුණු 10)

(iii) ගැටුම් කළමනාකරණය කිරීමේ විධික්‍රම

ගැටුම් කළමනාකරණය දේශපාලන විද්‍යාව යටතේ සාකච්ඡා වන තවත් විෂය මාතෘකාවකි. ඒ යටතේ ගැටුම් කළමනාකරණයෙහිලා පහත සඳහන් විධික්‍රම උපයුක්ත කරගනු ලැබේ.

මැදිහත්වීම

මැදිහත්වීමේ ක්‍රියාවලිය මගින් ප්‍රතිවිරුද්ධ පාර්ශව අතර අදහස් හුවමාරු කිරීම ආරම්භ කිරීම සහ සාකච්ඡා මගින් අදාළ ගැටුම කළමණාකරණය කර ගැනීමට මග පෙන්වීම සිදු කරනු ලැබේ. එහෙත් ගැටුම් කළමණාකරණය කිරීමෙහිලා මැදිහත්වීමේ ක්‍රියාවලිය මගින් ගනු ලැබූ සෑම පියවරක්ම සාර්ථක වී නොමැති ය. එයට ප්‍රධාන හේතුව වන්නේ මැදිහත්වීමේ ක්‍රියාවලිය දුෂ්කර වූවක් වීම ය. එහෙයින් මැදිහත්වීම සුලභව දැකිය හැක්කක් නොවේ.

සමථ කිරීම

සමථ කිරීම යනු සමගි කිරීමේ ක්‍රියාවලියකි. එමගින් ආරවුල් හෝ ගැටුම්වලට මැදිහත් වූ පාර්ශවයන්ට අදාළ ආරවුල හෝ ගැටුම පිළිගත හැකි ප්‍රායෝගික වූ විසඳුම් යෝජනාවලියක මාර්ග යෙන් සමථනය කර ගැනීමට සහාය වේ. එසේ සහාය වන්නේ බොහෝදුරට තෙවැනි පාර්ශවයකි. මෙහිලා එක්සත් ජාතින්ගේ සංවිධානය මගින් පුළුල් ආකාරයෙන් මැදිහත්වීම් සිදුකර තිබේ.

සාකච්ඡා කිරීම

ගැටුම් කළමණාකරණය කිරිමේ විධික්‍රම බොහෝමයක පදනම වන්නේ ගැටුම්කාරී පාර්ශව සාකච්ඡා සඳහා යොමු කිරීමය. එහිලා ඍජුව ගැටුම්කාරී පාර්ශව සාකච්ඡා මේසයට යොමු කිරීම හෝ මෙවැනි පාර්ශවයක මැදිහත්වීම යටතේ අදාළ පාර්ශව සාකච්ඡා මේසයට යොමු කරවීම සිදු කෙරේ.

පහසුකම් සැලසීම

සහසුකම් සැළසීම ගැටුම් කළමනාකරණ ක්‍රියාවලිය ආරම්භ කිරීමේදී අදහස් හුවමාරු කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් වැදගත් වේ. එහෙත් පහසුකම් සැලසීමේ නිරතවන්නන් ගැටුම් කළමනාකරණය කිරීමෙහිලා සෘජුව මැදිහත් නොවේ. ගැටුමක් කළමණාකරණය කර ගැනිම සඳහා අදාළ පාර්ශවයන්ට යම් යම් ආකාරයෙන් සහාය පළ කිරීම පමණක් සිදු කරයි. ඒ අනුව ගැටුම් කළමනාකරණය කර ගැනීම සඳහා අදාළ පාර්ශව සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා අවශ්‍ය භෞතික අවශ්‍යතා සපුරාලීම සිදු කරනු ලබයි.

(ලකුණු 10)

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




B කොටසේ ප්‍රශ්න අතුරින් අවම තෝරා ගැනීමක් ඇති ප්‍රශ්නය 4 වේ. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 18%ක් පමණි. මෙම ප්‍රශ්නය ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 65%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 22%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 10%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 03%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 03%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 65%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 32%ක් 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 3ක් ඇති අතර ඉන් කොටස් 3හිම පහසුතාව 15% හෝ ඊට වඩා අඩුය. පහසුතාව වැඩිම කොටස (i) වේ. එහි පහසුතාව 15%කි. (ii) කොටස පහසුතාව අඩුම කොටස වේ. එහි පහසුතාව 11%කි.

B කොටසේ හතරවන ප්‍රශ්නය අඩුම සිසුන් සංඛ්‍යාවක් තෝරා ගත් ප්‍රශ්නය වන අතර නව විෂය නිර්දේශයට අලුතින් එකතු කළ මාතෘකාවලට අදාළව සකස් කර ඇත. තවද, II ප්‍රශ්න පත්‍රයෙන් 17% වන අවම තෝරා ගැනීමක් ඇති ප්‍රශ්නය ද මෙය වේ. මෙම ප්‍රශ්නයට අනුකොටස් 3ක් ඇති අතර, එයින් කොටස් 2කට පමණක් පිළිතුරු සැපයිය යුතුය. එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20ක් හිමි වේ.

(i) අනුකොටසේ පහසුතාව 15% කි. ජාතික දේශපාලනය යනු රාජ්‍යය අභ්‍යන්තරයේ කෙරෙන දේශපාලනය බවත්, අන්තර්ජාතික දේශපාලනය යනු රාජ්‍යයන් අතර කෙරෙන්නා වූ දේශපාලනය බවත්, මේවා අතර වෙනස්කම් පිළිබඳවත් සිසුන් නිවැරදි අවබෝධයක් ලබා නොතිබුණි. එය සිසුන්ගේ පහසුතාව පහළ මට්ටමක පැවතීමට හේතු වී ඇත. එම නිසා ඒ පිළිබඳ පන්ති කාමරය තුළ සාකච්ඡා කිරීම හා ප්‍රගුණ කිරීම තුළින් වැඩි සාධනයක් අපේක්ෂා කළ හැකිය.

(ii) අනුකොටසේ පහසුතාව 11% කි. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් නිවැරදි අවබෝධයක් නොතිබීම නිසා ඒවායේ ස්වභාවය හා වැදගත්කම දැක්වීමට අයදුම්කරුවන් බහුතරය සමත් වී නොමැත. ජනතාවගේ ප්‍රශ්න හා ගැටලු විසඳීම සඳහා ආණ්ඩුව විසින් තීරණය කොට ක්‍රියාවට නංවන ප්‍රතිපත්ති, රාජ්‍ය ප්‍රතිපත්ති වශයෙන් හඳුන්වන බවත් පුද්ගල හා සමාජ පැවැත්ම සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති වැදගත් වන්නේ කෙසේද යන්නත් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ සහ අදාළ පාඨ ග්‍රන්ථවල සඳහන් වන ආකාරයට ඉගැනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කළ යුතුය.

(iii) අනුකොටසේ පහසුතාව 14% කි. ගැටුම් කළමනාකරණය කිරීමේ විධික්‍රම පිළිබඳ සම්පූර්ණ කරුණු පිළිතුරුවල ඇතුළත් වී නොතිබීමෙන් සිසුන්ට සම්පූර්ණ ලකුණු අහිමි වී තිබුණි. ගැටුම් කළමනාකරණ විධික්‍රම පිළිබඳ සිසුන් දැනුවත් කිරීම තුළින් මෙම ගැටලුව මඟ හරවා ගත හැකිය.

## C කොටස

### 5 ප්‍රශ්නය

**5. කෝල්බෲක් - කැමරන් කොමිසම ඉදිරිපත් කළ නිර්දේශ දක්වා ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික හා දේශපාලන ක්‍රමයට ඒවායින් වූ බලපෑම විවේචනාත්මකව පරීක්ෂා කරන්න.**

ලංකාවේ පරිපාලනය හා ආදායම් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳව 1831 දෙසැම්බර් 24 දින කෝල්බෲක් විසින් ඉදිරිපත් කළ වාර්තා දෙක සහ ලංකාවේ අධිකරණ ක්‍රමය ප්‍රතිසංවිධානය කිරීම හා අධිකරණ ක්‍රියා පටිපාටිය සකස් කිරීම පිළිබඳව 1832 ජනවාරි 31 දින කැමරන් ඉදිරිපත් කළ වාර්තාවත් පදනම් කරගෙන 1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීය. එබැවින් එම වාර්තා මගින් ඉදිරිපත් කළ යෝජනා මොනවාද යන්න ප්‍රථමයෙන් සොයා බැලිය යුතු ය.

1. කෝල්බෲක් යෝජනා
   - I. ආණ්ඩුකාරයාගේ බලතල අඩු කිරීම
   - II. පරිපාලන කටයුතු සඳහා ආණ්ඩුකාරයාට සහාය වීම පිණිස විධායක සභාවක් සහ නීති පැනවීම සඳහා ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම
   - III. උඩරට හා මුහුබඩ පළාත් එකට එක් කොට පළාත් පහක් යටතේ ප්‍රතිසංවිධානය කිරීම හා එසේ කිරීම මගින් ඒකීය පරිපාලන ක්‍රමයක් පවත්වාගෙන යාම
   - IV. සිවිල් සේවාවට ලාංකිකයන්ට ඇතුළත්වීමට දොර විවෘත කිරීම
   - V. රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
   - VI. රාජ්‍ය වෙළඳ ඒකාධිකාරය අහෝසි කිරීම
   - VII. ප්‍රාග්ධනය සම්පාදනය කිරීම සඳහා තැන්පතු බැංකුවක් ආරම්භ කිරීම
   - VIII. රාජ්‍ය සේවකයින්ට ව්‍යවසායක කටයුතුවල යෙදීමට නිදහස දීම

2. කැමරන්ගේ අධිකරණ ප්‍රතිසංස්කරණ යෝජනා
   - I. ආණ්ඩුකාරයාගේ පාලනයෙන් සිවිල් උසාවි නිදහස් කිරීම
   - II. මුළු දිවයිනටම බලපනා පරිදි ඒකීය අධිකරණ ක්‍රමයක් ස්ථාපිත කිරීම
   - III. යුරෝපියන් වෙනුවෙන් ශ්‍රේෂ්ඨාධිකරණ විසින් වෙනම ක්‍රියාත්මක කළ සිවිල් නඩු විනිශ්චය කිරීමේ ක්‍රියා පටිපාටිය අහෝසි කිරීම
   - IV. සිවිල් හා අපරාධ යන දෙවර්ගයේම අභියාචනා නඩු විසඳීමේ බලය සුප්‍රිම් උසාවියට පවරා දීම
   - V. නඩු විනිශ්චය කිරීමේදී ලාංකික තක්සේරුකරුවන් සමග එක්ව වැඩ කිරීම
   - VI. සිවිල් හා අපරාධ අධිකරණ බලය සිවිල් උසාවිවලට පවරා දීම සහ ප්‍රධාන නගර පදනම් කරගෙන දිස්ත්‍රික් උසාවි පිහිටුවීම
   - VII. අග්‍ර විනිශ්චයකරු සහ පියුනිස් විනිශ්චයකරුවන් දෙදෙනකු සහිත ශ්‍රේෂ්ඨාධිකරණයට සමස්ත අධිකරණය පරිපාලනය කිරීමේ බලය පැවරීම

3. කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන අතර එහි දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිඵල පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.
   - I. ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම පදනම් කරගත් පාලන ක්‍රමයක් ලංකාව තුළ වර්ධනය වීම සඳහා පදනම වැටීම
   - II. වෙළඳපොළ ආර්ථිකයක් වර්ධනය වීම සඳහා පදනම වැටීම
   - III. වැඩවසම්වාදය බිඳවැටීම හා එහි ප්‍රතිඵලයක් ලෙස කුල වාදය බිඳ වැටීම
   - IV. මිනිසුන්ගේ පෞද්ගලිකත්වය වර්ධනය වීම නැතිනම් මිනිසුන් සමාජ සජීවිකරණය වීමේ ක්‍රියාදාමයට පදනම වැටීම
   - V. බටහිර අධ්‍යාපන ක්‍රමයේ ආරම්භයට පදනම වැටීම, ආයාත නිර්යාත ආර්ථික ක්‍රමයේ ආරම්භයට පදනම වැටීම
   - VI. ව්‍යවසායක පන්තියක් බිහිවීම කෙරෙහි බලපෑම
   - VII. නිදහස් ස්වාධීන සිවිල් සේවාවක් වර්ධනය වීම කෙරෙහි ආරම්භක පදනම වැටීම
   - VIII. නිදහස් හා ස්වාධීන අධිකරණ ක්‍රමයක් වර්ධනය වීම කෙරෙහි ආරම්භක පදනම වැටීම
   - IX. ඒකීය පාලන ක්‍රමයක් ඇතිවීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශීය රදල නායකයින් භුක්ති විඳි අධි සමාජීය බලය නැතිවී යාම

සමස්තයක් ලෙස ගත්විට ලාංකික සමාජය ආඥාදායක හා අත්තනෝමතික පාලන ක්‍රමයකින් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයකට, වැඩවසම්වාදී ආර්ථික ක්‍රමයෙන් ධනවාදී ආර්ථික ක්‍රමයට හා පසුගාමී සමාජ ක්‍රමයකින් නවීකරණය වූ සමාජ ක්‍රමයකට පරිවර්තනය වීම කෙරෙහි පදනම කෝල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණවලින් ලැබුනි.

(ලකුණු 20)

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




5 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 52%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 30%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 11%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 11%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 33%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 56%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට 39%ක් වන අඩු පහසුතාවක් දක්වා ඇත.

II පත්‍රයේ C කොටසේ 5 වන ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවේ. අයදුම්කරුවන්ගෙන් 52%ක් තෝරා ගෙන ඇති මෙම ප්‍රශ්නයට 39%ක පහසුතාව ඇත. කෝල්බෲක් සහ කැමරන් ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් නව විෂය නිර්දේශය යටතේ 2011, 2012 උසස් පෙළ දේශපාලන විද්‍යාව ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න ඇතුළත්ව තිබුණ ද, මේ සම්බන්ධයෙන් සිසුන්ගේ සාධනය ඉහළ මට්ටමක දක්නට නොතිබිණි. මෙහිදී කෝල්බෲක් ඉදිරිපත් කළ යෝජනා, කැමරන් ඉදිරිපත් කළ යෝජනා වෙන් වෙන් වශයෙන් දැක්වීමට, බොහෝ සිසුන් සමත් වී නැත. එම යේජනා හේතුකොට ගෙන ඇති වූ දේශපාලන, ආර්ථික සහ සමාජ වෙනස්කම් පිළිබඳ පැහැදිළි කිරීමට ද සිසුන් වැඩි දෙනෙක් අපොහොසත් වී ඇත.

කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳව වෙන් වෙන් වශයෙන් අවධාරණය කරමින් සහ ඒ නිසා ඇති වූ දේශපාලන, ආර්ථික හා සමාජ ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් සිසුන්ට අවධාරණය වන ලෙස ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීමෙන් වඩා සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකිය.

## 6 ප්‍රශ්නය

6. ඩොනමෝර් කොමිසම ඉදිරිපත් කළ පහත දැක්වෙන යෝජනා දෙක මඟින් ශ්‍රී ලංකාවේ සමාජයට වූ බලපෑම විවේචනාත්මකව විමසන්න.

(i) සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම

බලපෑ හේතු සාධක

(අ) පීඩාවට පත්ව ඇති ජන කොටස් දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම මඟින් ඔවුන්ගේ අභිවෘද්ධිය ළඟා කර දීම

විශේෂයෙන් ම ගොවියන්ගේ, කම්කරුවන්ගේ, කුලහීන ජනතාවගේ සහ අනෙක් දුගී දුප්පත් ජනතාවගේ අභිවවෘද්ධිය ඇති කිරීමට නම් ඔවුන් දේශපාලන වශයෙන් සවිබල ගැන්විය යුතු බව කොමිසමේ අදහස විය. එසේ කළ විට දේශපාලනඥයින් ජනතාව මත රඳා පවතින තත්ත්වයකට පත්වන බවත් එවිට ජනතාවට ඇති වගකීමෙන් ඔවුන්ට පැන යා නොහැකි බවත් කොමිසම කල්පනා කළේය.

(ආ) ගම සහ නගරය අතර පවතින අසමතුලිත සංවර්ධනය නැති කිරීම

කොමිසම දැක්වූ ආකාරයට ලංකාව තුළ දැකිය හැකි වූ ප්‍රධානතම ලක්ෂණයක් වූයේ පොදු පාලන ක්‍රමය, අසම සමව වැඩී තිබීම සහ එම හේතුවෙන් මධ්‍යම ආණ්ඩුවේ දිස්වෙන සාපේක්ෂ දියුණුව පළාත්බදව දැකිය නොහැකිවීමය. මෙම පරස්පරතාව නැති කිරීම සඳහා කළයුතු දෙයක් ලෙස කොමිසම දුටුවේ ග්‍රාමීය ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගන්වා පළාත් ආණ්ඩුක්‍රමය ශක්තිමත් කිරීමය.

(ඇ) සීමිත ඡන්ද බලය යටතේ ගොඩ නැගිය හැකි සමාජ ප්‍රභූන්ගේ දේශපාලන කටීපයාධිකාරී බලය මර්දනය කිරීම

කොමිසම පෙන්වා දුන්නේ ඡන්ද බලය ව්‍යාප්ත නොකර ඇති කරන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් මඟින් දැනටමත් ලංකාවේ දේශපාලන ක්‍රමය තුළ ගොඩනැගී ඇති සමාජ ප්‍රභූන්ගේ කටීපයාධිකාරී දේශපාලන ආධිපතිත්වය තවදුරටත් වර්ධනය විය හැකි බවය. එවැන්නකින් සාමාන්‍ය ජනතාව තව තවත් පීඩාවට පත්වනවා විනා ඔවුන්ට යහපතක් නොවන බව කොමිසම පෙන්වා දුන්නේය. ජනතාවට යහපත සැලසීමට නම් ආණ්ඩුව සැබෑ ලෙසම ජනතා බලය මත ගොඩ නැගිය යුතු බව කොමිසමමේ අදහස විය. ඒ සඳහා ඇති හොඳම ක්‍රමය ඡන්ද බලය මඟින් ජනතාව සවිබලමත් කිරීම බව කොමිසම පෙන්වා දුන්නේය

(ඇ) දිවයිනේ උතුරු ප්‍රදේශයේ "හරිජන" යැයි හඳුන්වා කොන්කර ඇති පීඩිත ජනතාව නගා සිටුවීම

දිවයිනේ ඒ වන විට උතුරු ප්‍රදේශයේ වාසය කළ හරිජන යැයි සැලකූ ජනතාවගේ ප්‍රමාණය 70,000 - 80,000 ක් වන බව කොමිසම පෙන්වා දුන්නේය. කොමිසම ඉදිරියේ සාක්ෂි දුන් සමහරුන් පෙන්වා දුන් ආකාරයට දේපළ හා අධ්‍යාපන සුදුසුකම් මත ඡන්ද බලය සීමා කළහොත් මෙම පීඩිත ජන කොටසට කිසිදු දිනක තමන් වැටී ඇති අගාධයෙන් ගොඩ ඒමට නොහැකි බව කොමිසම විශ්වාස කළේය. අනෙක් අතට ඔවුන්ට ඡන්ද බලය දී ඔවුන් දේශපාලන වශයෙන් සවිබල ගැන්වුවහොත් ඔවුන්ගේ දුක්ගැනවිලිවලට දේශපාලන ප්‍රභූන් ඇහුම්කන් දෙනු ඇතැයි කොමිසම පෙන්වා දුන්නේය.

(ඉ) නැගී එමින් පැවති සමාජවාදී ව්‍යාපාරය අඩපන කිරීම

සමහර විචාරකයින්ගේ අදහස අනුව නැගී එමින් සිටි සමාජවාදී ව්‍යාපාරය දුර්වල කිරීම ද එක් අරමුණක් විය. මේ කාලය වන විට සමාජවාදී අදහස් වේගයෙන් ව්‍යාප්ත වීම ආරම්භවී තිබුණ අතර 1917 ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවයෙන් සමාජවාදී ව්‍යාපාරයට නව ආස්වාදයක් ගෙන ආවේය. ලංකාවටද එම බලපෑම මේ වන විට දැනෙමින් තිබුණි. ඒ. ඊ. ගුණසිංහ මෙම ප්‍රවනතාව නියෝජනය කළ රැඩිකල්වාදියෙකු වූ අතර ඔහුගේ ලංකා කම්කරු සංගමය තුළ

ඒකරාශී වී සිටි කම්කරුවන්ගේ සංඛ්‍යාව 40,000ක් විය. 1922 ට්‍රැම්කාර් වැඩ වර්ජනය මඟින් කම්කරුවන් තම ශක්තිය මනාව ප්‍රදර්ශනය කළේ ය. අනෙක් අතට නිදහස දිනා ගැනීම සඳහා ලංකා ජාතික සංගමය අනුගමනය කළ ඔතැනි පිළිවෙත හේතු කොට ගෙන ඒ කෙරෙහි කලකිරුණු රැඩිකල්වාදී තරුණ කොටස් ගුණසිංහ වෙත ආකර්ශනය වෙමින් සිටියේය. මෙ තත්ත්වය මර්ධනය කිරීම සඳහා හොඳම ක්‍රමයක් ලෙස දුටුවේ සාමාන්‍ය ජනතාව දේශපාලන වශයෙන් සවිබල ගැන්වීම ය. මෙම කරුණ ද සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීම කෙරෙහි බලපෑ බව සමහරුන්ගේ අදහස වේ.

සමාජ දේශපාලන හා ආර්ථික ප්‍රතිඵල

i. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයට ජනතාව හුරුපුරුදු වීම

මැතිවරණ ක්‍රියාදාමය හරහා තම පාලකයින් තෝරා ගැනීමට හා වෙනස් කිරීමට ලාංකික ජනතාව හුරුපුරුදු වූයේ සර්වජන ඡන්ද බලය හේතු කොට ගෙන ය

ii. වගකීමේ ආණ්ඩුක්‍රමයට හුරුපුරුදු වීම

දේශපාලන බලය හසුරුවන අය ජනතාවට වගකීමට හුරුපුරුදු වූයේ සර්වජන ඡන්ද බලය හේතු කොට ගෙන ය. දේශපාලනඥයින් ජනතාවට වගකීමට නැඹුරු වූයේ ජනතාවට තමන් දෙන පොරොන්දු වගකීමකින් ඉටු නොකළ හොත් ජනතා සහාය තමන්ට නොලැබෙනවාය යන අවබෝධය හේතු කොට ගෙන ය

iii. දේශපාලන පක්ෂ ආරම්භ වීමේ පදනම වැටීම

ඩොනමෝර් ආණ්ඩුක්‍රමය ක්‍රියාවට නැංවීමට දේශපාලන පක්ෂ අවශ්‍ය නොවිය. එමෙන්ම ආණ්ඩුක්‍රමය මඟින් දේශපාලන පක්ෂ බිහිවීම අධෛර්යමත් කළේ ය. නමුත් සර්වජන ඡන්ද බලය හේතු කොට ගෙන ඡන්දදායකයින් සංවිධානය කිරීමට ඇතිවන අවශ්‍යතාව හේතු කොට ගෙන දේශපාලන පක්ෂ ආරම්භ විය

iv. සමාජ සජීවීකරණය වේගවත් වීම

මෙයින් අදහස් කරන්නේ සමාජයේ පීඩිත ජන කොටස් සර්වජන ඡන්ද බලය මඟින් අයත් කරගත් ශක්තිය යටතේ හිස එසවීමට පටන් ගැනීම ය. විශේෂයෙන් ම මෙරට ප්‍රබලව පැවති කුලවාදය දෙදරා යාම කෙරෙහි සර්ව ජන ඡන්ද බලය දැඩි බලපෑමක් කරණු ලැබීය.

v. සමාජ ශුභ සාධනය වේගවත් වීම

සර්වජන ඡන්ද බලය හේතු කොට ගෙන දේශපාලනඥයින්ගේ පැවැත්ම ජනතාව මත රඳා පවතින දෙයක් බවට පත් වූ නිසා ජනතා සහාය වැඩි වැඩියෙන් ලබා ගැනීම සඳහා දේශපාලනඥයින් එකිනෙකා පරයමින් තරගකාරී ලෙස ශුභ සාධන වැඩ කටයුතු කිරීමට පටන් ගැනීම ඩොනමෝර් ක්‍රමය යටතේ දැකිය හැකි විය. නිදහස් අධ්‍යාපනයේ ආරම්භය, පාසැල් සිසුන්ට දිවා ආහාරය නොමිලේ සැපයීම, සෞඛ්‍ය සේවාවන් සහ ප්‍රජා සෞඛ්‍ය සේවාවන් ව්‍යාප්ත වීම, යටිතල පහසුකම් වර්ධනය වීම, කම්කරු සුභ සාධන නීතිරීති පැනවීම, ගොවි ජනපද ව්‍යාපාර ආරම්භ කිරීම යනාදි සුභ සාධක සේවාවන් රාශියක් මෙරට ඇරඹුනේ සර්වජන ඡන්ද බලය හේතු කොට ගෙන ය

(ලකුණු 10)

(ii) වාර්ගික නියෝජනය අහෝසි කිරීම

ජන වර්ගය පදනම් කරගෙන නියෝජනය සැපයීම හෙවත් වාර්ගික නියෝජන ක්‍රමය ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රියාදාමයට හඳුන්වා දුන්නේ 1833 කෝල්බෲක් විසින් ඉදිරිපත් කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා යටතේය. එම යෝජනා යටතේ පිහිටවූ ව්‍යවස්ථාදායක සභාවට නාමකරණයෙන් පත්කළ නිල නොලත් සාමාජිකයින් 6 දෙනාගෙන් තිදෙනෙකු පත්කළේ යුරෝපීයන් වෙනුවෙන්ය. ඉතිරි තිදෙනාගෙන් එක් අයෙකු සිංහලයින් වෙනුවෙන්ද එක් අයෙකු ද්‍රවිඩයින් වෙනුවෙන් ද ඉතිරි අනෙක් නියෝජිතයා බර්ගර් ජන කොටස වෙනුවෙන් ද පත් කරනු ලැබීය. මෙයාකාරයට ආරම්භ කළ වාර්ගික නියෝජනය 1910, 1920 සහ 1924 යන ආණ්ඩුක්‍රම

ප්‍රතිසංස්කරණයන්හිද පවත්වා ගෙන ගියා පමණක් නොව එහි පුළුල් වීමක්ද නොකඩවා සිදුවිය. මෙම ක්‍රමය කොතරම් ගැඹුරට ගමන් කළාද යතහොත් 1920 ගණන් වන විට ජන වර්ගය ඉක්මවා යමින් ජන වර්ගය තුළ සිටින කුලවලට පවා නියෝජනය ඉල්ලා සිටීමේ තත්ත්වයක් වර්ධනය වන ආකාරය දැකිය හැකි වේ.

වාර්ගික නියෝජන ක්‍රමය සුළු ජන කොටස්වල තෘප්තියට හේතු වුවද එය සිංහල ජන කොටසේ අතෘප්තියට හේතු විය. පැහැදිලිවම පෙනී ගිය කරුණ වූයේ බහුතරය වූ සිංහල ජන කොටසට සමාන ආකාරයේ නියෝජනයක් වාර්ගික නියෝජනය යටතේ සුළුජන කොටස්වලට හිමි වී තිබෙන බවය. මෙම තත්ත්වය සිංහල බහුතරයේ අකමැත්තට බලපාන අතර එහි ප්‍රතිඵලයක් ලෙස වාර්ගික නියෝජනය අහෝසි කරන මෙන් ඉල්ලා සිටින ආකාරය දැකිය හැකිවේ. 1908 දී ජේම්ස් පීරිස් විසින් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිබඳව සඳහන් කරමින් ආණ්ඩුකාරයා වූ මැකලම් වෙත යවන ලද පෙත්සමක් මඟින් ඉල්ලා සිටි එක් ඉල්ලීමක් වූයේ වාර්ගික නියෝජනය අහෝසි කරන ලෙසය.

මෙයට අමතරව පැහැදිලි ලෙසම පෙනීගිය අනෙක් කරුණ වූයේ වාර්ගික නියෝජනය ජනවාර්ගික කොටස් අතර අන්‍යෝන්‍ය සැකය, ඊර්ෂ්‍යාව, තරඟකාරීත්වය, අවිශ්වාසය යනාදිය වර්ධනය කරන බවය. මෙම තත්ත්වය සමහරවිට ජනවර්ගය තුළම දැකිය හැකිවිය. මෙයින් පැහැදිලි වූ කරුණ වූයේ වාර්ගික නියෝජනය වාර්ගික අසමතාව වර්ධනය කිරීමට මෙන්ම ජාතික සමගියද අඩපන කරන බවය.

මෙම කරුණ සැළකිල්ලට ගත් ඩොනමෝර් කොමිසම 1931 දී තම යෝජනා මඟින් වාර්ගික නියෝජනය අහෝසි කිරීමට යෝජනා කරන අතර ඒ වනවිට වාර්ගික නියෝජනය දිවයින තුළ වසර සියයකට ආසන්න කාලයක් ක්‍රියාත්මක වෙමින් තිබිණ. ඩොනමෝර් කොමිසම ප්‍රකාශ කළ ආකාරයට; "අධිරාජ්‍යයට අයත් සමුද්‍රයෙන් එතර විවිධ රටවල්හි ආණ්ඩුක්‍රම සකස් කිරීමේදී ද, සංශෝධන කිරීමේදීද පැන නැගෙන ඉතාම දුෂ්කර ප්‍රශ්නයන්ගෙන් එකක් ජාතීන් අනුව නියෝජනය වීමය. බොහෝ විට ඒ ජන කොටස් අතර මූලික වශයෙන් ගණන් ගැනෙන වර්ග හෝ ආගම් හෝ අනුව ඇති වූ වෙනස්කම් පවතී. එකම වර්ගයකට හෝ ආගමකට අයත් ජන කොටස් අතර වුවද කුල භේදය නිසා දැඩි පංති ප්‍රභේද හට ගෙන තිබේ. මේ විවිධ කොටස් හා නිශ්චිත වශයෙන් වෙන් වී පෙනෙන පංතීන් අතර සමහර දැඩි ප්‍රතිවිරුද්ධතාවන් නොමැති වුවත් ඒවා පැහැදිලිවම වෙන්වූ කොටස් වශයෙන් සකස් වී ඇත. මේ නිසා ඔවුන් තුළ සමාජ කතිකාවන් හා සාමූහික හැඟීමක් නොමැති වෙයි. මින් ඇති වන ප්‍රතිඵලය වන්නේ ජාතික අරමුණු අනුව ජාතික එකමුතුකමක් ඇතිකර ගැනීම දුෂ්කර වීමය." කොමිසම තව දුරටත් ප්‍රකාශ කළ ආකාරයට; "වාර්ගික නියෝජනය මඟින් ජනගහනයේ විවිධ කොටස් සුදුසු අන්දමින් සහභාගි වන ව්‍යවස්ථාදායක සභාවක්ද, ජාතීන් අතර එකමුතුකමක්ද අතිවෙනු ඇතැයි සිතන ලදි. එහෙත් එම ප්‍රයත්නයෙන් බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලැබුනු බවත් ඊට හාත්පසින්ම ප්‍රතිඵල ලැබුණු බවත් කිව යුතුය. විවිධ ජන කොටස්වල නායකයින් අතර උනුන් කෙරෙහි විශ්වාසයක් නැත. ජාතීන් අනුව නියෝජනය එකමුතුකමක් ඇති කරන බන්ධනයක් වශයෙන් ක්‍රියා නොකෙරුණි."

ඩොනමෝර් කොමිසමේ නිර්දේශ කිරීම අනුව 1931 දී වාර්ගික නියෝජනය අහෝසි කරන අතර එහි දේශපාලන හා සමාජ ප්‍රතිඵලය වූයේ වාර්ගික හේතු උත්සන්න වීමේ ප්‍රවේගය යම් ප්‍රමාණයකින් අඩපන වීමයි.

(ලකුණු 10)

**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




C කොටසේ ප්‍රශ්න අතුරින් වැඩිම තෝරා ගැනීමක් ඇත්තේ 6වන ප්‍රශ්නයට වන අතර එය 62%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 48%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 03%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 03%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 48%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 49%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 2ක් ඇති අතර ඉන් පහසුතාව වැඩිම කොටස (i) වේ. එහි පහසුතාව 37%කි. පහසුතාව අඩුම කොටස (ii) වන අතර එහි පහසුතාව 26%කි.

6 වන ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත ය. එක් කොටසකට ලකුණු 10 බැගින් මුළු ලකුණු 20 කි. (II) පත්‍රයේ C කොටසින් වැඩිම සිසුන් ප්‍රමාණයක් තෝරා ගත් ප්‍රශ්නය මෙය යි. (i) කොටසේ පහසුතාව 37% කි. සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීම නිසා සමාජයට වූ බලපෑම පිළිබඳ සිසුන් තුළ නිවැරදි අවබෝධයක් නොතිබීම නිසා අඩු සාධන මට්ටමක් ලබා ඇත. මෙම ප්‍රශ්නයෙන් සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීමට බලපෑ හේතු සහ ඒ නිසා ඇති වූ සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රතිඵල අපේක්ෂා කෙරුණි. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ ඉදිරිපත් කළ යෝජනා අතරින් ප්‍රජාතන්ත්‍රවාදී සමාජ, දේශපාලන ක්‍රමයක් ඇතිවීම කෙරෙහි බලපෑ වැදගත් යෝජනාව, මෙය බව දක්වමින් ඒ තුළින් ඇති වූ ප්‍රතිඵල වෙන් වෙන් වශයෙන් අවධාරණය කිරීමෙන් සිසුන්ට ඒ පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දිය හැකිය.

(ii) කොටසේ පහසුතාව 26%කි. මෙම ප්‍රශ්නය වැඩිම සිසුන් පිරිසක් තෝරාගෙන තිබුණ ද, සිසුන් අවබෝධයෙන් පිළිතුරු ලියා ඇති බව නිරීක්ෂණය නොවේ. 1833 සිට ලංකාවේ පැවති වාර්ගික නියෝජන ක්‍රමයේ දුර්වලතා ද, ඒ නිසා ශ්‍රී ලංකාවේ දේශපාලන දේහය තුළ වර්ධනය වූ නරකයන් ද, මෙම ක්‍රමයට එරෙහිව ඇති වූ විරෝධතාව ද, 1931 ප්‍රදේශ බද නියෝජනය හඳුන්වාදීම සහ ඒ තුළින් දේශපාලන ක්‍රමය තුළ ඇති වූ වෙනස්කම් ද පිළිතුරෙන් අපේක්ෂා කර තිබුණි. ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය යටතේ ඉදිරිපත් කළ අනෙක් යෝජනාවලට සමාන බරක් තබමින්, ඉහත කරුණු ඔස්සේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සකසා ගැනීමෙන්, ඉහළ සාධන මට්ටමක් ලබා ගත හැකි ය.

## 7 ප්‍රශ්නය

7. 1948 සෝල්බරි ව්‍යවස්ථාව හා 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ පහත දැක්වෙන දේශපාලන ආයතන දෙක සංසන්දනය කොට වෙනස්කම් දක්වන්න.

(i) නාමික විධායකය

- 1948 සෝලබරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ නාමික විධායක තනතුර අග්‍රාණ්ඩුකාරවරයා යන නිල නාමයෙන් හැඳින්විය. 1972 පළමු ජනරජ ආණ්ඩුක්‍රම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කළ නාමික විධායක තනතුර හැඳින්වූයේ ජනාධිපතිවරයා යන නිල නාමයෙනි.

- 1948 සෝල්බරි ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයා පත් කරනු ලැබුයේ ශ්‍රී ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් පරිදි. බ්‍රිතාන්‍ය මහ රැජින විසිනි. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා පත් කරනු ලැබුයේ ශ්‍රී ලංකා ජනරජයේ අගමැතිවරයා විසිනි. ඡන්ද බලය හිමි ඕනෑම අයෙකු ජනාධිපති තනතුරට පත් කිරීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ අගමැතිවරයාට බලය හිමිවිය. එසේ පත් කළ තැනැත්තා අභියාචනාධිකරණයේ ප්‍රධාන විනිශ්චයකරු ඉදිරියේ දිවුරුම් දී තනතුරේ වැඩ භාර ගත යුතු විය.

- 1948 ව්‍යවස්ථාව යටතේ අග්‍රාණ්ඩුකාරවරයාගේ ධූර කාලය නිශ්චිත ලෙස ව්‍යවස්ථාවේ නොදැක්වුනද පිළිගත් සම්ප්‍රදාය වූයේ එය වසර පහක් වන බවය. අගමැතිගේ උපදෙස් පරිදි බ්‍රිතාන්‍ය කිරීටය විසින් අග්‍රාණ්ඩුකාරවරයා තනතුරින් ඉවත් කළ හැකි විය. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ ධූර කාලය අවුරුදු හතරකි. නැවත තේරී පත්වීම සීමා නොවින. ජාතික රාජ්‍ය සභාවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාවෙන් 1/2 ට නොඅඩු සංඛ්‍යාවක් අත්සන් තබන ලද යෝජනාවක් ජාතික රාජ්‍ය සභාවේ නොපැමිණි මන්ත්‍රීන් ද ඇතුළුව 2/3ක බහුතරයෙන් සම්මත කළහොත් ජනාධිපතිවරයා ධූරයෙන් ඉවත් කිරීමේ බලය අගමැතිවරයා සතුවිය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලට අනුව අග්‍රාණ්ඩුකාරවරයා මෙන්ම ජනාධිපතිවරයාද රාජ්‍යයේ නායකයා, විධායකයේ නායකයා සහ සන්නද්ධ සේවාවන්හි ප්‍රධාන අණදෙණ නිලධාරිද විය. මෙයට අමතරව සමහර ව්‍යවස්ථාදායක සහ අධිකරණ කාර්යයන් කිහිපයක් ද ව්‍යවස්ථා මඟින් තනතුරුවලට පැවරී තිබෙන නමුත් මෙම බලතල කාර්යයන් හා වගකීම් අග්‍රාණ්ඩුකාරවරයා මෙන්ම ජනාධිපතිවරයාද මුදාහැරිය යුතු වූයේ අගමැතිවරයාගේ උපදෙස් අනුවය.

- මුක්තියේ හිමිකම් තනතුරු දෙකටම නිල බලයෙන්ම හිමි වූ බැවින් අග්‍රාණ්ඩුකාරවරයා මෙන්ම ජනාධිපතිවරයාද තම රාජකාරී වැඩ කටයුතු මුදාහැරීම සම්බන්ධයෙන් වගකීමට යටත් නොවූවා පමණක් නොව ඒ පිළිබඳව කිසිදු අධිකරණයක ප්‍රශ්න කිරීමටද නොහැකි විය.

- සමස්තයක් ලෙස ගත්විට කරුණු දෙකකින් හැරුණ විට 1972 ව්‍යවස්ථාවෙන් ගොඩනැගූ ජනාධිපති නිලය 1948 ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කළ අග්‍රාණ්ඩුකාර නිලයේ කාබන් පිටපතක් විය. එම කරුණු දෙක වූයේ,

    I. 1972 ජනාධිපතිවරයා තනතුරට පත් කළ ආකාරය
    එම ක්‍රමය මඟින් තනතුරට හිමි ගෞරවය හා නම්බුව කෙලෙසූ බවයි විචාරක මතය වේ.

    II. පනත්වලට අවසාන අනුමැතිය දීමේ බලය
    මෙම බලය 1972 ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අහිමි කරන ලදි. මෙමගින් තනතුර තවදුරටත් හෑල්ලු කරන ලදි.

- අවසාන වශයෙන් කිව හැක්කේ 1948 අග්‍රාණ්ඩුකාර ධූරය සමඟ සසඳන විට 1972 ජනාධිපති තනතුර තත්ත්වයෙන්, ගෞරවයෙන් හා බලතලවලින් අඩු තනතුරක් වූ බවයි.

(ලකුණු 10)

(ii) ව්‍යවස්ථාදායකය

i. සංයුතිය

1948 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය පාර්ලිමේන්තුව නමින් හැඳින්වූන අතර එය ද්වී මාණ්ඩලික ආයතනයක් විය. මහජන මන්ත්‍රී මණ්ඩලය සහ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය එම ආයතන දෙක විය. මේවා ඉහළ සහ පහළ මණ්ඩල වශයෙන් ද හැඳින්විනි. මහජන මන්ත්‍රී මණ්ඩලය සමන්විත වූයේ ඡන්දයෙන් පත්කළ මහජන නියෝජිතයින්ගේ සහ අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් පත්කළ 6 දෙනෙකු ගෙනි. ඡන්දයෙන් තෝරා පත්කරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව මැතිවරණ කොට්ඨාශ බෙදීම වෙනස්වන ආකාරයට වෙනස් විය. සෙනෙට් මන්ත්‍රී මණ්ඩල සාමාජිකයින් 30 දෙනකුගෙන් සමන්විත වූ අතර එයින් 15 දෙනකු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරවරයා විසින් නාමකරණයෙන් ද අනෙක් 15 දෙනා පාර්ලිමේන්තුව නියෝජනය කළ දේශපාලන පක්ෂ විසින්ද තෝරාපත් කරනු ලැබීය.

1972 ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ ව්‍යවස්ථාදායකය ඒකමණ්ඩල වූ අතර එය ජාතික රාජ්‍ය සභාව ලෙස හඳුන්වන ලදි. එය සමන්විත වූයේ ඡන්දයෙන් තෝරා පත් කළ මන්ත්‍රීවරුන්ගෙ න් පමණි. මන්ත්‍රීවරුන් තොරාපත් කරනු ලැබූයේ සරල බහුතර ක්‍රමය යටතේ ප්‍රාදේශීය ඡන්ද කොට්ඨාස ක්‍රමය පදනම් කරගෙනය. ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව තීරණය කිරීමේ බලය හිමි වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කොමිෂන් සභාවටය.

ii. ව්‍යවස්ථාදායක බලතල

ව්‍යවස්ථාදායක බලතල යනුවෙන් අදහස් කරන්නේ නීති පැනවීමට ඇති බලයයි. 1948 ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය ද්වි මාණ්ඩලික වූ බැවින් පනතක් නීතියක් බවට පත්වීම සඳහා මණ්ඩල දෙකේම අනුමැතිය අවශය විය. මුදල් පනත් හැරුණු විට ඕනෑම සාමාන්‍ය පනතක් මණ්ඩල දෙකෙන් කවරක වුවද ඉදිරිපත් කළ හැකි විය. මුදල් පනත් ඉදිරිපත් කිරීමේ බලය හිමි වූයේ මහජන මන්ත්‍රී මණ්ඩලයට පමණි. නමුත් ඕනෑම පනතක් සංශෝධනය කිරීමට මෙන්ම මුදල් පනතක් නම් මාසයක කාලයක් සඳහාද සාමාන්‍ය පනතක් නම් මාස තුනක කාලයක් සඳහාද ප්‍රමාද කිරීමේ බලය සෙනෙට් මණ්ඩලය සතු විය. යම් පනතක් සම්බන්ධයෙන් මණ්ඩල දෙක අතර ගැටුමක් ඇති වුවහොත් එම පනත මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් අඛණ්ඩ සැසිවාර දෙකකදී සම්මත කොට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ විට සෙනෙට් සභාවේ පළමු සැසිවාරය තුළ දී හෝ මහජන මන්ත්‍රී මණ්ඩලය දෙවන වරට පනත සම්මත කළ දිනයේ සිට මාස 6ක් ගතවීමට ප්‍රථමයෙන් සෙනෙට් මණ්ඩලය පනත සම්මත නොකළහොත් පනත් සම්මත වූවා සේ සැළකිණ.

1948 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලතල පිළිබඳව කථා කිරීමේ දී වැදගත් වන්නේ නීති පැනවීම සම්බන්ධයෙන් එයට ස්වාධිපති බලයක් හිමි නොවූ බවය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 29 වන වගන්තිය මඟින් පාර්ලිමේන්තුවේ නීති පැනවීමේ බලය සීමා කර තිබුණා පමණක් නොව පාර්ලිමේන්තුවේ සම්මත කරන නීති අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කිරීමට ඉඩ තිබීම තුළින් ද තවදුරටත් සීමා විය.

1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව ස්ථාපිත කරනු ලැබූයේ පාර්ලිමේන්තු ස්වාධිපති මූලධර්මය පදනම් කොට ගෙනය. මෙයින් අදහස් වන්නේ ජාතික රාජ්‍ය සභාවට ඕනෑම නිතියක් පැනවීමට මෙන්ම පවතින ඕනෑම නීතියක් අවලංගු කළ හැකි බවය. ආණ්ඩුක්‍රම ව්‍යවසථාවේ 5 වන වගන්තිය මගින් දැක්වූන ආකාරයට ජනතා පරමාධිපතිත්වය යටතේ ජනතාව සතු ව්‍යවස්ථාදායක, විධායක සහ අධිකරණ බලය ක්‍රියාවට නැංවීමේ බලය ජාතික රාජ්‍ය සභාව සතු වන අතර ව්‍යවස්ථාදායක බලය ජාතික රාජ්‍ය සභාව විසින්මද විධායක බලය ජනාධිපති සහ අමාත්‍ය මණ්ඩලය හරහා ද අධිකරණ බලය අධිකරණ ආයතන හරහා ක්‍රියාවට නංවන්නේ ද ජාතික රාජ්‍ය සභාව විසිනි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 48 වන වගන්තියට සහ 49 වගන්තියට අනුව ජාතික රාජ්‍ය සභාවෙන් සම්මත කොට කථානායක වරයා විසින් අත්සන් තබා සහතික කළ විට එම පනත නීතියක් බවට පත් වන්නේ ය. 48:2 වගන්තියට

අනුව එසේ පනවන නීතියක වලංගුභාවය විමසීමට ඒ පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට හෝ කවර වූ ආකාරයකින් ප්‍රශ්න කිරීමට හෝ යුක්තිය පසිඳලීමේ නියුක්ත කිසිම ආයතනයකට වෙනත් කවර වූ ආයතනයකට, තැනැත්තෙකුට හෝ අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොමැත්තේ ය. මේ අනුව පෙනී යන්නේ 1948 ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුව නීති පැනවීම සම්බන්ධයෙන් පූර්ණ බලයක් හිමි නොවූ බව සහ 1972 ව්‍යවස්ථාව යටතේ ජාතික රාජ්‍ය සභාව නිති පැනවීම සම්බන්ධයෙන් පූර්ණ ස්වාධිපති බලයක් භුක්ති වින්ද බවත් ය.

iii. ව්‍යවස්ථාදායකය පිළිබඳ අධිකරණ විවරණය

මෙයින් අදහස් කරන්නේ ව්‍යවස්ථාදායකය විසින් පනවන නීති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලවනවා ද? නැද් ද? යන්න පරීක්ෂා කර බැලීමටත් අනුකූල නොවෙනවා නම් එම නීති අවලංගු කිරීමට අධිකරණයට ඇති බලය යි. 1948 ව්‍යවස්ථාව යටතේ ප්‍රකාශිතව මෙම බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අධිකරණයට පවරා නොතිබුණ ද 1962 කුමන්ත්‍රණ නඩුව විසඳීමේ දී අධිකරණය දෙනු ලැබූ තීරණයෙන් පෙනී ගියේ අධිකරණ විවරණ බලය අධිකරණය සතුව පවතින බව ය. ශ්‍රී ලංකා අධිකරණයේ තීරණය එංගලන්ත රාජාධිකරණය මඟින් අනුමත කිරීම මඟින් එය තවදුරටත් තහවුරු විය.

1972 ව්‍යවස්ථාවේ 48(2) ව්‍යවස්ථාවට අනුව අධිකරණ විවරණ බලය අධිකරණයෙන් ඉවත් කොට ඇත. නමුත් 1972 ව්‍යවස්ථාව මඟින් හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය මඟින් ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කරන පනත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලද නැද්ද යන්න සොයා බැලීමේදී ක්‍රමය හඳුන්වා දෙන ලදි. මේ අනුව ජාතික රාජ්‍ය සභාවට ඉදිරිපත් කරන පනත් සාමාන්‍ය සහ හදිසි යනුවෙන් කොටස් දෙකකට වර්ග කරන අතර ව්‍යවස්ථාවේ දක්වා තිබෙන විධිවිධානවලට අනුව සාමාන්‍ය පනතක් ව්‍යවස්ථාවට එකඟද නැද්ද යන්න තීරණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යස්ථා අධිකරණයට ඉදිරිපත් කළ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයේ තීරණය සති දෙකක් ඇතුළත ද හදිසි පනතක් නම් එහි තීරණය පැය 24ක් ඇතුළත ද කථානායකවරයාට දැන්විය යුත්තේ ය. යම් පනතක් සාමාන්‍ය හෝ හදිසි වුවද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණයට යොමු කර ඇති විටෙක එහි තීරණය දන්වන තුරු එම පනත පිළිබඳව කටයුතු කිරීමට ජාතික රාජ්‍ය සභාවට නොහැක්කේ ය.

(ලකුණු 10)

**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




7 ප්‍රශ්නය තෝරා ගෙන ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 40%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 31%ක් ද, ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 27%ක් ද, ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 32%ක් ද, ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 10%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 10%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 31%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 59%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 02ක් ඇති අතර ඉන් පහසුතාව වැඩිම කොටස (ii) වී ඇති අතර එහි පහසුතාව 41%කි. පහසුතාව අඩුම කොටස (i) වේ. එහි පහසුතාව 39%කි.

7 වන ප්‍රශ්නය 40% ක් තෝරා ගෙන ඇති අතර එයට කොටස් 2ක් ඇත. (i) කොටසේ පහසුතාව 39% කි. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමය පිළිබඳ ඒකකයෙන් පසුගිය විභාගවලදී මෙම මාතෘකාවට අදාළ ප්‍රශ්න සෑම වසරකම පාහේ අසා තිබුණ ද, මේ සඳහා සිසුන් වැඩි පිරිසක් අඩු ලකුණු ලබා ඇත. 1948 සහ 1972 ව්‍යවස්ථාවන් යටතේ ඇති කළ මෙම ආයතන දෙක පිළිබඳව සිසුන් සතුව අවබෝධයක් පැවතිය ද, ඒවා තුලනාත්මකව විග්‍රහ කිරීමට අපොහොසත්ව ඇත. එක් එක් ආණ්ඩුක්‍රම වෙන් වෙන් වශයෙන් සාකච්ඡා කිරීමට අමතරව, එක් එක් ආණ්ඩුක්‍රමවල සමාන ආයතන සම්බන්ධයෙන් තුලනාත්මකව පැහැදිලි කිරීමෙන් මෙම ගැටලුවලට විසඳුම් ලබා ගත හැකිය.

(ii) කොටසේ පහසුතාව 41% කි. මෙය 1948 සහ 1972 ව්‍යවස්ථාදායකය හා සම්බන්ධව ප්‍රශ්නයක් වන අතර, ප්‍රශ්නයට අදාළව ඇතුළත් විය යුතු සියලු කරුණු බොහෝ පිළිතුරුවල අඩංගු වී නොතිබුණි. ව්‍යවස්ථාදායකයේ සංයුතිය පිළිබඳ විස්තර කිරීමට පමණක් බොහෝ පිළිතුරු සීමා වී තිබුණ අතර, එයට ඇතුළත් විය යුතුව තිබුණු ව්‍යවස්ථාදායකයන්ගේ බලතල හා කාර්යයන් සම්බන්ධව අවධානය අඩු මට්ටමක පැවතුණි.

යම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට සම්බන්ධ ආයතන පිළිබඳ ඉදිරිපත් කරන පිළිතුරක, එම ආයතනයේ සංයුතිය හෝ පත් කරන ආකාරය, ඉවත් කරන ආකාරය, එයට අයත් බලතල හා කාර්යයන්, එයට හිමි වන තත්ත්වය, මෙන්ම එහි හොඳ නරක, වැදගත්කම - නොවැදගත්කම යනාදී සෑම ක්ෂේත්‍රයකම විසිර යන ආකාරයෙන් පිළිතුර ගොඩ නැගිය යුතු බව සිසුන්ට අවබෝධ කරවීමෙන් සහ පිළිතුරු ලියවීමෙන් වඩා සාර්ථක ප්‍රතිඵල ලබා ගත හැකිය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා දෙකක සමාන ආයතන දෙකක් සැසඳීමේදී ඒ ඒ ආයතනවල විශේෂතා ඉස්මතුවන ආකාරයෙන් පාඩම සැලසුම් කිරීම වඩා යෝග්‍ය වේ.

## 8 ප්‍රශ්නය

8. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව යටතේ පහත දැක්වෙන ඕනෑම දෙකක් විභාග කරන්න.

(i) ජනාධිපති සහ කැබිනට් මණ්ඩලය

මේ හා සම්බන්ධව ව්‍යවස්ථාවේ දැක්වෙන විධිවිධාන පහත දැක්වේ.

- 43.2 - ජනාධිපතිවරයා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර කැබිනට්
- මණ්ඩලයේ නායකයා ද වන්නේය.
- 43.3 - පාර්ලිමේන්තුවේ බහුතර විශ්වාසය දිනා ගැනීමට සමත් මනත්‍රීවරයෙකු
- අගමැති වශයෙන් පත් කළ යුතුය.
- 44.1 - කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරුන් පත් කිරීම අවශ්‍ය නම් පමණක්
- අගමැති විමසිය යුතුය
- 44.1 (අ) - අමාත්‍යවරුන්ට විෂය කටයුතු පැවරීම
- 44.2 - ජනාධිපතිවරයාට ඕනෑම විෂය භාර කරුණක් තමන් යටතේ තබාගත හැකිවීම
- 44.3 - කැබිනට් අමාත්‍ය සංඛ්‍යාව අඩු වැඩි කිරීම සහ පවරා ඇති විෂය ක්ෂේත්‍ර සංශෝධනය කිරීම
- 45 - කැබිනට් නොවන අමාත්‍යවරුන් පත් කිරීම
- කැබිනට් මණ්ඩලය විසුරුවා හැරිය විටෙක ජනාධිපති කෙරෙහි එය බලපාන්නේ නැත. (43.2)

අමාත්‍ය මණ්ඩලය සමන්විත වන්නේ ජනාධිපති, අගමැති සහ අමාත්‍යවරුන්ගෙනි. ජනාධිපතිවරයා ආණ්ඩුවේ නායකයා ලෙස අමාත්‍ය මණ්ඩලයේ මුලසුන ගනියි. අගමැති හා අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් වන අතර ඔවුන්ව පත් කිරීම සඳහා තෝරා ගැනීම සහ ඔවුන්ට පවරන කාර්යයන් හා විෂයයන් තීරණය කිරීම ජනාධිපතිගේ ස්වාධිකාරයට අයත්ය. අගමැති හා අමාත්‍ය මණ්ඩලය පත් කරන විට ඔවුනට පාර්ලිමේන්තුවේ බහුතරයක සහාය ලබා ගැනීමට ඇති හැකියාව ගැන ජනාධිපති සැලකිලිමත් විය යුතුය. කෙසේ නමුත් ජනාධිපතිගේ බලයට පාර්ලිමේන්තුව නමා ගැනීමට තිබෙන හැකියාව නිසා තමන්ට අවශ්‍ය පරිදි මෙම පත්වීම සිදු කළ හැකිය. අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකිව යුතු වුවද ඇමතිවරුන්ට වඩාත් වැදගත් වන්නේ, ඔවුනට ජනාධිපතිගේ ප්‍රතිපත්තිය ක්‍රියාවට නැගීමට ඇති වගකීමයි. අමාත්‍ය මණ්ඩලය ජනාධිපතිගේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සිටින පිරිසකගෙන් සමන්විත වීම නිසා අමාත්‍ය මණ්ඩලය සාමූහිකවත්, තනි තනිවත් ජනාධිපතිට වගකීමට බැඳී සිටියි. අමාත්‍ය මණ්ඩලයේදී සාමූහික තීරණ ගැනීමකට වඩා ජනාධිපතිගේ තීරණ හා මෙහෙය වීම යටතේ තීරණ ගැනීමේ සම්බන්ධයක් ඇති වී තිබේ. ජනාධිපතිවරයාට ඕනෑම අවස්ථාවක ඇමති මණ්ඩලය සංශෝධනය කිරීමට, ඇමතිවරු අස්කිරීමට සහ ඔවුන්ගේ විෂයයන් සංශෝධනය කිරීමට බලය ඇති නිසා ඇමති මණ්ඩලය සහ ජනාධිපති අතර සම්බන්ධය ධූරාවලි සම්බන්ධයක් බවට පත් වී ඇත. මේ නිසා අමාත්‍ය මණ්ඩලයේදී සාමූහික තීරණ ගැනීමකට වඩා ජනාධිපතිගේ තීරණ හා මෙහෙයවීම යටතේ තීරණ ගැනීමේ සම්බන්ධයක් ඇති වී තිබේ. සෑම අමාත්‍යවරයෙකුගේම අමාත්‍යංශ ලේකම් පත් කරන්නේද ජනාධිපතිවරයාය. එබැවින් දේශපාලන වශයෙන් තමන්ට තර්ජනයක් විය හැකි පාර්ලිමේන්තු බලයක් හිමි අමාත්‍යවරයකුට තමන්ගේ ලේකම්වරයෙකු මඟින් බලපෑම් කිරීමට ජනාධිපතිට හැකියාව ඇත.

(ලකුණු 10)

(ii) ජනාධිපති සහ අධිකරණය

(අ) 18 වෙනි ව්‍යවස්ථා සංශෝධනයේ විධිවිධානවලට යටත්ව අධිකරණයට අදාළ පහත දැක්වෙන පත් කිරීම් සිදු කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේය.

i. අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවන්

ii. අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවන්

iii. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයින්

iv. නීතිපතිවරයා

(ආ) 107.4 ව්‍යවස්ථාව
අග්‍ර විනිශ්චකරු හා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවන් සහ අභියාචනාධිකරණයේ සභාපති හා විනිශ්චයකරුවන් තම ධූරයේ වැඩ භාර ගත යුත්තේ ජනාධිපතිවරයා ඉදිරියේ කරන දිවුරුම් දීමෙන් අනතුරුවය.

(ඇ) 109:1 ව්‍යවස්ථාව
ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකරුවකු, පාර්ලිමේන්තුවේ නොපැමිණි සාමාජිකයින්ද ඇතුළුව 1/2ක අනුමැතිය සහිතව සම්මත කරන යෝජනාවක් පරිදි තනතුරින් ඉවත් කිරීමේ  බලය ජනාධිතිවරයාට හිමි වේ.

(ඇ) 109:1 ව්‍යවස්ථාව
ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ තාවකාලිකව ඇතිවන ඇබෑර්තු සඳහා 42 (ඇ) ව්‍යවස්ථාවේ දැක්වෙන පරිදි වැඩ බැලීමේ පදනම මත විනිශ්චයකරුවන් පත් කිරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වේ.

(ඉ) 101:1 ව්‍යවස්ථාව
ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුට වෙනත් ලිඛිත නීතියක් යටතේ වෙනත් කාර්යයන් කිසිවක් ඉටු කිරීමට නියම කිරීමේ බලය ජනාධිපතිවරයාට බලය හිමි වේ.

(ඊ) 101:3 ව්‍යවස්ථාව
ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ ස්ථිර සේවයේ යෙදී සිටි විනිශ්චකරුවෙකුට, විශ්‍රාම ගැනීමෙන් පසුව ජනාධිපතිවරයාගේ ලිඛිත කැමැත්තක් නොමැතිව අධිකරණ කටයුතුවල යෙදීම තහනම් වන්නේය.

(උ) 111:2 (අ) ව්‍යවස්ථාව
අධිකරණ සේවා කොමිසමේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මහාධිකරණ විනිශ්චයකරුවන් පත් කළ යුත්තේ ය. අධිකරණ සේවා කොමිසමේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මහාධිකරණ විනිශ්චයකරුවන් තනතුරෙන් ඉවත් කළ හැකිය. එමෙන්ම ඔවුන් ජනාධිතිවරයාගේ විෂය පාලනයට යටත් වේ.

(ඌ) 34:1 ව්‍යවස්ථාව
වරදකරුවන්ට සමාව දීමේ බලය ජනාධිපති සතු වේ.

ඒ අනුව,

I. සම්පූර්ණ සමාවක් හෝ නීත්‍යානුකූල කොන්දේසි සහිත සමාවක් දීම

II. නියම කරන ලද දඬුවම ක්‍රියාත්මක වීම දින නියමයක් නොමැතිව හෝ ඇතිව කල් දැමීම

III. නියම කරන ලද දඬුවම වෙනුවට ලිහිල් දඬුවමක් නියම කිරීම

IV. නියම කරන ලද දඬුවමක් මුළුමනින්ම අහෝසි කිරීම, අර්ධ වශයෙන් අඩු කිරීම, දඩ මුදලක් මුළුමනින්ම නිෂ්ප්‍රභා කිරීම හෝ අඩු කිරීම රාජසන්තක කරන ලද වස්තුවක් මුළුමනින්ම හෝ අර්ධ වශයෙන් අත් හිටුවීම

(එ) 129:1 ව්‍යවස්ථාව
ජනාධිපතිවරයා ශ්‍රේෂ්ඨාධිකරනයේ උපදෙස් ලබා ගැනීමේ බලය ඉහත දැක්වූ විධිවිධාන දෙස බැලීමේදී පෙනී යන්නේ පත් කිරීමේ ඉවත් කිරීමේ හා සමාව දීම යන කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට යම් යම් අධිකරණ බලතල හිමි වී තිබෙන බව ය. නමුත් එම බලතල ක්‍රියාවට නැංවීමේදී අධිකරණයට බලපෑම් කළ හැකි ප්‍රමාණය බෙහෙවින් සීමා වන්නේය.

(ලකුණු 10)

(iii) ජනාධිපති හා රාජ්‍ය සේවය

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30:1 වගන්තියට අනුව ජනාධිපතිවරයා විධායකයේ නායකයා වන්නේය. මේ අනුව සමස්ත රාජ්‍ය සේවය පාලනය කිරීමේ තනි බලය ජනාධිපතිවරයා සතු වේ. රාජ්‍ය සේවාව පාලනය කිරීමේදී ජනාධිපති සතු බලතල ක්‍රියාවට නැංවෙන ප්‍රධාන ක්‍රම දෙකක් හඳුනා ගත හැකි ය.

1. ජනාධිපතිවරයාගේ අභිමතය අනුව රාජ්‍ය සේවයේ කළ හැකි පත් කිරීම්
   නිදසුන් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් හා වෙනත් උසස් රාජ්‍ය නිලධාරීන් දැක්විය හැකි ය.
2. පාර්ලිමේන්තු සභාවේ (අගමැති, කතානායක, විරුද්ධ පක්ෂයේ නායක, අගමැති විසින් පත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, විපක්ෂ නායක විසින් පත් කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු යන අයගෙන් සමන්විත) මතය විමසීමෙන් අනතුරුව කරනු ලබන පත් කිරීම් මෙයට අයත් වන්නේ;

   I. මැතිවරණ කොමිසම
   II. රාජ්‍ය සේවා කොමිසම
   III. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසම
   IV. අල්ලස් හා දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ ස්ථාවර කොමිසම
   V. මුදල් කොමිසම
   VI. මැතිවරණ කොමිසම
   VII. සුප්‍රිම් උසාවියේ අග්‍ර විනිශ්චයකරු හා අනෙක් විනිශ්චයකරුවන්
   VIII. අධිකරණ සේවා කොමිසමේ සභාපති හැරුන විට අනෙක් සාමාජිකයින්
   IX. නීතිපති
   X. විගණකාධිපති
   XI. ඔම්බුඩ්ස්මන්
   XII. පාර්ලිමේන්තු ලේකම් ජනරාල්

- මෙම පත් කිරීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තු කමිටුවේ සාමාජිකයින්ගේ මතය විමසූ විට තම මතය එසේ විමසූ දින සිට දින 7ක් ඇතුළතදී ජනාධිපතිට දැන්විය යුතුය. එසේ නොදැන්වුවහොත් ජනාධිපතිට සිය අභිමතය අනුව පත්වීම් කළ හැකි ය.
- ඉහත දැක්වූ පත්කිරීම්වලින් පුද්ගලයින් ඉවත් කළ යුත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් නීතිවල දැක්වෙන ප්‍රතිපාදන අනුව පමණි. නමුත් එවැනි ප්‍රතිපාදන නොමැති විට ජනාධිපතිගේ අභිමතය අනුව ඉවත් කළ හැකි ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55.3 වගන්තියේ සඳහන් වන ආකාරයට සියලු දෙපාර්තමේන්තු ප්‍රධානයන්, පත් කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය කිරීම සහ සේවයෙන් පහ කිරීම අමාත්‍ය මණ්ඩලය සතු වන අතර අමාත්‍ය මණ්ඩලය විසින් ඒ බලතල රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අදහස් විමසා දැන ගැනීමෙන් පසුව ක්‍රියාවේ යෙදිය යුත්තේ ය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55.4 වගන්තියේ සඳහන් වන ආකාරයට ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව රජයේ නිලධරයන් හා සම්බන්ධ සියලු ප්‍රතිපත්තිමය කාරණා සඳහා විධිවිධාන සැලසීම ද ඒ කාරණය තීරණය කිරීම ද අමාත්‍ය මණ්ඩලය විසින් කරනු ලැබිය යුත්තේ ය.

ඉහත සඳහන් වගන්ති දෙක සමඟ ජනාධිපතිවරයා සලකා බැලීමේ දී කිව හැක්කේ ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙකු වනවාක් මෙන්ම, එහි නායකයා ද වන බවය. ප්‍රායෝගික ක්ෂේත්‍රය තුළ දැකිය හැක්කේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම ජනාධිපතිවරයාගේ තනි අභිමතය පරිදි සිදුවන බව ය. අනෙක් කරුණු කිසිවක් ජනාධිපතිවරයාගේ අනුදැනුමෙන් හා අනුමැතියෙන් තොරව සිදු නොවේ. මේ අනුව පෙනී යන්නේ රාජ්‍ය සේවය පාලනය කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා අසහාය බලයක් භුක්ති විඳින බව යි.

(ලකුණු 10)

(iv) ජනාධිපති හා පළාත් සභා

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (අ) වගන්තියේ (2) අනු වගන්තියට අනුව පළාත් සභාවේ ප්‍රධාන විධායකයා වන ආණ්ඩුකාරයා පත් කරන්නේ ජනාධිපති විසිනි. එම වගන්තියේම දැක්වෙන ආකාරයට ජනාධිතිගේ ප්‍රසාදය හිමි තාක්කල් ආණ්ඩුකාරයා නිලය දරනු ලැබේ. එසේ වුවද පළාත් සභාව මගින් සම්මත කරන යෝජනාවක් මගින් (2/3 ක බහුතර අනුමැතියෙන්) ආණ්ඩුකාරයා ඉවත් කරන ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටියහොත් නියමිත නිල කාලයට පෙර ආණ්ඩුකාරයා තනතුරින් ඉවත් කිරීමේ බලය ජනාධිපති සතු වේ.
- ආණ්ඩුකාර තනතුරට පත් කරන තැනැත්තෙකු ස්වකීය ධූරයේ වැඩ භාර ගත යුත්තේ ජනාධිපතිවරයා ඉදිරියේ දිවුරුම් දීමෙන් පසුව ය. 154 (අ) (6).
- පළාත් සභා පනත හෝ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ අඩංගු කරුණු සංශෝධනය කිරීම සඳහා මධ්‍යම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන යෝජනාවක් පළාත් සභාවල අදහස් විමසීම සඳහා ඉදිරිපත් කිරීමට 154 (ඇ)(2) වගන්තිය යටතේ ජනාධිපතිවරයාට බලය හිමි වේ.
- පළාත් සභා පනවන ප්‍රඥප්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන බව පළාත් ආණ්ඩුකාරයාට හැඟී යන්නේ නම් එවැනි ප්‍රඥප්ති ආණ්ඩුකාරයා විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු අතර ජනාධිපති විසින් එම ප්‍රඥප්ති ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළ යුතුය. 154 ඌ (4)
- අත්‍යවශ්‍ය සැපයුම් හා සේවා පවත්වා ගෙන යාමට තර්ජනයක් එල්ල වී තිබීමේ හෝ යුද්ධයක් හෝ විදේශ ආක්‍රමණයක් හෝ සන්නද්ධ කැරැල්ලක් නිසා ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට තර්ජනයක් එල්ල වී තිබෙන විටක ජනාධිපති විසින් මහජන ආරක්ෂක ආඥා පනත හෝ මහජන ආරක්ෂාව හා සම්බන්ධ වෙනත් නීති ප්‍රකාශයට පත්කළ විට පළාත් ආණ්ඩුකාරයාට පැවරී ඇති විධායක බලතල ක්‍රියාවට නැංවිය යුතු ආකාරය දැක්වෙන විධාන නිකුත් කිරීමේ බලය ජනාධිපති සතු වේ. 154 එ (1).
- එසේ දෙන ලද විධාන ආණ්ඩුකාරයා හෝ පළාත් සභාව නොසළකා හැර ඇති විටෙක එම පළාත් සභා බල ප්‍රදේශය තුළ පරිපාලනය ක්‍රියාවට නැංවිය නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවට ජනාධිපතිවරයා ට ප්‍රකාශ කළ හැකිය. 154 ඒ).

යම් පළාතක පාලනය බිඳ වැටී ඇතැයි ආණ්ඩුකාරයා විසින් දන්වා ඇති විටක හෝ එසේ වී ඇතැයි වෙනත් මාර්ගයකින් ජනාධිපතිවරයා දැනගත් විටක හෝ ජනාධිපතිවරයා නිකුත් කරන ප්‍රකාශයක් මගින්;

(අ) ආණ්ඩුකාරයාගේ සහ පළාත් සභාවේ බලතල අවශ්‍ය ආකාරයට සියලුම හෝ ඉන් කිසිවක් ජනාධිපතිවරයාට පවරා ගත හැකි ය.

(ආ) පළාත් සභාවේ බලතල පාර්ලිමේන්තුව විසින් හෝ එහි බලය යටතේ ක්‍රියාත්මක කළ යුතු බව විධානය කළ හැකි ය.

(ඇ) ප්‍රකාශනයේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා උචිත යැයි සැළකෙන වෙනත් විධිවිධාන යෙදිය හැකි ය. (154 ඔ)

- ඉහත දැක්වූ ආකාරයට ප්‍රකාශනයක් කිරීමෙන් අනතුරුව එහි අන්තර්ගත කරුණු පිළිබඳව සෑහිමට පත්වීම සඳහා අවශ්‍ය නම් ප්‍රකාශනය නිකුත් කළ දිනයේ සිට දින 60 ක් ඉක්මවා යාමට ප්‍රථමයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකරුවෙකු ලවා පරීක්ෂණයක් ජනාධිපතිවරයාට පැවැත්විය හැකිය. (154 ඔ(5).

- යම් පළාතක හෝ සමස්ත ශ්‍රී ලංකාව තුළ මූල්‍ය අර්බුදයක් පැන නැගී ඇතැයි ජනාධිපතිවරයාට පෙනීගිය හොත් එහිදී ඒ බව ප්‍රකාශනයක් මගින් ජනාධිපතිවරයාට ප්‍රකාශ කළ හැකි අතර එහිදී ජනාධිපතිවරයා නිකුත් කරන මෙහෙයුම් විධිවිධාන අනුව ක්‍රියා කිරීමට පළාත් සභාව හා එහි නිලධාරීන් බැඳී සිටියි. (154 ක)
- 154 ජ (1) වගන්තියට අනුව මුදල් කොමිසමේ නිල බලයෙන් පත්වන සාමාජිකයින් හැරුන විට අනෙක් තිදෙනා ජනාධිපති විසින් පත් කළ යුතුය.

ඉහතින් දැක්වූයේ පළාත් සභා සම්බන්ධයෙන් ජනාධිපතිට ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතලයන් ය. ඒවා විමසීමේදී පෙනී යන්නේ පළාත් සභා ව්‍යවස්ථානුකූලව ක්‍රියාත්මක කරවීමට ජනාධිපති සතුව සැලකිය යුතු බලයක් හිමිවන බව ය.

(ලකුණු 10)

**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




C කොටසින් අඩුම තෝරා ගැනීමක් ඇති 8වන ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 36%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමි වේ. ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 60%ක් ද, ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 21%ක් ද, ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 15%ක් ද, ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 4%ක් ද, ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16 හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 04%ක් වන අතර ලකුණු 05 හෝ ඊට අඩුවෙන් ලබාගත් පිරිස 60%කි. එමෙන්ම අයදුම්කරුවන්ගෙන් 36%ක්ම 06 - 15 අතර ලකුණු ලබා ගෙන ඇත.




මෙම ප්‍රශ්නයට කොටස් 04ක් ඇති අතර ඉන් පහසුතාව වැඩිම කොටස (i) වේ. එහි පහසුතාව 26%කි. පහසුතාව අඩුම කොටස (iv) වේ. එහි පහසුතාව 10%කි.

C කොටසින් අඩුම තෝරා ගැනීමක් ඇති ප්‍රශ්නය 8 වන ප්‍රශ්නය වන අතර එය 36% කි. මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත වන අතර එයින් කොටස් දෙකක් පමණ තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතුය. එක් කොටසකට ලකුණු 10 බැගින් ලකුණු 20ක් හිමි වේ.

(i) කොටසේ පහසුතාව 26%කි. 1978 ජනාධිපති ධූරය හා සම්බන්ධ ප්‍රශ්න පසුගිය විභාගවලදී නිතර අසා තිබුණ ද මෙම ප්‍රශ්නය සඳහා සිසුන්ගේ සාධන මට්ටම පහළ මට්ටමක පවතී. ජනාධිපතිවරයා හා කැබිනට් මණ්ඩලය හා සම්බන්ධ ව්‍යවස්ථාවේ විධි විධාන පදනම් කර ගනිමින් ජනාධිපතිවරයා හා කැබිනට් මණ්ඩලය අතර සම්බන්ධතාව, ජනාධිපතිවරයාට කැබිනට් මණ්ඩලය කෙරෙහි කළ හැකි බලපෑම පිළිබඳව අවධාරණය කළ යුතුය. එහිදී 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආශ්‍රයෙන්ම ඒ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සිසුන් පෙළඹවීම වඩාත් ඵලදායී විය හැකිය.

(ii) කොටසේ පහසුතාව 32%කි. මෙම ප්‍රශ්නය ගොඩ නැගී තිබුනේ 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපති සහ අධිකරණය පිළිබඳවයි. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව සහ එයට එකතු කළ 18 වන ව්‍යවස්ථා සංශෝධනය ආශ්‍රිතව ජනාධිපතිවරයාට අධිකරණය කෙරෙහි කළ හැකි බලපෑමත්, අධිකරණයට ජනාධිපතිවරයා කෙරෙහි කළ හැකි බලපෑමත් සිසුන්ගේ පිළිතුරුවලින් අපේක්ෂා කර ඇත. ජනාධිපතිවරයා විනිශ්චයකරුවන් පත් කරන බව සහ වරදකරුවන්ට සමාව දෙන බව දැක්වීමට පමණක් බොහෝ පිළිතුරු සීමා වී තිබුණි. ඒ හා සම්බන්ධ විස්තර, ව්‍යවස්ථාවේ වගන්ති ආශ්‍රයෙන් නිශ්චිත විධි විධාන දක්වා නොතිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 18 වන සංශෝධනය තුළ මේ හා සම්බන්ධ විධි විධාන සිසුන්ට කියවා බැලීමට අවස්ථාව සලසා දෙමින් ඒ පිළිබඳ පන්ති කාමරය තුළ සාකච්ඡාවක් ගොඩ නැගීමෙන් මෙබඳු දෝෂ මඟ හරවා ගත හැකිය.

(iii) කොටසේ පහසුතාව 14%කි. ජනාධිපතිවරයා සතු රාජ්‍ය සේවය හා සම්බන්ධ බලතල සහ ජනාධිපතිවරයා සහ රාජ්‍ය සේවය අතර සම්බන්ධතාව පිළිබඳ නිවැරදිව කරුණු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවබෝධයක් නොපැවතුනි.

විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය වැනි ආණ්ඩුවේ ප්‍රධාන ආයතන සම්බන්ධයෙන් පමණක් නොව එයට අයත් රාජ්‍ය සේවය වැනි ක්ෂේත්‍රයන් පිළිබඳවත්, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා එයට එකතු කළ සංශෝධන ඉස්මතු වන ආකාරයේ පුළුල් සාකච්ඡාවක් සිසුන් සමඟ ගොඩ නැගීම තුළින් මෙම පැහැදිළි කිරීම සාර්ථකව සිදු කළ හැකිය.

(iv) කොටසේ පහසුතාව 10%කි. ජනාධිපතිවරයා සතු, පළාත් සභාව හා සම්බන්ධ බලතල මෙම පිළිතුරට ඇතුළත් විය යුතු වුවද, බහුතරයක් අපේක්ෂකයින්ට ඒ පිළිබඳ පැහැදිළි, නිරවුල් අවබෝධයක් නොතිබුණි. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, 1987 අංක 42 දරණ පළාත් සභා පනත සහ පසුගිය විභාගවල පළාත් සභා හා සම්බන්ධයෙන් ලකුණු දීමේ පටිපාටිවල ඇතුළත් තොරතුරු සිසුන් අතට පත් කර, අධ්‍යයනය කිරීමට සැලැස්වීමෙන් වඩාත් ඉහළ සාධන මට්ටමක් ලබා ගත හැකිය.

2.2.3 **II** ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




**II** ප්‍රශ්න පත්‍රයේ එක් එක් කොටස්වල පහසුතා සැලකූ විට A කොටසට 36% ක් ද, B කොටසට 32% ක් ද හා C කොටසට 29% ක් ද වේ. මෙහි **A** කොටසට එනම් කෙටි පිළිතුරු ලිවීමේ ප්‍රශ්න සඳහා ලබාගෙන ඇති සමස්ත පහසුතාව වැඩිම අගයක් ගෙන ඇතත් එයද, 40% ටත් වඩා අඩු පහසුතාවකි. තව ද B කොටස සහ C කොටසේ ප්‍රශ්න 4 බැගින් ලබා දී, එක් කොටසකින් ප්‍රශ්න 2 බැගින් තෝරාගෙන පිළිතුරු ලිවීමේ අවස්ථාව ලබා දී තිබුණි. එසේ නමුත් එම කොටස් දෙකට ද, පිළිවෙළින් 32% ක් සහ 29% ක් වන අඩු පහසුතා ප්‍රදර්ශනය කර ඇත.

කෙසේ නමුත් I ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 51% ක් වුවත් **II** ප්‍රශ්න පත්‍රයට ලබා ඇති සමස්ත පහසුතාව 31% වැනි අඩු අගයකි. මේ අනුව පෙනී යන්නේ දේශපාලන විද්‍යාව **II** ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න කෙරෙහි වැඩි අවධානය යොමු කර ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කරගත යුතු බවයි.

## III කොටස

## 3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

### 3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතු ය.

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි එක් පිළිතුරක් තෝරා ගත යුතු ය. තව ද පැහැදිලි ව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතු ය.

* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතු ය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවක ම අදාළ ස්ථානයේ ලිවිය යුතු ය.

* ප්‍රශ්න අංක, කොටස් හා අනුකොටස් නිවැරදි ව ලිවිය යුතු ය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන් ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතු ය.

* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

* II වන ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීමේ දී ප්‍රධාන ප්‍රශ්නය යටතේ ඇති අනුකොටස් සියල්ල හොඳින් කියවා බලා එක් එක් අනුකොටසට අදාළ ඉලක්කගත පිළිතුර පමණක් ලිවිය යුතු ය.

* ගැටලුවලට පිළිතුරු සැපයීමේ දී ඇති කාලය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.

* පිළිතුරු ලිවීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.

**විශේෂ උපදෙස්**

- ★ එක් එක් පාඩමේ සියලුම ප්‍රධාන කොටස් සහ අනු අංශ ඇතුළත්වන පරිදි මාතෘකා සහ අනු මාතෘකා සකස් කර ගත යුතුය.

- ★ පිළිතුරු ලිවීමේදී සංවිධානාත්මකව එය ගොඩනගා ගත යුතු ආකාරය පැහැදිළි කර දිය යුතුය.

  නිදසුන් - ප්‍රවේශය, පිළිතුරට අදාළ කරුණු සහ නිගමනය යන ඒවා ඇතුළත්වන ආකාරයෙන් පිළිතුරු සකස් කර ගැනීමට සිසුන් යොමු කිරීම සහ ඒ සඳහා ලකුණු දීමේ පටිපාටියේ පිළිතුරු සංවිධානය කර ඇති ආකාරය භාවිතයට ගත යුතුය.

- ★ ඒ ඒ මාතෘකාවලට අදාළ කරුණු පැහැදිළි කිරීමේදී ප්‍රායෝගික වශයෙන් භාවිතයට ගැනුණු සහ භාවිතයේ පවතින දේශපාලන ක්‍රියාකාරකම් හා සිදුවීම් විෂයානු බද්ධව පැහැදිළි කර දිය යුතුය.

- ★ පිළිතුරු ලිවීමේදී එක් එක් න්‍යායන් හා සම්බන්ධ නිර්වචන නිවැරදිව මතක තබා ගැනීමට සිසුන් යොමු කළ යුතුය.

- ★ විෂයයට අදාළ චින්තකයින්/ දාර්ශනිකයින්, න්‍යාය හා මතවාද පිළිබඳ සිසුන්ගේ දැනුම නිශ්චිත කළ යුතුය

- ★ මැතිවරණ නියෝජන ක්‍රම හා සම්බන්ධ පිළිතුර ලිවීමෙදී අදාළ සංඛ්‍යා ලේඛන භාවිතයට ගැනීමට යොමු කළ යුතුය.

- ★ දේශපාලන විද්‍යාවේ II පත්‍රය හා අදාළ මාතෘකා ඉගැන්වීමේදී අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා, ව්‍යවස්ථා සංශෝධන කියවීමට සිසුන් යොමු කළ යුතුය.

- ★ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර ආශ්‍රිතව සිසුන් ලවා අභ්‍යාස කරවා පුහුණුවක් ලබා දිය යුතුය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා :

ඉගැනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය තුළින් ප්‍රතිඵල සංවර්ධනය සඳහා,

අ.පො.ස. (උ.පෙළ) දේශපාලන විද්‍යාව ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු ලිවීමට, එම විෂය පිළිබඳව සිසුන් තුළ ඇති අවබෝධය ප්‍රමාණවත් නොවන බව දක්නට ඇත. ප්‍රශ්න තේරුම් නොගැනීම, දුර්වල පිළිතුරු සැපයීම කෙරෙහි සෘජුවම බලපා ඇත.

සිසු පිළිතුරු තුළින් පහත දුර්වලතා දෘෂ්‍යමාන විය.

- ප්‍රශ්නය නිසි ලෙස අවබෝධ කර නොගැනීම
- කටපාඩම් කරගත් පිළිතුරක් ලියා දැක්වීම
- උදෘත මතක තබා නොගැනීම හා ව්‍යවස්ථාමය වගන්ති ගිලිහී තිබීම
- බාහිර පොත පත ඇසුරින් කරුණු රැස් කිරීමට උනන්දු නොවීම
- පිළිතුරු ඉදිරිපත් කිරීමේදී විචාරශීලීව කරුණු ලියා නොදැක්වීම
- විෂය කරුණක් තහවුරු කර ගැනීමට, තවත් විෂය කරුණක් සම්බන්ධ කර නොගැනීම
- කරුණු ඉදිරිපත් කිරීමේදී නිරවුල් අවබෝධය නොමැති වීමෙන් විශ්වාසනීයත්වය පිළිතුරු තුළ දක්නට නොමැති වීම
- අදාළ කරුණු පමණක් තෝරා බේරා නොගැනීම
- ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමේදී පිළිතුරෙහි ගලා යාම, දුර්වල මට්ටමක පැවතීම
- න්‍යාය සහ භාවිතය අතර වෙනස හඳුනා නොගැනීම

උක්ත දුර්වලතා මග හරවා ගැනීමට,

දේශපාලන විද්‍යාව උගන්වන ගුරුවරයා දේශපාලන විද්‍යාව පිළිබඳ පුළුල් අවබෝධයකින් ද යාවත්කාලීන වූ දැනුමකින් ද යුතුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත වීම ඉතා වැදගත්ය. දේශපාලන විද්‍යාව ඉගැන්වීමේදී විෂයෙහි අභිමතාර්ථ සහ ඉගෙනුම් ඵලය පිළිබඳව සිසුන් දැනුවත් කිරීම ඉතා වැදගත්ය. දේශපාලන විද්‍යාව විෂයය සම්බන්ධ සංකල්ප, පාරිභාෂිත පද නව විෂය ප්‍රවනතා හඳුනා ගැනීම කෙරෙහි සිසුන්ට මග පෙන්වීම අවශ්‍ය වේ. විශේෂයෙන්ම පාඨ ග්‍රන්ථ පරිහරණයට පෙළඹවීම, පිළිතුරු ලිවීම හා සිසුන් සහභාගි කර ගනිමින් මණ්ඩල ක්‍රමයට පිළිතුරු පත් ඇගයීම හා ප්‍රතිපෝෂණය ලබා දීම යෝග්‍යය.

තව දුරටත් පහත සඳහන් යෝජනා කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

- නිරන්තරයෙන් නිර්මාශීලී ප්‍රශ්න සකස් කර, ප්‍රශ්නයේ අරමුණු හා අභිමතාර්ථ විමසමින් අභ්‍යාසයේ යෙදවීම
- නිර්මාණශීලී ලෙස පිළිතුරු ලිවීම සඳහා සිසුන් පෙළඹවීම
- කියවීම සඳහා පාඨ ග්‍රන්ථ ලබා ගැනීමට පෙළඹවීම, විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා (1972/ 1978 ව්‍යවස්ථා සංශෝධන සහිතව)
- මැතිවරණ වාර්තා සහ දේශපාලන ක්‍රියාකාරකම් සහිත ලිපිලේඛණ එකතුවක් පවත්වාගෙන යාමට සිසුන් පෙළඹවීම
- සිසුන් අතර දේශපාලන විද්‍යාව විෂයට අදාළව විවාද තරඟ පැවැත්වීම
- න්‍යායාත්මක ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේදී ප්‍රායෝගික උදාහරණ අවශ්‍ය පරිදි යොදා ගැනීම සහ ප්‍රායෝගික ප්‍රශ්න සඳහා අදාළ පරිදි න්‍යායන් භාවිතයට සිසුන් යොමු කරවීම
- පෞද්ගලිකව විශ්වාසනීයත්වය තහවුරු කර ගත් කරුණු පිළිතුරු සඳහා භාවිතයට හුරු කරවීම
- අනවශ්‍ය විස්තර හා අදාළ නොවන කරුණු පිළිතුරු සඳහ ලිවීමෙන් කාලය අපතේ යන බව අවබෝධ කරවීම හා අදාළ කරුණු පමණක් ලිවීමට හුරු කරවීම
- පිළිතුරු ප්‍රවේශය, කරුණු හා නිගමනය සහිතව නිම කිරීමට පෙළඹවීම
- න්‍යායට සහ භාවිතය අතර වෙනසක් පවතින බව උදාහරණ සහිතව තහවුරු කරවීම

ගුරුවරයා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර සිසුන් නිතර ඇගයීමට භාජනය කිරීම මගින් ඉගෙනුම් ඉගැන්වීම් හැකියා - නොහැකියා හා ප්‍රවණතා පිළිබඳව අවබෝධ කරගත හැකිය. එයින් පන්ති කාමරය තුළදීම අවශ්‍ය පරිදි ප්‍රතිපෝෂණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ගුරුවරයාට සැලසුම් කර ගත හැකිවේ.